# භික්ෂු ප්‍රාතිමෝක්ෂය

## සහ විනය කරුණු

**(සිංහල අනුවාද සහිත යි)**

**කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය**
**කිතුල්ගොඩ, අගලවත්ත.**

**ධර්ම දානය පිණිස යි.**

**ශ්‍රී.බු.ව. 2560 නවම් මස.**

**(2017 පෙබරවාරි මස)**

පළමු මුද්‍රණය :- 2015 නොවැම්බර්
දෙවන මුද්‍රණය :- 2016 ජූලි
නව සංස්කරණ සහිත තෙවන මුද්‍රණය :- 2017 පෙබරවාරි

භික්ෂු ප්‍රාතිමෝක්ෂය සහ විනය කරුණු

© කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය

ISBN 978-955-7916-02-6

පරිගණක පිටු සැකසුම,
පිටකවරය නිර්මාණය සහ ප්‍රකාශනය :-
කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය.

මුද්‍රණය :-
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්) සමාගම
65 C, තල්ගහවිල පාර,
මිදෙල්ලමුලහේන,
හොරණ.

විමසීම් :-
කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය
කිතුල්ගොඩ, අගලවත්ත.
දු. ක. 034-3309708

අවශ්‍ය නම් මෙම ග්‍රන්ථයෙහි PDF, CD පිටපත්
ලබාගත හැක.

www.dhammadanabooks.com

# පිදුම...

ගෞතම බුදුන් වහන්සේ ගේ
අනුශාසනාව පරිදි සාසන
බ්‍රහ්මචරියාවෙහි හැසිරෙමින්
මේ අනමතග්ග සංසාරයෙන්
එතෙර වීමට වීර්‍ය වඩන සියලු
පැවිදි උපසපන් බුද්ධ පුත්‍රයන්
වහන්සේලාට යි !

# අනුමෝදනාව....

***''යෝ ඛෝ ආනන්ද මයා ධම්මෝ ච විනයෝ ච දේසිතෝ පඤ්ඤත්තෝ සෝ වෝ මමච්චයේන සත්ථා[1]''*** යැයි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් මඤ්චකයේදී ධර්ම භාණ්ඩාගාරික අනඳ මාහිමිපාණන් වහන්සේ අමතා වදාළ අයුරින් ඒ සම්බුද්ධ පරිනිර්වාණයෙන් ඉක්බිති ධර්ම-විනය ම පිහිට පිළිසරණ කරගත් සුපේශල බුද්ධ පුත්‍රයන් වහන්සේලා ස්වකීය නිර්වාණය සාක්ෂාත් කරගත්තාහු, අනාගතයේ නිස්සරණාධ්‍යාශයෙන් සසුන් වන් කුලපුතුන් උදෙසා පිවිතුරු සුභාෂිත සද්ධර්මය සුරක්ෂිත කළාහු ය. පළමු ධර්ම සංගායනාවේදී කවරකු විසින් සුපිරිසිදු සද්ධර්මය ආරක්ෂා කරනු ලබන්නාහුදැයි අසන ලද පැනයකදී ***''අනාගතේ ලජ්ජී රක්ඛිස්සති, ලජ්ජී රක්ඛිස්සති, ලජ්ජී රක්ඛිස්සති[2]''*** යැයි තෙවරක් ම උදන් ඇනූ ඒ ශාසන මාමක උතුමන් වහන්සේලාගේ බලාපොරොත්තුව පරිදි එදා මෙදා තුර ලජ්ජී සුපේශල බුද්ධපුත්‍රයන් වහන්සේලා සර්වඥ සුභාෂිත සද්ධර්මය මැනවින් ආරක්ෂා කළාහු ය.

ඒ සර්වඥයන් වහන්සේ ධරමාන කාලයේ ම **සාරිපුත්ත, මොග්ගල්ලාන** ආදී වූ ස්ථවිර පරම්පරාවෙන් සුරක්ෂිත කරගත් සද්ධර්මය අනාගතයේ පාප භික්ෂූන් විසින් අධර්ම-අවිනය ද්වීපනය කිරීමට මත්තෙන් සංගායනාවට බඳුන් කරමින් සද්ධර්මයේ චිරස්ථිතිය පිණිස උරදුන්නෝ **මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.** එහිලා විනය පිටකය **උපාලි මහ රහතන් වහන්සේ** විසින් බුදුරජාණන් වහන්සේ පැනවූ අයුරින් ම සංගායනාවට බඳුන් කළ අතර **අනඳ මහ රහතන් වහන්සේ** විසින් සූත්‍ර, අභිධර්ම පිටකද්වය සංගායනාවට බඳුන් කරමින් ශාසන චිරස්ථිතියට දායක වූහ. එතැන් පටන් භාණක පරපුරෙන් පැවත ආ ඒ තෙවළා දහම යළි යළිත් අලජ්ජීන් විසින් සිදුකරන හානියෙන් සුරක්ෂිත කරනු වස් **යස මහ රහතන් වහන්සේ, මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ** ආදී වූ ශාසන මාමක ස්ථවිරයන් වහන්සේලා විසින් සංගීතියට

1. මහා පරිනිබ්බාණ සූත්‍රය, දීඝ නිකාය. (බු.ජ.මු.), පි. 242 (2013)
2. සමන්තපාසාදිකා විනය අටුවා. (හේ.වි.මු.), පි. 165 (1985)

නැංවූවාහු ධර්ම-විනය ද්වීපනය පිණිස ස්වකීය දායකත්වය මොනවට සපයා දුන්නෝ ය. ඒ සියලු **මහ රහතන් වහන්සේලා** මෙන්ම එදා පටන් අනේකවිධ දුක් ගැහැට මධ්‍යයේ සුපිරිසිදු ධර්ම-විනය රැකගැන්මට උරදුන් ලජ්ජී සුපේශල **මහා සඟරුවන** අප හදෙහි සුපිපි සොම්නස් කුසුමින් පුදමින් නමස්කාරපූර්වකව සිහිපත් කළ යුත්තාහ.

ඉක්බිති පන්දහසක් කල් සුපිරිසිදු ථෙරවාදී ධර්ම-විනය සුරක්ෂිත වන බවට **සර්වඥයන් වහන්සේ** විසින් අදිටන් බල පිහිටුවන ලද්දාවූ සිරිලක් ධර්මද්වීපයට ඒ තෙවළා දහම රැගෙනවිත් ප්‍රතිෂ්ඨාපනය කළෝ **මහා මහින්ද මහ රහතන් වහන්සේ ප්‍රමුඛ රහතන් වහන්සේලා** ය. උන්වහන්සේලා වෙතින් මොනවට ලබාගත් ධර්ම-විනය ශ්‍රී ලංකාද්වීපය තුළ මුල් බැස්සවූවෝ **අරිට්ඨ මහ රහතන් වහන්සේ ප්‍රමුඛ මහ සඟරුවනය.** එදා පටන් මහා දුර්භික්ෂ, සාපිපාසාදී අනේකවිධ දුෂ්කරතා මැද ශ්‍රී සද්ධර්මය කටපාඩමින් දරාගෙන ආ අතීත **මහොත්තමයන් වහන්සේලා** ද සද්ධර්මයේ චිරස්තිථිය උදෙසා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪකරමින් උරදුන් **මහ රහතන් වහන්සේලා** ද සුපිරිසිදු ථේරවාදයේ අනාගතයට පණදුන්නාහු අපගේ නමස්කාර පූර්වක පිදුමෙන් පිදිය යුත්තාහුම ය.

එපමණකුදු නොව එතෙක් සීහළ බසින් පැවතගෙන ආ තදර්ථකථා එසේම පැවතියහොත් අනාගතයේ පාප භික්ෂූන්ගේ දුර්මත මුසු වීමෙන් දූෂිත විය හැකි බව දුටු **මහා විහාරීය මහ තෙරවරුන්ගේ** ඇරයුම පිට, ''**ඒකාන්තයෙන් ම මෙතේ බෝසතුන් වහන්සේ ම**'' යැයි මහා විහාරීය මහ රහතුන් වහන්සේලාගේ සම්භාවනාවට පාත්‍ර වූ **බුදුගොස් ඇදුරුපාණන් වහන්සේත්, අනෙකුත් අටුවා ඇදුරුපාණන් වහන්සේලාත්,** සීහළ අටුවා අනාගතය දක්වා ද, සමස්ථ ලෝකය පුරා ද සුරක්ෂිත කරලනු වස් **ශුද්ධ මාගධී** භාෂාවට පෙරළුවාහු සද්ධර්මයේ චිරස්තිථියට අමිල දායකත්වයක් දුන්නාහ. එපමණකුදු නොව අනාගතයේ සුපේශල භික්ෂූන් උදෙසා සර්වඥ සුභාෂිතයට අනුව යමින් ධර්ම-විනය

විනිශ්චයන් තවදුරටත් විදහා දක්වමින් **ටීකා ග්‍රන්ථ සම්පාදනය කළ ඇදුරුපාණන් වහන්සේලා** ද ඇතුළු සැවොම මෙහිලා සම්භාවනීය පූජනීයත්වයෙන් පිදිය යුත්තාහුම ය.

ඒ අතීත මහෝත්තමයන් වහන්සේලා ජීවිත පරිත්‍යාගයෙන් අපමණ වෙහෙසක් දරා රැකගෙන ආ සුපිරිසිදු ථේරවාදී සද්ධර්මය යටපත් වීමට නොදී තවත් බොහෝ කළක් නිවන් මග හෙළිකරනු පිණිස සුරක්ෂිත කළා වූ මෑතකාලීන උදාරතර සංඝපිතෘන් වහන්සේලා අතර පරම පූජනීය **පැලෑණේ සිරි වජිරඤාණ මහානාහිමියන් වහන්සේ**, පරම පූජනීය **මාතර ශ්‍රී ඥානාරාම නායක මා හිමිපාණන්වහන්සේ**, ලොව පුරා දම් ගොස පතුරුවමින් අවවාදයෙන් පමණක් නො ව ආදර්ශයෙන් ද සැම සිත් සතන් පැහැදූ පරම පූජනීය **මඩිහේ පඤ්ඤාසීහ මහානාහිමියන් වහන්සේ**, පරම පූජනීය **කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ නායක මා හිමිපාණන්වහන්සේ**, පරම පූජනීය **වැලිගම ශ්‍රී ඤාණරතන මහානාහිමියන් වහන්සේ**, අති පූජනීය **ගංගොඩවිල සෝම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ** ආදී අපවත් වී වදාළ සියලු බුද්ධ පුත්‍රයන් වහන්සේලා පැතූ උතුම් බෝධියකින් වහා වහා නිවනින් සැනසෙත්වා! යැයි මෙහිලා ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

ස්වකීය සන්තානය තුළ උතුරා යන කරුණාගුණයෙන් වත්මන් සඟ පරපුරට ගුණ මිණි පහනක් වූ නිවන් දකින තුරු භවයක් භවයක් පාසා පැවිදි බව පතන්නා වූ පරම පූජනීය **අම්පිටියේ ශ්‍රී රාහුල නායක මා හිමිපාණන්වහන්සේට**, සම්බුදු දම් දසත පතුරා ලන මෛත්‍රී මූර්තියක් බඳු අති පූජනීය **නාඋයනේ අරියධම්මාභිධාන මා හිමිපාණන්වහන්සේට**, අප උපාධ්‍යායෝත්තම අති පූජනීය **තිරිකුණාමලේ ආනන්ද මහානායක මා හිමිපාණන්වහන්සේට**, අති පූජනීය **කහගොල්ලේ සෝමවංශ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට**, විනය විශාරද විද්‍යාවේදී අති පූජනීය **නුවරඑළියේ ඤාණසීල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට**, අප ආචාර්යෝත්තම පූජ්‍යපාද වැලිමඩ **පසන්නමානස ස්වාමීන්ද්‍රයන් වහන්සේ** ඇතුළු මහා සංඝ ස්ථවිරයන්

වහන්සේලා හට නිදුකින් තවත් චිරාත්කාලයක් ස්වකීය සසුන් මෙහෙවරට විහරණ සැලසී පැතූ බෝධියකින් නිවනින් සැනසීමට මේ කුසල ශක්තිය පාරමිතාවක් ම වේවා!

මෙම මා හැඟි සත්කාර්යයෙහි ලා පෙළ අටුවා සිංහලයට පෙරළමින් මහා විහාරීය විනය විනිශ්චයන් මොනවට සපයමින් වඩාත් අර්ථවත් කෘතියක් බවට පත් කරලීමට ස්වකීය කුදු මහත් කටයුතු මධ්‍යයේ කාලය මිඩංගු කරමින් නිරතුරුව උපකාර කළ **දිද්දෙණිය රණගිරිලෙන අරණ්‍ය සේනාසනයේ පූජනීය ලොකු ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට** සුවසේ ම තවත් චිරාත් කාලයක් සසුන් වැඩ සලසමින් ගුණ දම් පුරාගෙන ප්‍රාර්ථනීය බෝධියකින් නිවනින් සැනසෙන්න ම මින් ජනිත කුසල සම්භාරය හේතු වේවා ! යි කෘතඥ පූර්වකව සිහිපත් කළ යුත්තාහ.

එසේම මෙම උතුම් කර්තව්‍යයෙහි ලා සෝදුපත් බලමින් උපකාර කළ මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය පූජ්‍යපාද **මාඹුල්ගොඩ සුමනරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට,** මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ ආචාර්ය පණ්ඩිත පූජ්‍යපාද **බංගලාදේශයේ ධම්මපාල ස්වාමීන් වහන්සේට,** මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ ආචාර්ය ශාස්ත්‍රපති, පණ්ඩිත පූජ්‍යපාද **පාණදුරේ පසන්න ස්වාමීන් වහන්සේට,** කහගොල්ලේ ශ්‍රී ඥානාරාම විවේකාශ්‍රමවාසී පූජ්‍යපාද **කැටවල ධම්මසුමන ස්වාමීන් වහන්සේට,** බම්බලපිටිය සිරි වජිරාරාමවාසී ශාස්ත්‍රපති පූජ්‍යපාද **මීගොඩ සුඛිත ස්වාමීන් වහන්සේට** ද,

එසේ ම මෙම ගත සකස් කිරීම සඳහා නන් අයුරින් උපකාර කළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමාධිපති, මහෝපාධ්‍යාය අති පූජනීය **නාඋයනේ අරියධම්මාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට,** උපස්ථායක හිමි පූජ්‍යපාද **නාගපොකුණේ අරියසීල ස්වාමීන් වහන්සේට, බෙලිහුල්ඔය සීල සමාහිත භාවනා යෝගාශ්‍රමයෙහි ගරු කටයුතු ස්වාමීන් වහන්සේලාට,** පූජ්‍යපාද **මකුලෑවේ සුදස්සන**

**ස්වාමීන් වහන්සේට**, පොල්ගම්පල, කෙවිටියාගල **විමුත්ත චිත්ත විවේකාශ්‍රමයට**, පරිගණක කටයුතු වලදීත් අනෙකුත් උපකාරක කටයුතු වලදීත් සහය දැක් වූ ගිහි පින්වතුන් සැමදෙනාට, තවද මෙම වටිනා ග්‍රන්ථය මුද්‍රණය කිරීම සඳහා බරපැන දැරූ **මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ භාවනා සහ සීල සමාදාන වැඩසටහන් වලට සම්බන්ධ පින්වතුන්** සැමදෙනාට, මුද්‍රණ කටයුතු කරදුන් **කරුණාරත්න සහ පුත්‍රයෝ** පුද්ගලික සමාගමේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට නිදුකින් නිවන් මග යා ගැනීමට, තව තවත් සසුන් ගුණදම් පුරා ගෙන පැතූ උතුම් බෝධියකින් නිවනින් සැනසීමට මේ කුසල ශක්තිය හේතු වේවා !

නිස්සරණාධ්‍යාශයෙන් සසුන් වන්, වත්මන් සසුනේ ගුණදම් පුරන්නා වූ සහ අනාගතේ සසුන් ගතවන්නා වූ සියලු සඟ පරපුරට තම දිවි පරදුවට තබා සර්වඥ ප්‍රඥප්ත සිකපද රැකගෙන බුදුසසුන තවත් චිරාත්කාලයක් සුරැකීමට අවැසි විහරණ සැලසේවා ! සාසන භාරධාරී ලෝකපාලක සැම සියලු දිව්‍යතා මණ්ඩලයේ ධාර්මික දේවාරක්‍ෂාව සද්ධර්මයේ චිරස්ථිතිය පිණිස වේවා !

මේ මාහැඟි ධර්ම දානයෙන් රැස්වන්නා වූ සියලු කුසල සම්භාරයන් අප හැදූ වැඩූ මව් දෙමව්පියන්ටත්, ඥාති හිතමිත්‍රාදීන්ටත්, සමස්ථ ලෝකවාසී සත්වප්‍රජාවටත් ලොවුතුරා සුව සදාලනු පිණිස හේතු වේවා !

- ***චිරං තිට්ඨතු ලෝකස්මිං සම්මාසම්බුද්ධ සාසනං*** -

**කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය,**
**කිතුල්ගොඩ,**
**අගලවත්ත.**

# සුගතෝවාදය

“අප්පමාදේන භික්ඛවේ සම්පාදේථ,
දුල්ලභෝ බුද්ධුප්පාදෝ ලෝකස්මිං,
දුල්ලභෝ මනුස්සත්ත පටිලාභෝ,
දුල්ලභා ඛණ සම්පත්ති,
දුල්ලභා පබ්බජ්ජා,
දුල්ලභං සද්ධම්ම සවණං,
දුල්ලභෝ සප්පුරිස සංසේවෝති.

ආරභථ, නික්ඛමථ, යුඤ්ජථ බුද්ධසාසනේ,
ධුනාථ මච්චුනෝ සේනං නළාගාරංව කුඤ්ජරෝ.
යෝ ඉමස්මිං ධම්මවිනයේ අප්පමත්තෝ විහෙස්සති,
පහාය ජාතිසංසාරං දුක්ඛස්සන්තං කරිස්සතීති.”

***සං.නි. I - අරුණවතී සූත්‍රය. (බු.ජ.මු), පි.280***

## සංකේත නිරූපණය

බු.ජ.මු. : බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා මුද්‍රණය

ම.ඡ.සං. : මරම්ම (බුරුමරට) ඡට්ඨසංගීති සංස්කරණය

හේ.වි.මු. : සයිමන් හේවාවිතාරණ ත්‍රිපිටක ග්‍රන්ථමාලා මුද්‍රණය

මා.පා. : මරම්ම (බුරුමරට) ඡට්ඨසංගීති සංස්කරණය විනය පිටක (ටීකා) ද්වේමාතිකාපාළි

# පිය ගැට පෙළ...

පිටුව


★ ආශිර්වාදය ... ... ... ... ... ... ... ... ... ... ... ... xiii - xiv
★ පූර්විකාව ... ... ... ... ... ... ... ... ... ... ... ... ... xv - xviii
★ පොත ගැන වචනයක් ... ... ... ... ... ... ... xix - xx
★ ආරම්භයට අර්ථ කථනයක් ... ... ... ... ... ... xxi - xxv
★ මාර්ගයන් අතුරෙන් ශ්‍රේෂ්ඨතම මාර්ගය ... xxvi
★ බුද්ධාවවාද ... ... ... ... ... ... ... ... ... ... ... ... xxvii - xxviii
★ සීලුද්දේස පාඨ ... ... ... .. ... ... ... ... ... ... xxix - xxx
★ මහණකම ගැන කිවූ රුවන් වැකි ... ... ... ... xxxi - xxxiii
★ සිකපද පැනවීමට හේතු ... ... ... ... ... ... ... xxxiv
★ ඕවාද ප්‍රාතිමොක්ෂය ... ... ... ... ... ... ... ... xxxv
★ සංඝ උපෝසථයේ පූර්වකරණ ආදී විධි ... 1 - 8
★ විනය පිටකයට නමස්කාරය ... ... ... ... ... 9
★ උපෝසථය - භික්‍ෂු ප්‍රාතිමෝක්‍ෂය ... ... ... 10 - 116
★ කෙටියෙන් පාමොක් උදෙසීම ... ... ... ... ... 118 - 119
★ පාරිසුද්ධි උපෝසථය ... ... ... ... ... ... ... ... 120 - 121
★ වස් අධිෂ්ඨානය ... ... ... ... ... ... ... ... ... ... 122
★ සංඝ පවාරණයෙහි පූර්වකරණ ආදී විධි ... 123 - 130
★ සංඝ පවාරණ විධි .. ... ... ... ... ... ... ... ... 131 - 134
★ කඨිනත්ථරණය ... ... ... ... ... ... ... ... ... ... 135 - 137
★ උපසම්පදා කර්මය ... ... ... ... ... ... ... ... ... 138 - 150
★ සීමා සමූහනන, සීමා සම්මුති ... ... ... ... ... 151 - 155
★ අපටිච්ඡන්න ආපත්ති ... ... ... ... ... ... ... 156 - 159
★ ඒකාහපටිච්ඡන්න ඒකාපත්ති පරිවාසය ... ... 160 - 166

★ අග්ඝසමෝධාන පරිවාසය ... ... ... ... ... ... ... 167 - 179

★ සුද්ධන්ත පරිවාසය ... ... ... ... ... ... ... ... ... 180 - 188

★ පරිවාස අපටිච්ඡන්න
මූලාය පටිකස්සනය ... ... ... ... ... ... ... ... 189 - 197

★ පරිවාස පටිච්ඡන්න
මූලාය පටිකස්සනය ... ... ... ... ... ... ... ... 198 - 211

★ මානත්තචාරික පටිච්ඡන්න
මූලාය පටිකස්සනය ... ... ... ... ... ... ... ... 212 - 229

★ උපග්‍රන්ථය I
- භික්ෂූන් වහන්සේලා වන්දනා කිරීම ... ... ... 230
- ඇවැත් දෙසීම ... ... ... ... ... ... ... ... ... ... ... 230 - 232
- උපාධ්‍යායග්‍රහණය, ආචාර්යග්‍රහණය ... ... ... 233
- විනය කර්ම සඳහා ඡන්දය දීම ... ... ... ... ... 234 - 235
- කප්බිංදු තැබීම ... ... ... ... ... ... ... ... ... ... 236
- සිවුරු පරිහරණය පිළිබඳ විස්තර ... ... ... ... 236 - 240
- පාත්‍ර පරිහරණය පිළිබඳ විස්තර... ... ... ... ... 240 - 241
- භේසජ්ජ නිස්සජ්ජනය කිරීම .. ... ... ... ... ... 242
- ආපුච්ඡාකරණය ... ... ... ... ... ... ... ... ... ... 243 - 244

★ උපග්‍රන්ථය II ... ... ... ... ... ... ... ... ... ... ... 245 - 249

★ සිවුපසය ප්‍රත්‍යවේක්ෂාව ... ... ... ... ... ... ... ... 250 - 251

★ දසධම්ම සූත්‍රය ... ... ... ... ... ... ... ... ... ... ... 251 - 252

★ තෙරුවන් කමා කිරීම ... ... ... ... ... ... ... ... ... 253

★ ආශ්‍රිත ග්‍රන්ථ

දානමය දායකත්වය දරන පින්වතුන්ගෙන් වචනයක්....

## “සුඛෝ බුද්ධානං උප්පාදෝ”

(බුදුවරුන්ගේ පහළවීම සැපයෙකි)

ධර්ම ගෞරවය සහ ශික්ෂා ගෞරවය ඇති ව මෙම උතුම් ග්‍රන්ථය පරිශීලනය කරන සියලු ම මහා සංඝරත්නයට රහත්ඵල අවබෝධය පිණිස ම හේතු වේවා !

**සාදු ! සාදු !! සාදු !!!**

දානමය දායකත්වය : මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ භාවනා සහ සීල සමාදාන වැඩසටහන් වලට සම්බන්ධ පින්වතුන්.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක, ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක, මහෝපාධ්‍යාය, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය සාසනධජ, මහා කම්මට්ඨානාචාර්ය අතිපූජනීය නාඋයනේ අරියධම්මාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි...

## ආශිර්වාදය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

මීමැස්සා සුවඳ ඇති මලක වර්ණයටත් සුවඳටත් හානි නොවන සේ එමල් රොන් ටික උරාගෙන මලේ කරලක් හෝ කෙඩියක් කඩගැනීමට නිසිටක් වෙයි. මලේ රොන් ටික රැගෙන තමන්ටත් අන් අයටත් ප්‍රයෝජනය පිණිස ප්‍රණීත මී පැණි නිපදවයි.

ප්‍රත්‍යේගල ශික්ෂාකාමී සිල්වත් බුද්ධපුත්‍රයන් වහන්සේත් සීල සමාධි ප්‍රඥාවෙන් යුතුව ශ්‍රද්ධා ප්‍රසාදය ඇති බෞද්ධයන්ගේ ධාර්මික සිවුපස පිළිගෙන ඔවුන්ට ලෞකි ලොවුතුරා සම්පත් සලසා දෙති.

තමන්ටත් සිවු පිරිසිදු සීලයත් ධ්‍යාන සමාධි සමාපත්ති අභිඥාබල විදර්ශනා ඥාන මාර්ග ඵල නිර්වාණ අමානායන් පානය කර ගනියි. සැදැහැවතුන්ගේ ධාර්මික සිවුපසය ප්‍රත්‍යවේක්ෂා නුවණින් පිළිගෙන නවදහස් එකසිය අසූ කෝටි පනසක් ලක්ෂ තිස්හය දහසින් යුත් පිරිසිදු ශික්ෂා පද ඇතුළත් ප්‍රධානත්වය දරණ ශික්ෂාපද

දෙසිය විසිහතක් වන ප්‍රාතිමෝක්ෂය ප්‍රසාදනීය ලෙස මුද්‍රණය කරවා පුස්කොල බුද්ධ පුත්‍රයන් වහන්සේලාගේ ධාරණ චරණ කුශලතාව සඳහා සම්පාදිත වීම අතිශයින්ම ප්‍රශංසනීයයි.

අති උතුම් භික්ෂු ප්‍රාතිමෝක්ෂය මෙසේ සම්පාදනය කරවූ රමණීය කිතුල්ගොඩ ආරණ්‍ය සේනාසන වාසී පූජනීය මහා සඟ රුවනට රත්නත්‍රයේ අනන්ත සුවිසි මහා ගුණානුභාවය බලයෙන් ආයුරාරෝග්‍යාදී සැපතත් ශාන්ති ලක්ෂණ නිර්වාණාවබෝධය පිණිසත් අපගේ මෛත්‍රී පූර්ණ ආශිර්වාදය වේවා.

"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා."

මෙයට,
මෙතැනි.



ශ්‍රී.බු.ව. 2560 (2016) වෙසක් මස (මැයි) 24 වැනි දින.

මීතිරිගල,
ධර්මායතනයෙහි දී ය.

# පූර්විකාව

බම්බලපිටියේ සිරි වජිරාරාමාධිපති, අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහානායක, ශ්‍රී ප්‍රඥාසිංහ ධර්මකීර්ති ශ්‍රී, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්දාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි...

## ප්‍රාතිමෝක්ෂය භික්ෂුවගේ ජීවය යි.

**'පාතිමොක්ඛ'** යන පාළි වචනයෙහි තේරුම අතිශයින් ප්‍රමුඛ, ඉතා ශ්‍රේෂ්ඨ, ඉතා උතුම් යන්න ය.

ධර්මවිනයෙහි ශික්ෂාපද ශීලයට ප්‍රමුඛ වටිනාකමක් ලැබේ. එ හෙයින් ඒ ශික්ෂාපද ශීලයට පාතිමොක්ඛ (සංස්කෘත - ප්‍රාතිමෝක්ෂ) යන නම භාවිතා වේ. මෙයින් කැලම අදහස් වන්නේ භික්ෂු ශීලය යි.

කුසල් දහම් වැඩීමට මේ භික්ෂු ශීලය මහාද්වාරයක් වේ. ප්‍රමුඛ වේ. එ හෙයින් ද ප්‍රාතිමෝක්ෂ යනුවෙන් බැවහර වන බව පහත සඳහන් පාඨයෙන් පැහැදිලි වේ. **''ආදිමේතං, මුඛමේතං, පමුඛමේතං කුසලානං ධම්මානං, තෙන වුච්චති පාතිමොක්ඛං''** ප්‍රාතිමෝක්ෂය සංඛ්‍යාත ශික්ෂාපද ශීලය රකින්නා අපායාදි දුකින් නිදහස ලබන බව එ හෙයින් ප්‍රාතිමෝක්ෂය නමින් හැඳින්වෙන බව **''තං හි යෝ නං පාති රක්ඛති තං මොක්ඛේති මෝචේති ආපායිකාදීහි දුක්ඛේහි තස්මා පාතිමොක්ඛන්ති වුච්චති''** යන අටුවා විවරණයෙන් ස්ඵුට වේ.

විනය පිටකයෙහි පාරාජිකා පාළි, පාචිත්තිය පාළි, යන උභය විභංගයෙහි ඇතුළත් ශික්‍ෂාපද සංගෘහිත කෘතියක් වන ප්‍රාතිමෝක්‍ෂ පාලිය **(පාතිමොක්ඛ පාළි)** බුදුරජාණන් වහන්සේ ධරමාන කාලයෙහි ම ව්‍යවහෘත කෘතියක් ය යන්න බොහෝ උගතුන් ගේ පිළිගැනීම යි. බුද්ධශාසන මාර්ගයෙහි ශීලය මුලට ම ගැණෙන හෙයින් එය ආරම්භක අත්‍යාවශ්‍යක ප්‍රතිපදාවක් ලෙස පිළිගැනිණි.

බොහෝ සූත්‍රවල භික්‍ෂුවක ගේ විනය ප්‍රතිපදාව පැහැදිලි කරන තන්හි දක්ක හැකි දේශනා පාඨයෙකි පහත සඳහන් වන්නේ :

**''ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගෝචරසම්පන්නො අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදේසු.''**

සෙසු සංවර ශීල සේ ගැණෙන ඉන්ද්‍රියසංවර ශීලය, ආජීවපාරිශුද්ධි ශීලය හා ප්‍රත්‍යයසන්නිඃශ්‍රිත ශීලය යන ප්‍රභේදවලට ආරම්භක ව සිටින්නේ ප්‍රාතිමෝක්‍ෂ සංවර ශීලය බැවින්, එහි ප්‍රමුඛ භාවය, අත්‍යාවශ්‍යක භාවය හා උපයෝගිතාව කෙ බඳු ද යන්න මෙහි දී නුවණින් විමසා බැලිය යුතු ය.

හුදෙක් ඕවාද ප්‍රාතිමෝක්‍ෂයෙන් හික්මීම ලැබූ භික්‍ෂු සමාජය සම්බුද්ධත්වයෙන් වසර විස්සක් ඉකුත් වූ තැන චර්යාමය වශයෙන් විෂම ස්වභාවයක් ගත් හෙයින්, යම් යම් ගැටලු, අර්බුද පෘථග්ජන භික්‍ෂූන් අතර ඇති

වන්නට විය. බුදුරජාණන් වහන්සේට භික්ෂුව ගේ මූලික සංවරය පිණිසත්, සංඝ සමාජයේ අභිවර්ධනය පිණිසත් ධර්මවිනයේ චිරස්ථිතිය පිණිසත් නීති රීති වශයෙන් විනය ශික්ෂාපද පනවන්නට සිදු වූ යේ ඉන් ඉක්බිති ව ය. විවිධ සමාජ පරිසර හා අත්දැකීම් අනුව මිනිසා ගේ මනෝභාව විෂමත්වයට සංකීර්ණත්වයට පත් වීම හේතු - ඵලවාදී සිද්ධියක් වුව ද, එය ස්වභාවවාදයකට සාධාරණය නො කොට හේතු - ඵල න්‍යායානුකූල ව ඊට නිසි පිළියම් යොදා, මිනිසා සංවරත්වයට හුරු කොට විනයානුකූල පිළිවෙත් මඟකින් රැකගෙන පුනරුත්ථාපනය කිරීමේ වගකීම බුදු පියාණන් වහන්සේ ප්‍රාතිමෝක්ෂ විනය ප්‍රඥප්ති මාලාවෙන් අපට පැහැදිලි කොට ඇත. සමාජ දුසිරිත් මැඩ පැවැත්වීමට මරණ දඬුවම ගෙන එන්නට උද්ඝෝෂණ කරන හැම කෙනෙකු ම බුදුරජාණන් වහන්සේ ගේ ආයති සංවර න්‍යාය පදනම විචාරශීලී ව විමර්ශනය කළ යුතු ය.

සැබවින් ම භික්ෂුව ආරක්ෂා කරන මුර වැට නම් භික්ෂු ශීලය ම මිස අන් දෙයක් නො වේ. භික්ෂූන් වහන්සේත් භික්ෂුත්වයත් ආරක්ෂා වන්නේ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙනි. ශාසන චිරස්ථායී වන්නේ ද එ මඟිනි. භික්ෂුවට මාර්ග - ඵල - නිර්වාණ සංඛ්‍යාත ලොවුතුරු දියුණුව සලසා ගත හැකි වන්නේ ශීලයෙන් ම ය. භික්ෂූන් වහන්සේලාට ශීලයෙන් තොර ව ප්‍රගමනයක් ද, රක්ෂණයක් ද, ජීවිතයක් ද නැත. බුදුරජාණන් වහන්සේ ''**සීලස්සේව පරිපූරකාරී**'' යනුවෙන් දක්වා ඇත්තේ එ හෙයිනි. භික්ෂු පිරිසට අඩ මසකට වරක් රැස්ව ප්‍රාතිමෝක්ෂ දේශනාව

අනුදූන වදාරා ඇත්තේ මෙ කී මහදර්ථය සලකාගෙන ය.

අගලවත්ත කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය මඟින් මෙ ම ප්‍රාතිමෝක්‍ෂ භික්‍ෂු ශීලය අර්ථ ව්‍යාඛ්‍යාන සහිත ව රටට ඉදිරිපත් කරන්නේ ශාසනයේ ආයුෂ වන විනය ගරුක බව දියුණු කිරීමේ සත්පුරුෂ චේතනාවෙනි. මෙ බඳු විනය ව්‍යාඛ්‍යාන සංග්‍රහ පැරණි අවධියේ පටන් බහුල ව සම්පාදනය කැර ඇතත් නැවතත් මෙ බඳු කෘතියකින් ප්‍රාතිමෝක්‍ෂ ශික්‍ෂා ද්‍යෝතනය කරන්නේ එහි කාලීන අවශ්‍යතාව සලකාගෙන ය.

මේ ශාසනික විනයානුග්‍රාහක සංග්‍රහයට මඟ පෙන්වීම කළ පූජ්‍ය වැලිමඩ පසන්නමානස ස්වාමීන් වහන්සේ ඇතුළු සම්පාදනයෙහි මහත් වෙහෙස දරූ ගරු කටයුතු සියලු ස්වාමීන් වහන්සේලාට ද මුද්‍රණද්වාරයෙන් එළි දක්වූ අනුග්‍රාහක පින්වත් හැම දෙනාට ඉතා මෙත් සිතින් ආශීර්වාද පිරිනමනු කැමැත්තෙමි.

**''විනයේ ඨිතේ සාසනං ඨිතං හෝති''**

මෙත් සිතැති,



**ශ්‍රී.බු.ව. 2559 (2015) වප් මස (ඔක්තෝබර්) 08 වැනි දින.**

**බම්බලපිටිය,**
**සිරි වජිරාරාමයෙහි දී ය.**

# පොත ගැන වචනයක්....

**අම්බලන්ගොඩ ගල්දූව ගුණවර්ධන යෝගාශ්‍රමයේ ප්‍රධාන අනුශාසක ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සඞ්ඝ ලේඛකාධිකාරී කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය කහගොල්ලේ සෝමවංශ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි....**

අගලවත්ත කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනයේ වැඩ සිටින ස්වාමීන් වහන්සේලා එකතු වී සකස් කරන ලද මේ උතුම් ග්‍රන්ථය සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලාගේ ගුණ නැණ දියුණුවට මහෝපකාරී වේ.

සීල සංවරය පිණිස හේතු වෙන දේ සිදු කිරීම අතිවිශාල පිංකමකි. කය - වචනය දෙකෙහි සංවරකම සීලය යි. එය ආරක්ෂා කිරීම දියුණු කිරීම ඔබ අප හැම ගේ වගකීම යි. ලොවුතුරා බුදුරජාණන් වහන්සේ මේ සීලය ගැන ශික්ෂාපද නවදහස් එකසිය අසූ කෝටි පනස් ලක්ෂ තිස් හයදහසක් පනවා ඇත. එය විනය පිටකය යි. ධර්මස්කන්ධ වශයෙන් විසි එක් දහසකි.

පාරාජිකා පාළිය, පාචිත්ති පාළිය, මහාවග්ග පාළිය, චුල්ලවග්ග පාළිය, පරිවාර පාළිය යැයි ග්‍රන්ථ වශයෙන් පහකට ප්‍රථම ධර්ම සංගායනාවේ දී වෙන් කරන ලදී. මේ සියලු දේ පිළිබඳ හසල දැනුමක් ඇති කර ගැනීම භික්ෂූන් වහන්සේ සතු වගකීම යි. අතීතයේ මහා උතුමන් වහන්සේලා කටපාඩමින් විනය පිටකය ඉදිරියට රැගෙන පැමිණි නිසා අද අපට ග්‍රන්ථ වශයෙන් ලැබී ඇත.

අපි සැවොම විනය පිළිබඳ හසල දැනුමක් ඇති කරගෙන සීල සංවරයෙහි පිහිටා එය ම සමාධිය පිණිසත් ප්‍රඥාව පිණිසත් දියුණු කරගෙන විමුක්තිය පිණිස වැඩ කරමු.

භික්ෂු ප්‍රාතිමෝක්ෂය ග්‍රන්ථය නැවත මෙසේ ඔබ සැමට කියවීමට ලැබීම ගැන සිතා සතුටු විය යුතු යි. තමන් ගේ ජීවිතවල අඩු පාඩු සියල්ල හදාගෙන සිත දියුණු කර ගැනීම සඳහා ම බැසගෙන කටයුතු කිරීමට අදිටන් කරගනු මැනවි.

මේ විනය පොත සංස්කරණය කළ සියලු ම ස්වාමීන් වහන්සේලාට නිරෝගී සුව දිගාසිරි ලැබේවා! යි මෙත් සිතින් ආශිර්වාද කරමි.

මෙයට,
මෙත් සිතැති,



**ශ්‍රී.බු.ව. 2559 (2015) වප් මස (ඔක්තෝබර්) 15 වැනි දින.**

**කහව, අම්බලන්ගොඩ,**
**ගල්දූව අරණ්‍ය සේනාසනයෙහි දී ය.**

# ආරම්භයට අර්ථ කථනයක්...

බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් ලෝක සත්ත්වයන්ගේ යහපත උදෙසා පිහිටු වන ලද ශාසනය ආරක්ෂා වන්නේ ඒ උතුම් ධර්මවිනය ආරක්ෂා වීමෙනු යි. ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශාසනය ආරක්ෂා වන්නේ, භික්ෂූන් වහන්සේලාගේ ත්, භික්ෂුණීන් වහන්සේලාගේ ත්, උපාසක, උපාසිකාවන්ගේ ත් වෙනස් නො විය යුතු ප්‍රතිපදාව තුළ බව බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට මාස තුනකට පෙර මනාව පෙන්වා දුන් සේක. මේ උතුම් ශාසනය ආරක්ෂා වන්නේ සිවුවනක් පිරිසගේ ප්‍රතිපදාව තුළ මිසක් වෙන කිසිදු බාහිර බලවේගයක් නිසා නො වන බව අප මනාව තේරුම් ගත යුතු කරුණකි.

මෙහි ලා ශාසනය යන්නෙහි අර්ථය අප මනාව පැහැදිලි ව තේරුම් ගත යුතු ය. ශාසනය යන්න ධර්මයෙහි ප්‍රධාන කොටස් තුනකින් පෙන්වා දී ඇති අතර, ඒ කාරණා තුන ම ආරක්ෂා වීමෙන් ශාසනයේ ආරක්ෂාව පවතින්නේ ය.

- **පරියත්ති ශාසනය**
- **ප්‍රතිපත්ති ශාසනය**
- **ප්‍රතිවේද ශාසනය**

යන්න ඒ කොටස් තුන යි. එහි දි බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් දේශනා කළ විනය, සූත්‍ර, අභිධර්මය මිසදුටු ආදි ප්‍රතිපත්තිවලින් කිළිටි නො වී මුල, මැද, අග සර්වාකාරයෙන් දේශිත ශ්‍රී සද්ධර්මය පැවැතීම '**පරියත්ති ශාසනය**' යි.

සීල, සමාධි, ප්‍රඥා නැමති ආර්ය මාර්ගය ලෞකික-ලෝකෝත්තර වශයෙන් වැඩීම '**ප්‍රතිපත්ති ශාසනය**' ලෙසත්, ඒ ආර්ය මාර්ගය පරිපූර්ණ කරමින් ලබන සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අරිහත් යන සතර මාර්ග ඵල ලබාගැනීම '**ප්‍රතිවේද ශාසනය**' ලෙසත් සඳහන් වේ.

මෙහි දී අපට පැහැදිලි වන්නේ ශාසනය යනු මේ ත්‍රිවිධ කාරණා බවත්, ශාසනයේ ආරක්ෂාව යනු සිවුවනක් පිරිස මනා කොට මේ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමත් බව ය.

මෙහි දී බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ශාසනයේ ආරක්ෂාව පවතින ප්‍රධාන කාරණාව වනුයේ තම ශ්‍රාවකයින් හට බුදුරජාණන් වහන්සේ විසින් පැන වූ සිකපද මනා ව ආරක්ෂා කිරීම යි. මේ පනවා වදාළ සිකපද සියල්ල ම එකට කැටි කොට ගත් කළ එයට අපි ප්‍රාතිමෝක්ෂය යැයි කියනු ලැබේ. '**පාති**' යන පදයෙහි පාළි අර්ථය '**රකියි**', '**පාලනය කරයි**' යන්නයි. කුමක් රකියි ද, පාලනය කරයි ද, බුදුරජාණන් වහන්සේ දේශනා කළ සිකපද රකියි, පාලනය කරයි යන්න යි. '**මොක්ඛ**' යන්නෙහි අර්ථය '**මිදීම**', '**නිදහස්වීම**', **නිර්වාණය**' යන්න යි.

එනම් භික්ෂුව විසින් සියලු දුක්වලින් නිදහස් ව ලබන නිර්වාණය අවබෝධ කරගැනීම සඳහා පිළිපැදිය යුතු, රැකිය යුතු, අනුගමනය කළ යුතු සීලය නම් '**ප්‍රාතිමෝක්ෂ**' යැයි කියනු ලැබේ.

සීලයේ ප්‍රභේද බෙදා දක්වන කල්හි සංවර සීලය කොටසට ගැනෙන සති සංවර, ඤාණ සංවර, ඛන්ති සංවර, විරිය සංවර, ප්‍රාතිමෝක්ෂ සංවර, කොටසෙහි ප්‍රාතිමෝක්ෂ සීලය යනු මෙය යි.

එනම් බුදුරජාණන් වහන්සේ ගේ ශාසනය ආරක්ෂා කර ගැනීමට යම් භික්ෂුවක් කල්පනා කරයි ද, එම භික්ෂුව විසින් අනිවාර්යෙන් ම ප්‍රාතිමෝක්ෂ සීලයෙහි හික්මිය යුතු බව අපට පහත කාරණාව පිළිබඳ ව ඉතා ම පැහැදිලි වේ.

බුදුරජාණන් වහන්සේ වේරඤ්ජා නුවර වැඩ වාසය කරන කල්හි, සාරිපුත්ත මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ මෙසේ විමසී ය.

භාග්‍යවතුන් වහන්ස, කුමන බුදුරජාණන් වහන්සේලා ගේ ශාසනය චිරස්ථායි නො වී ද? කුමන බුදුරජාණන් වහන්සේලා ගේ ශාසනය චිරස්ථායි වී ද?

මෙහි දී බුදුරජාණන් වහන්සේ දේශනා කළේ, මෙයින් පෙර පහළ වූ විපස්සි, සිඛී, වෙස්සභූ, බුදුරජාණන් වහන්සේලා ගේ ශාසන බොහෝ කල් නො පැවතුන අතර, කකුසඳ, කෝණාගම, කාශ්‍යප බුදුරජාණන් වහන්සේලා ගේ ශාසන බොහෝ කල් පැවැතුණ බව ය.

*''කෝ නු බෝ භන්තේ හේතු කෝ පච්චයෝ යේන භගවතෝ ච විපස්සිස්ස භගවතෝ ච, සිඛිස්ස භගවතෝ ච වෙස්සභුස්ස බ්‍රහ්මචරියං න චිරට්ඨිතිකං අහෝසී ?''ති.*

සාරිපුත්ත මහරහතන් වහන්සේ එසේ වීමට හේතු විමසූ කල්හි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ :

*''භගවා ච සාරිපුත්ත විපස්සි භගවා ච සිඛී භගවා ච වෙස්සභූ කිලාසුනෝ අහේසුං සාවකානං විත්ථාරේන ධම්මං දේසේතුං, අප්පකං ච තේසං අහෝසි සුත්තං, ගෙය්‍යං, වෙය්‍යාකරණං, ගාථා, උදානං, ඉතිවුත්තකං, ජාතකං, අබ්භූතධම්මං, වේදල්ලං, අප්පඤ්ඤත්තං සාවකානං සික්ඛාපදං අනුද්දිට්ඨං පාතිමොක්ඛං.''*

සාරිපුත්තය, විපස්සි, සිඛී, වෙස්සභූ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් තම ශ්‍රාවකයින් හට නවාඞ්ග ශාස්තෘ ශාසනය විස්තර වශයෙන් දේශනා නො කළ අතර, ආඥා ප්‍රාතිමෝක්ෂය නො උදෙසන ලදී. ශික්ෂාපද නො පනවන ලදී.

එබැවින් එම බුදුරජාණන් වහන්සේලා ගේ ශාසන ඉතාම ඉක්මනින් අතුරුදන් විය.

සාරිපුත්ත, කකුසඳ, කෝණාගම, කාශ්‍යප යන සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් තම ශ්‍රාවකයන් හට නවාඞ්ග ශාස්තෘ ශාසනය විස්තර වශයෙන් දේශනා කළ අතර ආඥා ප්‍රාතිමෝක්ෂය උදෙසන ලදී. ශික්ෂාපද මනා කොට පැණ වූ බැවින්, එම බුදුරජාණන් වහන්සේලා ගේ ශාසන බොහෝ කල්

පැවතුණ බව දේශනා කළ සේක.

ඉහත කාරණය අනුව අපට ඉතා ම පැහැදිලි ව දක්නට ලැබෙන්නේ ශාසනය යනු සීල, සමාධි, ප්‍රඥා යන ආර්ය මාර්ගය බවත්, එම උතුම් මාර්ගය අවබෝධ කිරීමට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ විනය, සූත්‍ර, අභිධර්මය නො නැසී පැවතිය යුතු අතර, එයින් ප්‍රධාන වශයෙන් බුදුරජාණන් වහන්සේලා විසින් දේශනා කළ උතුම් ආඥා ප්‍රාතිමෝක්ෂය ආරක්ෂා කළ යුතු බවත් ය.

බුද්ධ ශාසනයේ ආයුෂය ප්‍රාතිමෝක්ෂය ආරක්ෂා කිරීම බැවින්, එම ප්‍රාතිමෝක්ෂය ආරක්ෂා නො කළ හොත් බුද්ධ ශාසනය ඉතා ම ඉක්මනින් පිරිහී යන්නේ ය. ඒ නිසා බුදුරජාණන් වහන්සේ පනවා වදාළ ප්‍රාතිමෝක්ෂය සඳහා ධර්මයේ හිමි වන්නේ අද්විතීය තැනකි.

බුදුරජාණන් වහන්සේ විසින් සංඝයා ගේ සමගිය පිණිසත් ශික්ෂාපද සිහි ගැන්වීම පිණිසත්, සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාව පිණිසත්, අඩමසකට වරක් සියලු උපසපන් භික්ෂූන් විසින් පෝය සීමාවට රැස් ව ප්‍රාතිමෝක්ෂය දේශනා කළ යුතු බව පෙන්වා දී ශික්ෂාපද පනවා වදාළේ මේ පිරිසිදු සසුන් මග පාරිශුද්ධත්වයෙන් ආරක්ෂාකර තැබීම සඳහා ය.

භික්ෂූන් වහන්සේලා ගේ පහසුව සඳහාත්, පිරිසිදු සම්බුද්ධ ශාසනය ආරක්ෂා කරගැනීම සඳහා ත් අඩමසකට වරක් ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමට භික්ෂූන් වහන්සේලා යොමු කිරීම සඳහා කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනයේ ගරු කටයුතු ස්වාමීන් වහන්සේලාගේ මග පෙන්වීම යටතේ ප්‍රකාශනය වන මෙම උතුම් ග්‍රන්ථය වන ''**භික්ෂු ප්‍රාතිමෝක්ෂය**'' වර්තමාන භික්ෂු සමාජයටත්, ශාසන දියුණුවටත්, මහත් පිටුවහලක් වනු නො අනුමාන ය.

මෙම උතුම් ග්‍රන්ථය සම්පාදනය කිරීමෙහි ලා කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනයේ ගරු කටයුතු ස්වාමීන්වහන්සේලාත්, උදව් උපකාර කළ අනෙකුත් සියලුම ගරුකටයුතු ස්වාමීන් වහන්සේලාත්, උදව් කළ අනුග්‍රාහ කළ පින්වත් හැමදෙනාමත් මුද්‍රණ කටයුතු සිදුකර දුන් පින්වත් හැමදෙනාමත් මෙත් සිත් පෙරදැරි ව සිහිපත් කරන අතර, මෙම උතුම් ග්‍රන්ථය නිතර පරිශීලනය කොට ශික්ෂා ගෞරව පෙරදැරි ව, අඩමසකට වරක් පාමොක් දේශනා කොට, මේ උතුම් සම්බුද්ධ ශාසනය ආරක්ෂා කර ගනිමින් සියලු සත්ත්වයන් ගේ යහපත පිණිස දේශනා කළ උතුම් සම්බුද්ධ ශාසනය තම ජීවිතය කොටගෙන, භික්ෂූන් වහන්සේලා ඇතුළු සියලු දෙනා ම ලද මිනිස් දිවිය උතුම් පැවිද්ද තුළින් උපරිම ප්‍රයෝජනගෙන, පැවිද්දන් හැටියට බුදුරජාණන් වහන්සේ දේශනා කළ පැවිදි මාර්ගයේ ගමන් කොට, මෙම බියකරු සසර දුකින් නිදහස් වීමට සැමදෙනාට ම සියලු ශක්තිය ධෛර්යය ලැබේවා යි! මෙත් සිතින් දන්වා සිටිමි.

මෙයට,
මෙත් සිතැති,
වැලිමඩ පසන්නමානස හිමි

පූජ්‍ය වැලිමඩ පසන්නමානස හිමි,
ප්‍රධාන අනුශාසක ස්වාමීන් වහන්සේ,
කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය,
කිතුල්ගොඩ,
අගලවත්ත.

**ශ්‍රී.බු.ව. 2559 (2015) වප් මස (ඔක්තෝබර්) 01 වැනි දින.**

## මාර්ගයන් අතුරෙන් ශ්‍රේෂ්ඨතම මාර්ගය ...

"මග්ගානට්ඨඞ්ගිකෝ සෙට්ඨෝ
සච්චානං චතුරෝ පදා
විරාගෝ සෙට්ඨෝ ධම්මානං
ද්විපදානං ච චක්ඛුමා"

මාර්ගයන් අතුරෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය උතුම් වේ. සත්‍යයන් අතුරෙන් චතුරාර්ය සත්‍යය උතුම් වේ. ධර්මයන් අතුරෙන් විරාග සංඛ්‍යාත නිර්වාණය උතුම් වේ. දිව්‍ය මනුෂ්‍යා දී දෙපා ඇත්තවුන් අතුරෙන් යසැස් ඇති පසැස් ඇති තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ම උතුම් වෙති.

**ඛු.නි. - ධම්මපදය - මාර්ග වර්ගය. (බු.ජ.මු.)**

# බුද්ධාවවාද....

"න වායමෙය්‍ය සබ්බත්ථ නාඤ්ඤස්ස පුරිසො සියා
නාඤ්ඤං නිස්සාය ජීවෙය්‍ය ධම්මේන න වණිං චරේ'ති."

මහණ තෙම සියලු ලාමක කම්හි වෑයම් නො කරන්නේ ය. අනෙකකු ගේ සේවකයෙක් නො වන්නේ ය. අන් අධිපති ආදි කෙනෙකුන් ඇසුරු කොට ජීවත් නො වන්නේ ය. ධර්මයෙන් වෙළඳාම් නො කරන්නේ ය. (ධන ආදිය පිණිස බණ නො කියන්නේ ය.)

*ඛු. නි. I - උදානපාළිය - ජටිල සූත්‍රය. (බු. ජ. මු.), පි. 256*

"න පුප්ඵගන්ධෝ පටිවාතමේති - න චන්දනං තගරමල්ලිකා වා
සතඤ්ච ගන්ධෝ පටිවාතමේති - සබ්බා දිසා සප්පුරිසෝ පවාතී'ති."

පුෂ්ප ගන්ධය උඩුසුළඟට නො හමයි. සඳුන් තුවරලා, සමන් සුවඳ හෝ උඩු සුළඟට නො හමයි. එහෙත් සත්පුරුෂයන් ගේ ගුණ සුවඳ උඩු සුළඟට හමා සත්පුරුෂ තෙමේ හැම දිසාවක්හි ම ගුණ සුවඳින් හැමේ.

*අ. නි. I - තිකනිපාතය - ආනන්දවර්ගය - 9 සූත්‍රය. (බු. ජ. මු.), පි. 400*

"ධම්මං විනා නත්ථී පිතා ච මාතා - තමෙව තාණං සරණං පතිට්ඨා
තස්මා හි භෝ කිච්ච මඤ්ඤප්පහාය - සුණාථ ධාරේථ චරාථ ධම්මේ."

ධර්මය හැර නැත වෙනත් මව්පිය සරණක් සසරගත දුකේ දි පිහිටට එන. එබැවින් අනෙක් බොහෝ වැඩවලින් ඉවත් වී, අසනු ධාරණය කරනු ධර්මයේ හැසිරෙනු.

"නො චේ ලභෙථ නිපකං සහායං - සද්ධිං චරං සාධු විහාරි ධීරං
රාජා'ව රට්ඨං විජිතං පහාය - ඒකෝ චරේ මාතඞ්ගරඤ්ඤේ'ව නාගො."

ස්ථානෝචිත ප්‍රඥා ඇති සමග හැසිරීමට සුදුසු වූ මනා විහරණ ඇති නුවණැති කල්‍යාණ මිතුරෙකු නො ලබන්නේ නම්, දිනූ රට හැර ගියා වූ රජුන් මෙන් ද වනයෙහි ශ්‍රේෂ්ඨ හස්තියා මෙන් ද එකලා ව හැසිරෙන්නේ ය.

*මහාවග්ග පාළි II - කෝසම්බක්ඛන්ධකය. (බු. ජ. මු.), පි. 870*

# බුද්ධාවවාද....

**"චන්දමණ්ඩලං භික්ඛවේ විවටං විරෝචති නො පටිච්ඡන්නං. සූරියමණ්ඩලං භික්ඛවේ විවටං විරෝචති නො පටිච්ඡන්නං. තථාගතප්පවේදිතෝ ධම්මවිනයෝ භික්ඛවේ විවටෝ විරෝචති නො පටිච්ඡන්නෝ."**

මහණෙනි, සඳමඬල විවෘත වූයේ බබල යි. වැසුණේ නො ම බබල යි. මහණෙනි, හිරුමඬල විවෘත වූයේ බබල යි. වැසුණේ නො ම බබල යි. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්ම විනය විවෘත වූයේ බබල යි. වැසුණේ නො ම බබල යි.

*අ. නි. I - තිකනිපාතය - භරණ්ඩුවර්ගය - 9 සූත්‍රය. (බු. ජ. මු.), පි. 510*

**"රුණ්ණමිදං භික්ඛවේ අරියස්ස විනයෙ යදිදං ගීතං. උම්මත්තකමිදං භික්ඛවේ අරියස්ස විනයෙ යදිදං නච්චං. කොමාරකමිදං භික්ඛවේ අරියස්ස විනයෙ යදිදං අතිවේලං දන්තවිදංසකං හසිතං."**

මහණෙනි, ආර්ය විනයෙහි ගීතය නම් හැඬීමෙකි. ආර්ය විනයෙහි නෘත්‍ය නම් උමතු ක්‍රියාවෙකි. ආර්ය විනයෙහි බොහෝ සෙයින් දත් විදහා කරන සිනාව නම් කුමරුන් කරන ළමා කමෙකි.

*අ. නි. I - තිකනිපාතය - සම්බෝධිවර්ගය - 5 සූත්‍රය. (බු. ජ. මු.), පි. 464*

**"නිහීයති පුරිසෝ නිහීනසේවී - න ච හායේථ කදාචි තුල්‍යසේවී,**
**සෙට්ඨමුපනමං උදේති ඛිප්පං - තස්මා අත්තනෝ උත්තරිං භජේථාති."**

තමන්හට වඩා (ගුණයෙන්) හීනයන් සෙවුණ පුරුෂයා පිරිහෙ යි. තමන් හා (ගුණයෙන්) සමාන පුග්ගලන් සෙවුණ පුරුෂ කිසිකලෙකත් නො පිරිහෙන්නේ ය. තමනට වඩා (ගුණයෙන්) වැඩුනවුන් වෙත නැමෙන්නේ වහා වැඩෙ යි. එහෙයින් තමන්ට වඩා (ගුණයෙන්) වැඩි තැනැත්තකු භජනය කරන්න .

*අ. නි. I - තිකනිපාතය - පුග්ගලවර්ගය - 7 සූත්‍රය. (බු. ජ. මු.), පි. 236*

# සීලුද්දේස පාඨ....

**"කථඤ්ච මහානාම අරියසාවකෝ සීලසම්පන්නෝ හෝති: ඉධ මහානාම අරියසාවකෝ සීලවා හෝති. පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති ආචාරගෝචරසම්පන්නෝ, අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදේසු. ඒවං ඛෝ මහානාම අරියසාවකෝ සීලසම්පන්නෝ හෝති."**

මහානාමය, කි සෙයින් ආර්ය්‍යශ්‍රාවක සීලසම්පන්න වෙයි ද යත්? මහානාමය, මේ සස්නෙහි ආර්යශ්‍රාවක සිල්වත් වෙයි. ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවෘත වූයේ ආචාර ගෝචර දෙකින් යුක්ත වූයේ අණුමාත්‍ර වරදෙහි බිය දක්නා සුලු ව වෙසෙ යි, ශික්ෂා කොටසෙහි ඒ ඒ ශික්ෂාපදය දැඩි ව ගෙන හික්මෙ යි, මෙ සෙයින් මහානාමය, ආර්යශ්‍රාවක සීලසම්පන්න වූයේ වේ.

*මජ්ඣිම නිකාය II - සේඛ සූත්‍රය. (බු. ජ. මු.), පි. 30*

**"ආකඞ්ඛෙය්‍ය චේ භික්ඛවේ භික්ඛු 'සබ්‍රහ්මචාරීනං පියෝ චස්සං මනාපෝ ගරු භාවනීයෝ චා'ති සීලස්සේවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතෝසමථමනුයුත්තෝ අනිරාකතජ්ඣානෝ විපස්සනාය සමන්නාගතෝ බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං."**

මහණෙනි, මහණෙක් තෙමේ 'සබ්‍රහ්මසරුන්ට ප්‍රිය වූවෙක්, මන වඩන්නෙක්, ගරු කළ යුත්තෙක්, සම්භාවනීයයෙක් වන්නෙමි' යි කැමැති වන්නේ නම්, ශීලය ම සම්පූර්ණ කරන්නේ ස්වකීය චිත්තසමථයෙහි එක්වන් යෙදුණේ බැහැර නො කළ හෝ නො නැසූ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් යුක්ත වූයේ ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

*මජ්ඣිම නිකාය I - ආකඞ්ඛෙය්‍ය සූත්‍රය. (බු. ජ. මු.), පි. 74*

# සීලුද්දේස පාඨ....

**"සෙයෙ‍්‍යා අයෝගුළෝ භුත්තෝ තත්තෝ අග්ගිසිඛූපමෝ,**
**යඤ්චේ භුඤ්ජෙය්‍ය දුස්සීලෝ රට්ඨපිණ්ඩං අසඤ්ඤතෝ'ති."**

කාය වාක් සංයමය නැති දුශ්ශීලයෙක් යම් හෙයකින් රටවැසියා දුන් අහර වළඳන්නේ වේ ද, ඔහු විසින් රත් කළ ගිනිසිළක් බඳු වූ ලෝ ගුළියක් වළඳන ලද්දේ නම් එයට වඩා උතුම් වේ.

*ඛුද්දක නිකාය I - ආපායික සූත්‍රය. (බු. ජ. මු.), පි. 374*

**"පරිපුණ්ණසේඛං අපහානධම්මං**
**පඤ්ඤුත්තර ජාතිඛයන්තදස්සිං**
**තං වේ මුනිං අන්තිමදේහධාරිං**
**මානං ජහං බ්‍රෑමි ජරාය පාරගුං."**

නිවණ දක්නා සුලු වූ, අන්තිම සිරුර දරන්නා වූ, මානය දුරු කළා වූ ජරාවේ පරතෙරට ගියා වූ ඒ මුනි තෙමේ සම්පූර්ණ ශික්‍ෂා ඇත්තේ යැයි ද, අකොප්‍ය (අවිකාර්ය) ධර්ම ඇත්තේ යැයි ද, ප්‍රඥාව ශ්‍රේෂ්ඨ කොට ඇත්තේ යැයි ද කියමි.

*ඛු. නි. I - සික්ඛානිසංස සූත්‍රය. (බු. ජ. මු.), පි. 370*

**"යථාපි චන්දෝ විමලෝ ගච්ඡං ආකාසධාතුයා**
**සබ්බේ තාරා ගණේ ලෝකේ ආභාය අතිරෝචති,**
**තථේව සීලසම්පන්නෝ සද්ධෝ පුරිසපුග්ගලෝ**
**සබ්බේ මච්ඡරිනෝ ලෝකේ චාගේන අතිරෝචති."**

යම් සේ නිර්මල චන්ද්‍රයා අහසින් යනුයේ ලොව හැම තරු කැලන් සිය එළියෙන් බබලනවාද එ සෙයින් සිල් සපන් සැදැහැති පුරුෂ පුද්ගලයා ලොව හැම මසුරන් ත්‍යාගයෙන් අභිබවා බබලන්නේ වෙයි.

*අ. නි. III - පඤ්චකනිපාතය - සුමනාවර්ගය - සුමනා සූත්‍රය. (බු. ජ. මු.), පි. 52*

# මහණකම ගැන කිවූ රුවන් වැකි ...

"භික්ෂු ජීවිතය රට ගම ජාතිය ආදිය හා නො බැඳුණු නිදහස් සැහැල්ලු පැවැත්මක් බවත්, සිඟමනෙන් යැපෙමින් හැම රටෙහි ම හැම ජාතියෙහි ම හැමට ම පොදු සම මෛත් සිතින් ධර්ම සංග්‍රහ මාත්‍රයක් යම් බැඳීමක් නැති ව කරන්නට පමණක් ඉඩ ඇති, ලෝකයාගෙන් වෙන් වූ එකක් බවත් නිතර සිහියේ තබාගත යුතු ය."

-පැළෑණේ සිරි වජිරඤාණ මහානාහිමි-

"ස්ථාන රැකීමේ අදහස් මා තුළ නො වැඩේවා! පුද්ගලයන්ගේ අධ්‍යාත්මික දියුණුවට මාගෙන් උපකාර ලැබේවා! මා කෙරෙන් නිකුත්වන භූස්මටික ද අනුන්ගේ අධ්‍යාත්මික දියුණුවට උපකාර වේවා! පිරිසේ දියුණුව අධ්‍යාත්මික දියුණුවයි. මේ දියුණුව නො සැළසෙතොත් මා මෙහි වසන්නේ කුමකට ද? මේ ස්ථාන කුමකට ද? මේ උපස්ථාන කුමකට ද?"

"බුදු සසුන් වැඩ පිළිවෙළ ඇරඹුණේ බාහිර උපකරණයන් දියුණු කර ගැනීමට නො වේ. අධ්‍යාත්මික ගුණ දියුණුව ප්‍රධාන කරගෙන ය. සංසාරයේ දී කොතෙකුත් බාහිර උපකරණ ලැබෙන්නට ඇත. ඒවා විඳින්නට ඇත."

-මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන්-

"මහණකම හොඳින් කළොත් නිවන - මහණකම වරදවා කළොත් නිරය"

"මේ සා දිගු කලෙක යටගියාව සිහි කරන මට ඇති වන්නේ සතුටකි. මගේ මහණකම ගැන පසුතැවීමක් මට නැත. මගේ ජීවිතයේ වැඩිකලක් පාරට ම ගෙවී ඇතත් එහි ලා පරාර්ථචර්යාවක් දකින මට සතුටක් ඇතිවෙයි."

-මඩිහේ පඤ්ඤාසීහ මහානාහිමි-

# මහණකම ගැන කිවූ රුවන් වැකි ...

"දීර්ඝ සංසාරයේ අපි නොයෙක් දේ හැදුවෙමි. අපේ සංසාර ගමන නවතා ගැනීමට ඒ හැදූ බාහිර කිසිවකින් පිහිටක් වූයේ නැත. අද බුදු සසුන පිහිට කරගෙන අප විසින් හදාගත යුතු එකම දේ අපේ සිත ය. හිත හැදීම අමතක කර බාහිර දේවල් හදන්නට යාමෙන් අපට සිදුවන්නේ කෙලෙස් මරුගේ දැලට හසුවීම ය. සසර දුකට ම තල්ලු වී යාම ය. සසුන නම් හිත හැදීමේ නො වරදින වැඩ පිළිවෙළකි."

-කඩවැද්දුවේ සිරි ජිනවංශ මාහිමිපාණන්-

"පැවිද්ද වනාහි මිනිස් දිවිය ලද කෙනෙක් හට විඳින්නට ලැබෙන්නා වූ උසස් ම සුවය යි."

"බුදුසසුනෙහි පැවිදි උපසපන් බැව් ලබන්නට යම් කිසිවකුට භාග්‍ය ලැබේ නම් ඒ ලැබීම උත්තරීතර ලැබීමකි. ඒ බව තේරුම් ගත හැකි පුණ්‍යවන්තයන්ට පැවිදි වූවාට පසු 'අහෝ සුඛං අහෝ සුඛං' (අනේ සැපයි, අනේ සැපයි) කියා හිත හිතා සතුට ඇති ව විසිය හැකි ය."

-වැලිගම ශ්‍රී ඤාණරතන මහානාහිමි-

"ඔය නම්ලා ශික්ෂාගරුත්වය ඇති ව මේ ප්‍රතිපත්ති ශාසනය ම ඔසොවා තබන්නට උත්සාහ කරන්න ඕනෑ, හැම පැත්තෙ ම අඳුරු බවක්, පිරිහෙන බවක් පේනවා. බුද්ධ වචනය හොඳට ඉගෙනගෙන මහජනතාවට නියම මාර්ගය පෙන්වන්න ඉන්නේ ඔය නම්ලා. ඔය නම්ලාටත් පිහිටක් සලසාගෙන අසරණ ලෝකයටත් පිහිටක් සලසන්න ඕනෑ. ශාසනයට වැඩ කරන තව හොඳ පිරිසක් ඔය නම්ලාත් හදන්න ඕනෑ. පමා වෙන්න හොඳ නැහැ."

"ආශ්චර්ය නම් පැවිදි වී ඊට ඇලුම් ඇති ව ගුණ පිරීම යි ස්වභාවය නම් පැවිද්ද හැර යාම යි"

-අම්පිටියේ ශ්‍රී රාහුළ නායක මාහිමිපාණන්-

# මහණකම ගැන කිවූ රුවන් වැකි ...

"මම මහණ වූ දා පටන් ගුරු සෙවනෙහිම යි කටයුතු කළේ. ගුරු ඇසුරෙන් වෙන් ව විසීමට මට යම් යම් කරුණු ආවත් මම ඒවාට ඉදිරිපත් නො වී අඛණ්ඩව ගුරු ඇසුරෙහි ම වැඩ සිටියා. අද කාලේ තනිව විසීම අසීරු කටයුත්තක්. බොහෝ ගුරු අණ නො තකා තනිව කටයුතු කරන්න ගිහිං විනාශ වෙනවා. ඒ නිසා ගුරු ඇසුරෙහි ම තම ජීවිත ගත කරන්න උත්සාහගන්න ඕන. ඒක ඉතා වටිනා දෙයක්."

-නාඋයනේ අරියධම්ම අනුනායක මාහිමිපාණන්-

"කම් සුව අපේක්ෂා නො කර කාමාස්වාදයේ ආදීනවයෙන් මිදීමට වෑර වැඩීම පැවිදි බවේ ප්‍රකට ලක්ෂණය ය."

"ප්‍රිය ආයුෂ්මතුනි, මහණ කම කියන්නේ බාධා පැමිණෙන දෙයක්. ඒ නිසා හැමදාම පිණ්ඩපාතේ වඩින්න. ත්‍රිපිටකය හොඳින් උගෙන, පාලි - සිංහල භාෂාවන්හි ප්‍රවීණයකු වන්න. හොඳින් භාවනාවෙහි යෙදී දුක් කම්කටුළු බාධාවනට නො සැලෙන හිතක් හදාගන්න."

-ගංගොඩවිල සෝම හිමි-

"භික්ෂුවට රට ජාතියට පෙරාතුව රැක ගැනීමට ඇත්තේ ධර්මය හා විනය යි. එම කාරණය මත පිහිටා භික්ෂුව කටයුතු කළ යුතු වේ. එය භික්ෂු ගෞරවයට හා ශාසනයේ චිරස්ථිතියට වැදගත් ය. රටත් ජාතියත් ශාසනයත් ආරක්‍ෂා වුණේ භික්ෂුව ගේ ආධ්‍යාත්ම පාලනයෙන් මිස භික්ෂු දේශපාලනයෙන් නො වන බව ඓතිහාසික සත්‍යයෙකි."

-තිරිකුණාමලේ ආනන්ද මහානාහිමි-

## බුදුරජාණන් වහන්සේ සිකපද පැනවීමට හේතු වූ කරුණු දසය...

**01. සඞ්ඝසුට්ඨුතාය** - (සංඝයාගේ මනා පිළිගැනුම සඳහා ය.)

**02. සඞ්ඝඵාසුතාය** - (සංඝයාගේ පහසු බව සඳහා ය.)

**03. දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය** - (දුසිල් පුඟුලනට නිගැන්ම සඳහා ය.)

**04. පේසලානං භික්ඛූනං ඵාසුවිහාරාය** - (සුසිල් මහණුන්ගේ පහසු විසුම සඳහා ය.)

**05. දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය** - (මෙලෝ ගැහැට වැළකීම සඳහා ය.)

**06. සම්පරායිකානං ආසවානං පටිඝාතාය** - (පරලෝ ගැහැට වැළකීම සඳහා ය.)

**07. අප්පසන්නානං පසාදාය** - (නො පැහැදුණවන්ගේ පැහැදීම සඳහා ය.)

**08. පසන්නානං භියෙ‍්‍යාභාවාය** - (පැහැදුණවුන්ගේ අයිරා (තව තවත්) පැහැදීම සඳහා ය.)

**09. සද්ධම්මට්ඨිතියා** - (සසුන් පැවැත්ම සඳහා ය.)

**10. විනයානුග්ගහාය** - (විනයට රැකුල් දීම සඳහා ය.)

*පාචිත්තියපාළි - භික්ඛු විභඞ්ගය. (බු.ජ.මු.), පි. 04*

# ඕවාදපාතිමොක්ඛං

**සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා**
**සචිත්තපරියෝදපනං - ඒතං බුද්ධානසාසනං**

**ඛන්තී පරමං තපෝ තිතික්ඛා**
**නිබ්බාණං පරමං වදන්ති බුද්ධා**
**න හි පබ්බජිතෝ පරූපඝාතී**
**සමණෝ හෝති පරං විහේඨයන්තෝ**

**අනූපවාදෝ අනූපඝාතෝ - පාතිමොක්ඛේ ච සංවරෝ**
**මත්තඤ්ඤුතා ච භත්තස්මිං - පන්තඤ්ච සයනාසනං**
**අධිචිත්තේ ච ආයෝගෝ - ඒතං බුද්ධානසාසනං**

❀ ❀ ❀

## ඕවාද ප්‍රාතිමෝක්ෂය

සියලු පව් නො කිරීම ද නිතර කුසල් දහම් වැඩීම ද තම සිත දමනය කිරීම ද සියලු බුදුරජාණන් වහන්සේලා ගේ අනුශාසනාව යි.

ඉවසීම උතුම් ම තපස යි, නිවන පරම සුවය යි, අනුන්ව නසන්නා පැවිද්දකු නො වේ, අනුන් ව වෙහෙසන්නා, ශ්‍රමණයෙක් නො වේ.

අනුන්ට උපවාද නො කිරීම ද අනුන් ව ඝාතනය නො කිරීම ද ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙහි හික්මීම ද ආහාරයෙහි පමණ දැන වැළඳීම ද ප්‍රාන්ත සෙනසුන්හි වාසය කිරීම ද සමථ විදර්ශනා වැඩීම ද සියලු බුදුරජාණන් වහන්සේලා ගේ අනුශාසනාව යි.

❀ ❀ ❀

# සඞ්ඝුපෝසථස්ස පුබ්බකරණාදි විධි

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

**විනය පුච්ඡා සම්මුති :-**

සුණාතු මේ භන්තේ සඞ්ඝෝ, යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං....(ථේරං/භික්ඛුං) විනයං පුච්ඡෙය්‍යං.

**විනය විස්සජ්ජනසම්මුති :-**

සුණාතු මේ භන්තේ සඞ්ඝෝ, යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මතා.... (ථේරේන/ භික්ඛුනා) විනයං පුට්ඨෝ විස්සජ්ජෙය්‍යං.

**පුච්ඡා :-**

සම්මජ්ජනී පදීපෝ ච - උදකං ආසනේන ච
උපෝසථස්ස ඒතානි - පුබ්බකරණන්ති වුච්චති.

ඕකාස! සම්මජ්ජනී සම්මජ්ජනකරණං කතං කිං?

**විස්සජ්ජන :-**

සම්මජ්ජනකරණං නිට්ඨිතං.

**පුච්ඡා :-**

පදීපෝ ච, පදීපුජ්ජලනං කතං කිං?

**විස්සජ්ජන :-**

පදීපුජ්ජලනං නිට්ඨිතං./ ඉදානි පන සුරියාලෝකස්ස අත්ථිතාය පදීපකිච්චං ඉධ නත්ථි.

**පුච්ඡා :-**

උදකං ආසනේන ච, ආසනේන සහ පානීයපරිභෝජනීය-උදකට්ඨපනං කතං කිං?

**විස්සජ්ජන :-**

ආසනේන සහ පානීයපරිභෝජනීයඋදකට්ඨපනං නිට්ඨිතං.

# සංඝ උපෝසථයේ පූර්වකරණ ආදි විධි.

## ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!

**විනය ප්‍රශ්න විචාරීමේ සම්මුතිය :-**
ස්වාමීනි! සංඝතෙමේ මාගේ කීම අසාවා. ඉදින් සංඝයාට ප්‍රාප්ත කාලය වී නම් මම ආයුෂ්මත්.... (තෙරුන් වහන්සේගෙන්/ භික්ෂුවගෙන්) විනය විචාරන්නෙමි.

**විනය ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීමේ සම්මුතිය :-**
ස්වාමීනි! සංඝතෙමේ මාගේ කීම අසාවා. ඉදින් සංඝයාට ප්‍රාප්ත කාලය වී නම් මම ආයුෂ්මත්.... (තෙරුන් වහන්සේ විසින්/භික්ෂුව විසින්) විනය විමසන ලද්දේ විසඳන්නෙමි.

**ප්‍රශ්න විචාරීම :-**
ඇමදීම ද, පහන් දැල්වීම ද, ආසන පැනවීම සමග පැන් තැබීම ද යන ඒවා උපෝසථයේ පූර්වකරණ යැයි කියනු ලැබේ.

අවසරයි! ඇමදීම, කෙසේ ද? ඇමදීම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
ඇමදීම නිමා කරන ලදී.

**ප්‍රශ්න විචාරීම :-**
පහන් දැල්වීම, කෙසේ ද? පහන් දැල්වීම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
පහන් දැල්වීම සිදු කරන ලදී./ දැන් සූර්යාලෝකය ඇති බැවින් පහන් දැල්වීමක් මෙහි නොමැත.

**ප්‍රශ්න විචාරීම :-**
අසුන් පැනවීම සමග පැන් තැබීම, කෙසේ ද? ආසන පැනවීම සමග පානය කළ යුතු පරිභෝග කළ යුතු පැන් තැබීම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
අසුන් පැනවීම සමග පානය කළ යුතු පරිභෝග කළ යුතු පැන් තැබීම නිමා කරන ලදී.

**පුච්ඡා :-**
උපෝසථස්ස ඒතානි පුබ්බකරණන්ති වුච්චති කිං?

**විස්සජ්ජන :-**
ඒතානි චත්තාරි වත්තානි සම්මජ්ජනකරණාදීනි සඞ්ඝසන්නිපාතතෝ පඨමං කත්තබ්බත්තා, උපෝසථස්ස, උපෝසථකම්මස්ස පුබ්බකරණන්ති වුච්චති. පුබ්බකරණානීති අක්ඛාතානි.

**පුච්ඡා :-**
ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං - භික්ඛුගණනා ච ඕවාදෝ,
උපෝසථස්ස ඒතානි - පුබ්බකිච්චන්ති වුච්චති.

ඡන්දපාරිසුද්ධි, ඡන්දාරහානං භික්ඛූනං ඡන්දපාරිසුද්ධි ආහරණං කතං කිං?

**විස්සජ්ජන :-**
ඡන්දපාරිසුද්ධි ආහරණං ඉධ නත්ථි./ ඡන්දපාරිසුද්ධි ආහරණං නිට්ඨිතං.

**පුච්ඡා :-**
උතුක්ඛානං, හේමන්තාදීනං තිණ්ණං උතූනං එත්තකං අතික්කන්තං, එත්තකං අවසිට්ඨන්ති. ඒවං උතු ආචික්ඛනං කතං කිං?

**විස්සජ්ජන :-**
උතූනීධ පන සාසනේ හේමන්තගිම්හවස්සානානං වසේන තීණි හොන්ති. අයං.........උතු, අස්මිං උතුම්හි අට්ඨ/දස උපෝසථා, ඉමිනා පක්ඛේන ඒකෝ උපෝසථෝ සම්පත්තෝ, ....... (උපෝසථා අතික්කන්තා, /උපෝසථෝ අතික්කන්තෝ,) ...... (උපෝසථා අවසිට්ඨා./උපෝසථෝ අවසිට්ඨෝ.)

**පුච්ඡා :-**
භික්ඛුගණනා ච, ඉමස්මිං උපෝසථග්ගේ සන්නිපතිතානං භික්ඛූනං ගණනා, කිත්තකා භික්ඛූ හොන්ති?

**ප්‍රශ්න විචාරීම :-**
කුමක් නිසා ඒවා උපෝසථයෙහි පූර්වකරණ යැයි කියනු ලැබේ ද?

**පිළිතුරු ලබාදීම :-**
උපෝසථයෙහි ඇමදීම ආදී ඒ වත් සතර සංඝරත්නයේ පැමිණීමට පළමුව කළ යුතු බැවින් පොහොය කර්මයේ පූර්වකරණ යැයි කියනු ලැබේ. පූර්වකරණය යැයි කියන ලද්දාහු වෙත්.

**ප්‍රශ්න විචාරීම :-**
ඡන්ද පාරිශුද්ධිය ගෙන ඒම, ඍතුව කීම, භික්ෂූන් වහන්සේලා ගණන් කිරීම ද, අවවාද දීම ද යන ඒවා උපෝසථයෙහි පූර්ව කෘත්‍ය යැයි කියනු ලැබේ.

ඡන්ද පාරිශුද්ධිය, කෙසේ ද? ඡන්දය දීමට සුදුසු භික්ෂූන්ගේ ඡන්ද පාරිශුද්ධිය ගෙන ඒම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
ඡන්ද පාරිශුද්ධිය ගෙන ඒමක් මෙහි නොමැත./ ඡන්ද පාරිශුද්ධිය ගෙන ඒම නිම කරන ලදී.

**ප්‍රශ්න විචාරීම :-**
ඍතු කීම, කෙසේ ද? හේමන්ත ආදී ඍතු තුනට අනුව මෙ පමණක් ඉක්ම ගියේ, මෙ පමණක් ශේෂ වූයේ යැයි මෙසේ ඍතුව කීම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
මේ ශාසනයෙහි හේමන්ත, ගිම්හාන, වස්සාන වශයෙන් ඍතු තුනක් වෙත්; මේ ......... ඍතුවයි; මේ ඍතුවෙහි අටක් වූ/දහයක් වූ උපෝසථයෝ වෙත්; මෙම පක්ෂයෙන් එක් පොහොයක් පැමිණියේ වෙයි; ....... (උපෝසථ ඉක්ම ගිය හ; /උපෝසථයක් ඉක්ම ගියේ ය;) ...... (උපෝසථ ශේෂ වූහ./උපෝසථයක් ශේෂ වූයේ ය.)

**ප්‍රශ්න විචාරීම :-**
භික්ෂූන් ගණන් කිරීම, මෙම පොහොය ගෙහි රැස්වූ භික්ෂූන්ගේ ගණනින් කොපමණ භික්ෂූහු වෙත් ද?

**විස්සජ්ජන :-**

**ඉමස්මිං උපෝසථග්ගේ සන්නිපතිතානං භික්ඛූනං ගණනා ..... භික්ඛූ හොන්ති.**

**පුච්ඡා :-**

ඕවාදෝ, භික්ඛුණීනං ඕවාදෝ දාතබ්බෝ දින්නෝ කිං?

**විස්සජ්ජන :-**

ඉදානි පන තාසං නත්ථිතාය සෝ ච ඕවාදෝ ඉධ නත්ථි.

**පුච්ඡා :-**

උපෝසථස්ස ඒතානි පුබ්බකිච්චන්ති වුච්චති කිං?

**විස්සජ්ජන :-**

ඒතානි පඤ්චකම්මානි ඡන්දාහරණාදීනි පාතිමොක්ඛුද්දේසතෝ පඨමං කත්තබ්බත්තා උපෝසථස්ස, උපෝසථකම්මස්ස පුබ්බකිච්චන්ති වුච්චති. පුබ්බකිච්චානීති අක්ඛාතානි.

**පුච්ඡා :-**

උපෝසථෝ යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා සභාගාපත්තියෝ ච, න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති.

උපෝසථෝ, තීසු උපෝසථ දිවසේසු චාතුද්දසීපණ්ණරසී-සාමග්ගීසු අජ්ජුපෝසථෝ කෝ උපෝසථෝ?

**විස්සජ්ජන :-**

අජ්ජුපෝසථෝ (පණ්ණරසෝ./ චාතුද්දසෝ.)

**පුච්ඡා :-**

යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තාති කිං?

**විස්සජ්ජන :-**

යත්තකා භික්ඛූ තස්ස උපෝසථකම්මස්ස, පත්තා යුත්තා අනුරූපා, සබ්බන්තිමේන පරිච්ඡේදේන චත්තාරෝ භික්ඛූ පකතත්තා. සඞ්ඝේන අනුක්ඛිත්තා, තේ ච ඛෝ හත්ථපාසං අවිජහිත්වා ඒකසීමායං ඨිතා.

**පිළිතුරු ලබාදීම :-**

මෙම පොහොය ගෙහි රැස්වූ භික්ෂූන්ගේ ගණනින් භික්ෂූන් වහන්සේලා ...... නමක් වෙත්.

**ප්‍රශ්න විචාරීම :-**

අවවාද දීම, කෙසේ ද? කිම භික්ෂුණීන්ට දිය යුතු අවවාද දෙන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**

දැන් වනාහී අදාළ නොමැති බැවින් ඒ අවවාද දීමක් මෙහි නැත.

**ප්‍රශ්න විචාරීම :-**

කුමක් නිසා ඒවා උපෝසථයෙහි පූර්වකරණ යැයි කියනු ලැබේ ද?

**පිළිතුරු ලබාදීම :-**

උපෝසථයෙහි ඒ ඡන්දය රැගෙන ඒම ආදී ක්‍රියා පහ පාමොක් උදෙසීමට පළමුව කළ යුතු බැවින්, උපෝසථ කර්මයේ පූර්ව කෘත්‍ය යැයි කියනු ලැබේ. පූර්ව කෘත්‍යයෝ යැයි කියන ලද්දාහු වෙති.

**ප්‍රශ්න විචාරීම :-**

පොහොය දිනය ද, පැමිණිය යුතු යම්තාක් භික්ෂූන් වහන්සේලා පොහොය කර්මයට පැමිණියාහු ද, සමාන ඇවැත් කිසිවක් විද්‍යමාන නො වෙත් ද, බැහැර කළ යුතු පුද්ගලයන් පොහොය ගෙයි නො වෙත් ද, එවිට එය පොහොය කර්මයට පැමිණි කල් ඇත්තේ යැයි කියනු ලැබේ.

චාතුද්දසී, පණ්ණරසී, සාමග්‍රී යන උපෝසථ දින තුන අතුරින් අද උපෝසථය කවර උපෝසථයක් ද?

**පිළිතුරු ලබාදීම :-**

අද (පණ්ණරසී/ චාතුද්දසී) පොහොයකි.

**ප්‍රශ්න විචාරීම :-**

කිමෙක් ද? පැමිණිය යුතු යම්තාක් භික්ෂූන් වහන්සේලා පොහොය කර්මයට පැමිණියාහූ ද?

**පිළිතුරු ලබාදීම :-**

යම් පමණ භික්ෂූන් වහන්සේලා ඒ උපෝසථ කර්මයට පැමිණියාහූ ද, ඇතුළත් වූවාහූ ද, ගැළපුනාහූ ද, යටත් පිරිසෙයින් භික්ෂූන් වහන්සේලා සතර නමක්වත් ප්‍රකෘති භික්ෂූහූ වෙත් ද, සංඝයා විසින් උක්ෂේපණීය කර්මය නො කරන ලද්දාහූ වෙත් ද, ඒ භික්ෂූන් වහන්සේලා ද අත්පසින් බැහැර නො වී එක සීමාවක වැඩ සිටියාහූ වෙත්.

**පුච්ඡා :-**
සභාගාපත්තියෝ ච න විජ්ජන්ති කිං?

**විස්සජ්ජන :-**
විකාලභෝජනාදී වත්ථුසභාගාපත්තියෝ ච න විජ්ජන්ති.

**පුච්ඡා :-**
වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති කිං?

**විස්සජ්ජන :-**
ගහට්ඨපණ්ඩකාදයෝ ඒකවීසති වජ්ජනීයපුග්ගලා හත්ථපාසතෝ බහිකරණවසේන වජ්ජේතබ්බා. තේ අස්මිං න හොන්ති.

**පුච්ඡා :-**
පත්තකල්ලන්ති වුච්චති කිං?

**විස්සජ්ජන :-**
සඞ්ඝස්ස උපෝසථකම්මං ඉමෙහි චතූහි ලක්ඛණේහි සඞ්ගහිතං පත්තකල්ලන්ති වුච්චති. පත්තකාලවන්තන්ති අක්ඛාතං. පුබ්බකරණපුබ්බකිච්චානි සමාපෙත්වා දේසිතාපත්තිකස්ස සමග්ගස්ස භික්ඛුසඞ්ඝස්ස අනුමතියා පාතිමොක්ඛං උද්දිසිතුං ආරාධනං කරෝමි.

**සාධූ ! සාධූ !! සාධූ !!!**

**පුබ්බකරණාදි විධි සමත්තා.**

**ප්‍රශ්න විචාරීම :-**
කිමෙක් ද? සමාන ඇවැත් විද්‍යමාන නො වෙත් ද?

**පිළිතුරු ලබාදීම :-**
විකාල භෝජන ආදී සමාන වස්තු සහිත ඇවැත් විද්‍යමාන නො වෙත්.

**ප්‍රශ්න විචාරීම :-**
කිමෙක් ද? බැහැර කළ යුතු පුද්ගලයින් පොහොය ගෙයි නො වෙත් ද?

**පිළිතුරු ලබාදීම :-**
ගිහි, පණ්ඩක ආදී එක් විසි වජ්ජනීය පුද්ගලයෝ අත්පසින් බැහැර කිරීම් වශයෙන් බැහැර කළ යුත්තාහු, ඔවුහු මෙහි නො වෙත්.

**ප්‍රශ්න විචාරීම :-**
කුමක් හෙයින් පැමිණි කල් ඇත්තේ යැයි කියනු ලැබේ ද?

**පිළිතුරු ලබාදීම :-**
සංඝයාගේ උපෝසථ කර්මය මෙම ලක්ෂණ සතරින් සංග්‍රහ වූයේ ප්‍රාප්ත කාලය යැයි කියනු ලැබේ. පොහොය කිරීමට සුදුසු කාලය (පැමිණියේ) වූයේ යැයි කියන ලදී.

පූර්වකරණ, පූර්ව (කෘත්‍ය) කෘත්‍යයෝ නිමා කොට, දෙසන ලද ආපත්ති ඇති සමගි භික්ෂු සංඝයා වහන්සේලාගේ අනුමැතියෙන් පාමොක් උදෙසීමට ආරාධනා කරමි.

**සාධූ ! සාධූ !! සාධූ !!!**

**පූර්වකරණ ආදී විධි සමාප්තයි.**

# නමස්සමානෝ විනයං...

"සත්ථුකප්පං සුවිනයං
ධාරේමි හදයේන'හං
නමස්සමානෝ විනයං
විහරිස්සාමි සබ්බදා"

බුදුරජාණන් වහන්සේ වැනි වූ සුන්දර වූ විනය පිටකය මම හදයෙන් දරමි. හැම කල්හි විනයට නමස්කාර කරමින් වසන්නෙමි.

***ඛු.නි. - අපදානපාළිය - උපාලි ස්ථවිරාවදානය. (බු.ජ.මු.), පි. 86***

# භික්ඛුපාතිමොක්ඛපාළි

සැ.යු:- ආධුනිකයනට කියවීම සහ උසුරු වීම පහසු ව පිණිස ශුද්ධ මාගධි භාෂාව සිංහල අක්ෂර වලින් ලිවීමේ දී හල් අකුරු භාවිතා කරන ලදී. සන්ධි සහ සමාස වන තැන් එලෙස ම දක්වා ඇත.

# නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අජ්ජුපොසථො (පණ්ණරසො/ චාතුද්දසො), යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො උපොසථං කරෙය්‍ය, පාතිමොක්ඛං උද්දිසෙය්‍ය. කිං සඞ්ඝස්ස පුබ්බකිච්චං? පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ, පාතිමොක්ඛං උද්දිසිස්සාමි. තං සබ්බෙව සන්තා සාධුකං සුණොම මනසිකරොම. යස්ස සියා ආපත්ති, සො ආවිකරෙය්‍ය. අසන්තියා ආපත්තියා තුණ්හී භවිතබ්බං. තුණ්හීභාවෙන ඛො පනායස්මන්තෙ පරිසුද්ධාති වෙදිස්සාමි.

යථා ඛො පන පච්චෙකපුට්ඨස්ස වෙය්‍යාකරණං හොති, එවමෙවං එවරූපාය පරිසාය යාවතතියං අනුසාවිතං හොති. යො පන භික්ඛු යාවතතියං අනුසාවියමානෙ, සරමානො සන්තිං ආපත්තිං නාවිකරෙය්‍ය, සම්පජානමුසාවාදස්ස හොති. සම්පජානමුසාවාදො ඛො පනායස්මන්තො අන්තරායිකො ධම්මො වුත්තො භගවතා. තස්මා සරමානෙන භික්ඛුනා ආපන්නෙන විසුද්ධාපෙක්ඛෙන සන්ති ආපත්ති ආවිකාතබ්බා, ආවිකතා හිස්ස ඵාසු හොති.

# ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!

ස්වාමීනි! සංඝ තෙමේ මාගේ කීම අසාවා. අද (පණ්ණරසී/ චාතුද්දසී) පොහොය දවසයි. ඉදින් සංඝයාට කාලය පැමිණියේ නම් සංඝ තෙමේ පොහොය කරන්නේ ය. පාමොක් උදෙසන්නේ ය. සංඝයාගේ පූර්වකෘත්‍යය[1] කිමෙක් ද? ආයුෂ්මත්වරුනි! පිරිසිදු බව ප්‍රකාශ කරවු. පාමොක් උදෙසන්නෙමි. ඒ පාමොක් මේ පිරිසෙහි වූ අපි සියලු දෙන ම මනා කොට අසමු. මෙනෙහි කරමු. යමෙකුට ඇවැතක් වේ නම්, හෙතෙම එය කියන්නේ ය. ඇවැතක් නැති කල්හි නිහඬ විය යුතු ය. නිහඬ බවින් ආයුෂ්මතුන් වහන්සේලා පිරිසිදු වූවහු යැයි දනගන්නෙමි.

යම් සේ වනාහි වෙන වෙන ම අසන ලද්දහුගේ ඇසූ දේට පිළිතුරු දීමක් වේ ද? එසේ ම එබඳු පිරිසෙක්හි තුන්යල දක්වා අස්වන ලද්දේ වේ. යම් භික්ෂුවක් තුන්යල දක්වා ඇස්වීම කරනු ලබන කල්හි තමා තුළ ඇති ඇවැත සිහිකරමින් නො කියන්නේ ද, ඔහුට සම්පජානමුසාවාද[2] ඇවැත සිදුවේ. ආයුෂ්මත්වරුනි! සම්පජානමුසාවාදය අන්තරායකර ධර්මයකැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද සේක. එහෙයින් ඇවැතට පත්වූ, එය සිහිකරන්නාවූ, පිරිසිදු බව බලාපොරොත්තු වන භික්ෂුව විසින් තිබෙන ඇවැත් ප්‍රකාශ කළ යුත්තාහ. එසේ ප්‍රකාශ කිරීම හේතු කොටගෙන ඒ භික්ෂුවට පහසු භාවය වෙයි.

1. පොහොය කර්මයට පූර්වයෙන් කළ යුතු ''සීමාව'' හැමදීම් ආදී කටයුතු.
2. මෙහිලා දන දන බොරු කීමෙහි දුකුලාවක් වේ.

උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං. තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

නිදානුද්දෙසො පඨමො.

## (1) පාරාජිකා ධම්මා

තත්‍රිමෙ චත්තාරො පාරාජිකා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. යො පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, අන්තමසො තිරච්ඡානගතායපි, පාරාජිකො හොති අසංවාසො.

2. යො පන භික්ඛු ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියෙය්‍ය, යථාරූපෙ අදින්නාදානෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා;

ආයුෂ්මත්වරුනි! නිදානය උදෙසන ලදී.
එහි ලා ආයුෂ්මතුන් වහන්සේලා විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
දෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
තෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?

මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධය හ. නිහඬ එබැවිනි. 'මෙසේ මෙය ධරමි' යැයි

## පළමුවැනි නිදාන උද්දේසය යි.

# (1) පාරාජිකා ධර්මයෝ

විනයෙහි මේ සතරක් වූ පාරාජික ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1. යම් භික්ෂුවක් වනාහි භික්ෂූන්ගේ අධිශීල සංඛ්‍යාත ශික්ෂාවට හා පනවන ලද සිකපදයන්හි හික්මීමට (සාජීවයට) පැමිණියේ ශික්ෂාව ප්‍රතික්ෂේප නො කර, සාජීවයෙහි දුර්වල බව ප්‍රකාශ නො කර, යටත් පිරිසෙයින් තිරිසන් ගත ස්ත්‍රියක් සමග හෝ[1] මෛථුන්දම් සේවනය කරන්නේ නම් පරිජි වූයේ ප්‍රකෘති භික්ෂූන් සමග සංවාස රහිත වූයේ වෙයි.

2. යම් භික්ෂුවක් වනාහි නුදුන් වස්තුවක් ගමෙන් හෝ වනයෙන් හෝ සොරසිතින් ගන්නේ වෙයි ද, යම්බඳු වූ නො දුන් වස්තුවක් ගැනීමෙහි රජවරු සොරා අල්ලාගෙන ''සොරෙක් හි, බාලයෙක් හි, මුලා වූවෙක් හි, සොරකමක් කළෙහි'' යැයි ඔහුව නසන්නේ වෙයි ද, සිරගත කරන්නේ

1. උපග්‍රන්ථය - II (අ) බලනු මැනවි.

චෝරෝසි බාලෝසි මූළ්හෝසි ථේනෝසීති, තථාරූපං භික්ඛු අදින්නං ආදියමානෝ, අයම්පි පාරාජිකෝ හෝති අසංවාසෝ.

3. යෝ පන භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වෝරෝපෙය්‍ය, සත්ථහාරකං වාස්ස පරියේසෙය්‍ය, මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය; අම්භෝ පුරිස, කිං තුය්හිමිනා පාපකේන දුජ්ජීවිතේන, මතන්තේ ජීවිතා සෙය්‍යෝති. ඉති චිත්තමනෝ චිත්තසඞ්කප්පෝ අනේකපරියායේන මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය මරණාය වා සමාදපෙය්‍ය, අයම්පි පාරාජිකෝ හෝති අසංවාසෝ.

4. යෝ පන භික්ඛු අනභිජානං උත්තරිමනුස්සධම්මං අත්තූපනායිකං අලමරියඤාණදස්සනං සමුදාචරෙය්‍ය; ඉති ජානාමි ඉති පස්සාමීති. තතෝ අපරේන සමයේන සමනුග්ගාහියමානෝ වා අසමනුග්ගාහියමානෝ වා ආපන්නෝ විසුද්ධාපෙක්ඛෝ ඒවං වදෙය්‍ය; අජානමේවං ආවුසෝ අවචං ජානාමි අපස්සං පස්සාමි, තුච්ඡං මුසා විලපින්ති, අඤ්ඤත්‍ර අධිමානා, අයම්පි පාරාජිකෝ හෝති අසංවාසෝ.

ද, රටින් නෙරපන්නේ වෙයි ද, එබඳු වූ නො දුන් වස්තුවක් සොරසිතින් ගන්නා භික්ෂු තෙමේ ද පරිජි වූයේ ප්‍රකෘති භික්ෂූන් සමග සංවාස රහිත වූයේ වෙයි.

3. යම් භික්ෂුවක් වනාහි දැන දැන මිනිස් සිරුරක් දිවියෙන් තොර කෙරේ ද, දිවි නැති කළ හැකි අවියක් හෝ එළවා තබා නම්, ''එම්බල පුරුෂය, කිම නුඹගේ මේ ළාමක දුක්බර ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද? නුඹට ජීවත් වීමට වඩා මරණය උතුම්''යැයි මරණයෙහි ගුණ හෝ වර්ණනා කරන්නේ ද, මරණයෙහි සමාදන් කරවන්නේ ද, මෙසේ මරණය පිළිබඳ සිත් ඇත්තේ මරණ සංකල්පනා ඇත්තේ නොයෙක් අයුරින් මරණයේ ගුණ කියයි ද, මරණයට අදාළ උපාය කියයි ද, මේ භික්ෂු තෙමේ ද පරිජි වූයේ ප්‍රකෘති භික්ෂූන් හා සංවාස රහිත වූයේ වෙයි.

4. යම් භික්ෂුවක් වනාහි තමා තුළ නො දන්නා වූ නො දක්නා වූ ආර්ය ඥාන දර්ශනයට යොග්‍ය වූ උතුරු මිනිස්දම් තමා කෙරෙහි එළවා ''මෙසේ දනිමි; මෙසේ දකිමි'' යැයි අධිමානයෙන් තොර ව[1] කියන්නේ ද, ඉන් පසු කලෙක විචාරනු ලබන්නේ හෝ නො විචාරනු ලබන්නේ හෝ පරිජි ඇවැතට පැමිණුනේ පිරිසිදු බැව් කැමැත්තේ ''ඇවැත්නි මම නො දන්නෙම් දනිමියි කීමි; නො දක්නෙම් දකිමියි හිස් බොරු කීමි'' යැයි මෙසේ කියන්නේ ය. මේ භික්ෂුව ද පරිජි වූයේ ප්‍රකෘති භික්ෂූන් හා සංවාස රහිත වූයේ වෙයි.

1. උතුරු මිනිස්දම් තමා කෙරෙහි ඇතැයි යන වැරදි වැටහීම්වලින් තොර ව.

උද්දිට්ඨා ඛෝ ආයස්මන්තෝ, චත්තාරෝ පාරාජිකා ධම්මා. යේසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා න ලභති භික්ඛූහි සද්ධිං සංවාසං. යථා පුරේ තථා පච්ඡා, පාරාජිකෝ හෝති අසංවාසෝ.

තත්ථායස්මන්තේ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
පරිසුද්ධෙත්ථායස්මන්තෝ තස්මා තුණ්හී, ඒවමේතං ධාරයාමීති.

පාරාජිකුද්දේසෝ දුතියෝ.

## (2) සඞ්ඝාදිසේසා ධම්මා

ඉමේ ඛෝ පනායස්මන්තෝ තේරස සඞ්ඝාදිසේසා ධම්මා උද්දේසං ආගච්ඡන්ති.

1. සඤ්චේතනිකා සුක්කවිසට්ඨි අඤ්ඤත්‍ර සුපිනන්තා සඞ්ඝාදිසේසෝ.

2. යෝ පන භික්ඛු ඕතිණ්ණෝ විපරිණතේන චිත්තේන මාතුගාමේන සද්ධිං කායසංසග්ගං

ආයුෂ්මත්වරුනි! සතර පරිජි ධර්මයෝ උදෙසන ලද්දාහු ය. භික්ෂුවක් එයින් යම් ඇවැතකට පත් වී භික්ෂූන් හා සංවාසයක් නො ලබයි. පෙර ගිහිකළ මෙන්ම අනුපසම්පන්න කාලයේ ද යම් සේ සංවාස රහිත වූයේ ද එසේම දනුදු පරිජි වූයේ ප්‍රකෘති භික්ෂූන් හා සංවාස රහිත වූයේ වෙයි.

එහි ලා ආයුෂ්මතුන් වහන්සේලා විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
දෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
තෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?

මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධය හ. නිහඬ එබැවිනි. 'මෙසේ මෙය ධරමි' යැයි

### දෙවෙනි පාරාජිකා උද්දේසය යි.

## (2) සංඝාදිසේස ධර්මයෝ

ඇවැත්නි! මේ සඟවෙසෙස් ධර්මයෝ දහතුන උදෙසීමට පැමිණෙත්.

1. සිහිනෙන් හැර දන දන ශුක්‍ර ධාතු මිදීමෙන් සඟවෙසෙස් වේ.

2. යම් භික්ෂුවක් වනාහි කාය සංසර්ග රාගයට බැසගත්තේ පෙරළී ගිය සිතින් මාගමක සමග කාය සංසර්යට

සමාපජ්ජෙය්‍ය, හත්ථගාහං වා වේණිගාහං වා අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අඞ්ගස්ස පරාමසනං සඞ්ඝාදිසේසො.

3. යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතේන චිත්තේන මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය, යථා තං යුවා යුවතිං මේථුනූපසංහිතාහි සඞ්ඝාදිසේසො.

4. යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතේන චිත්තේන මාතුගාමස්ස සන්තිකේ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසෙය්‍ය; ඒතදග්ගං භගිනි පාරිචරියානං, යා මාදිසං සීලවන්තං කල්‍යාණධම්මං බ්‍රහ්මචාරිං, ඒතේන ධම්මේන පරිචරෙය්‍යාති මේථුනූපසංහිතේන සඞ්ඝාදිසේසො.

5. යො පන භික්ඛු සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය, ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං, ජායත්තනේ වා ජාරත්තනේ වා අන්තමසො තඞ්ඛණිකායපි සඞ්ඝාදිසේසො.

6. සඤ්ඤාචිකාය පන භික්ඛුනා කුටිං කාරයමානේන අස්සාමිකං අත්තුද්දේසං පමාණිකා කාරේතබ්බා. තත්‍රිදං පමාණං; දීඝසො ද්වාදසවිදත්ථියො සුගතවිදත්ථියා, තිරියං

පැමිණියේ නම්, අත ගැනීම (අත් ඇල්ලීම) හෝ කෙස් ගැනීම හෝ යම් අඟපසඟ පිරිමැදීමක් හෝ කෙරේ නම් සඟවෙසෙස් වේ.

3. යම් භික්ෂුවක් වනාහි දුහුල් වචන[1] කියන රාගයට බැසගත්තේ පෙරළී ගිය සිතින් මිනිස් ස්ත්‍රියකට රහස් මාර්ග විෂය කරගත් මෛථුන් දම් සේවනය පිළිබඳව වූ අසභ්‍ය වචන වලින් කාමභෝගී තරුණයෙක් තරුණියකට කියන්නාක් මෙන් කථා කරයි නම් සඟවෙසෙස් වේ.

4. යම් භික්ෂුවක් වනාහි තමාට කාමයෙන් උවටැන් කරවා ගැනීමේ රාගයට බැසගත්තේ, පෙරළී ගිය සිතින් මිනිස් මාගමක් සමීපයෙහි ''නැගණිය, යම් ස්ත්‍රියක් මා බඳු සිල්වත් වූ, යහපත් ධර්ම ඇති, බ්‍රහ්මචාරීවූවකුට මෛථුන්දමින් උවටැන් කරන්නේ නම්, උවටැන් කිරීම් අතරින් මෙය ම (මෛථුන් දමින් උවටැන් කිරීම ම) අග්‍ර වේ''යැයි මෛථුන්දම් ප්‍රතිසංයුක්ත වචනයෙන් තමාට මෛථුන්දමින් උවටැන් කිරීමේ ගුණ කියන්නේ නම් සඟවෙසෙස් වේ.

5. යම් භික්ෂුවක් වනාහි අඹු බවෙහි හෝ සොර අඹු බවෙහි හෝ යටත් පිරිසෙයින් මොහොතක් වුවද සේවනය කරනු කැමතිව බිරිඳ වේව යි කියා හෝ පුරුෂයාගේ අදහස ස්ත්‍රියට හෝ ස්ත්‍රියගේ අදහස පුරුෂයාට හෝ ගෙන යමින් සඤ්චරණභාවයට[2] පැමිණේ නම් සඟවෙසෙස් වේ.

6. අනුන්ගෙන් ඉල්ලා ගත් උපකරණ ඇතිව[3] කරවා දෙන දායකයකු නැති, තමා උදෙසා කුටියක් කරවන භික්ෂුව විසින් ප්‍රමාණ සහිතව කරවිය යුතු වේ. එහි ලා මේ ප්‍රමාණය යි. දිගින් සුගත් වියතින් වියත් දොළොසක් ද, පළලින්

1. උපග්‍රන්ථය - II (ආ) බලනු මැනවි.
2. පණිවුඩ හුවමාරු කිරීම් ස්වභාවයට.
3. අනුන්ගෙන් ඉල්ලාගත් උපකරණ ඇතිව කරවන කුටිය සඤ්ඤාචිත කුටිය නම් වේ.

සත්තන්තරා. භික්ඛූ අභිනේතබ්බා වත්ථුදේසනාය, තේහි භික්ඛූහි වත්ථුං දේසේතබ්බං අනාරම්භං සපරික්කමනං. සාරම්භේ චේ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනේ සඤ්ඤාචිකාය කුටිං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදේසනාය, පමාණං වා අතික්කාමෙය්‍ය සඞ්ඝාදිසේසෝ.

7. මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානේන සස්සාමිකං අත්තුද්දේසං භික්ඛූ අභිනේතබ්බා වත්ථුදේසනාය. තේහි භික්ඛූහි වත්ථුං[1] දේසේතබ්බං අනාරම්භං සපරික්කමනං. සාරම්භේ චේ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනේ මහල්ලකං විහාරං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදේසනාය සඞ්ඝාදිසේසෝ.

8. යෝ පන භික්ඛු භික්ඛුං දුට්ඨෝ දෝසෝ අප්පතීතෝ, අමූලකේන පාරාජිකේන ධම්මේන අනුද්ධංසෙය්‍ය; අප්පේවනාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති. තතෝ අපරේන සමයේන සමනුග්ගාහියමානෝ වා අසමනුග්ගාහියමානෝ වා අමූලකඤ්චේව තං අධිකරණං හෝති, භික්ඛු ච දෝසං පතිට්ඨාති සඞ්ඝාදිසේසෝ.

1. වත්ථුදේසේතබ්බං (මා.පා.)

සුගත් වියතින් වියත් සතක් ද විය යුතු යි. කුටිවස්තුව දේශනා කිරීම පිණිස භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් උවදුරු රහිත[1] වූ උපචාර සහිත[2] වූ කුටිවස්තුව දෙසිය යුතු ය. ඉදින් භික්ෂු තෙම උවදුරු සහිත වූ උපචාර රහිත වූ වස්තුවෙහි ඉල්ලාගත් උපකරණ වලින් කුටියක් කරවන්නේ නම්, කුටි වස්තුව දෙසීම පිණිස භික්ෂූන් නො කැඳවන්නේ නම් හෝ ප්‍රමාණය ඉක්මවන්නේ නම් හෝ සඟවෙසෙස් වේ.

7. කරවා දෙන දායකයකු ඇති තමා උදෙසා වූ මහල්ලක[3] විහාරයක් කරවන භික්ෂුව විසින් වස්තුව දේශනා කිරීම පිණිස භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් උපද්‍රව රහිත වූ උපචාර සහිත වූ වස්තුව දේශනා කළ යුතු ය. ඉදින් භික්ෂු තෙම උපද්‍රව සහිත වූ උපචාර රහිත වූ බිමෙහි මහල්ලක විහාරයක් කරවන්නේ නම්, වස්තු දේශනාව පිණිස භික්ෂූන් හෝ නො කැඳවන්නේ නම් සඟවෙසෙස් වේ.

8. යම් භික්ෂුවක් වනාහි කිපියේ, නො සතුටු සිත් ඇත්තේ, ''මොහු සසුනෙන් නෙරපන්නෙම් නම්, යෙහෙකැ''යි භික්ෂුවකට අමූලික[4] පරිජි ඇවතකින් චෝදනා කෙරේ නම්, පසු කලෙක විචාරනු ලබන්නේ හෝ නො විචාරනු ලබන්නේ හෝ ඒ අධිකරණය මුල් රහිත වේ නම්, එම චෝදනා කළ භික්ෂුව ද ''මා විසින් හිස් බසක් මුසාවක්, අභූතයක්, නො දන්නක් කියන ලදැ''යි දෝසයෙහි පිහිටා නම් සඟවෙසෙස් වේ.

1. උපග්‍රන්ථය - II (ඇ) 2. උපග්‍රන්ථය - II (ඈ) බලනු මැනවි.

3. කරවා දෙන දායකයන් ඇති බැවින් ද සඤ්ඤාචිත කුටියට වඩා මහත් වූ බැවින් ද මහල්ලක නම් වේ.

4. නො දුටු, නො ඇසූ, සැක නො කළ.

9. යෝ පන භික්ඛු භික්ඛුං දුට්ඨෝ දෝසෝ අප්පතීතෝ, අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදේසං ලේසමත්තං උපාදාය පාරාජිකේන ධම්මේන අනුද්ධංසෙය්‍ය; අප්පේවනාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති. තතෝ අපරේන සමයේන සමනුග්ගාහියමානෝ වා අසමනුග්ගාහියමානෝ වා අඤ්ඤභාගියඤ්චේව තං අධිකරණං හෝති, කෝචිදේසෝ ලේසමත්තෝ උපාදින්නෝ, භික්ඛු ච දෝසං පතිට්ඨාති සඞ්ඝාදිසේසෝ.

10. යෝ පන භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භේදාය පරක්කමෙය්‍ය, භේදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ තිට්ඨෙය්‍ය, සෝ භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයෝ; මා ආයස්මා සමග්ගස්ස සඞ්ඝස්ස භේදාය පරක්කමි, භේදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි. සමේතායස්මා සඞ්ඝේන, සමග්ගෝ හි සඞ්ඝෝ සම්මෝදමානෝ අවිවදමානෝ ඒකුද්දේසෝ ඵාසු විහරතීති. ඒවඤ්ච සෝ භික්ඛු භික්ඛූහි වුච්චමානෝ, තථේව පග්ගණ්හෙය්‍ය, සෝ භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බෝ තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චේ සමනුභාසියමානෝ තං පටිනිස්සජ්ජෙය්‍ය,[1] ඉච්චේතං කුසලං නෝ චේ පටිනිස්සජ්ජෙය්‍ය සඞ්ඝාදිසේසෝ.

1. පටිනිස්සජෙය්‍ය (බ්‍ර.ජ.මු.)

9. යම් භික්ෂුවක් වනාහි කිපියේ, නො සතුටු සිත් ඇත්තේ ''මොහු සසුනෙන් නෙරපන්නෙම් නම් යෙහෙකැ''යි අන්‍යභාගීය අධිකරණයකගේ ඒකදේශ ලේශමාත්‍රයක් ගෙන භික්ෂුවකට අමූලික පරිජි ඇවතකින් චෝදනා කෙරේ නම්, පසු කලෙක විචාරනු ලබන්නේ හෝ නො විචාරනු ලබන්නේ හෝ ඒ අධිකරණය අන්‍යභාගීය වේද, ඒකදේශ වූ ලේශමාත්‍රයක් ගන්නා ලද්දේ ද, චෝදනා කළ භික්ෂුවද, ''මා විසින් හිස්බසක්, මුසාවක්, අභූතයක්, නො දන්නක් කියන ලදැ''යි දෝසයෙහි පිහිටා නම් සඟවෙසෙස් වේ.

10. යම් භික්ෂුවක් වනාහි සමගි භික්ෂු සංඝයාගේ බිඳවීම පිණිස උත්සාහ දරන්නේ නම්, භේදය පිණිස හේතුවන භේදකර වස්තුවක්[1] හෝ දැඩි ව ගෙන සිටින්නේ නම්, ඒ භික්ෂු තෙම සෙසු ලජ්ජී භික්ෂූන් විසින් ''ඇවැත්නි සමගි සංඝයාගේ බිඳවීම පිණිස උත්සාහ නො කරවු; භේදය පිණිස හේතුවන භේදකර වස්තුවක් හෝ දැඩි ව ගෙන නො සිටිවු; ආයුෂ්මතුන් වහන්සේ සංඝයා සමග එක් වේවා! සංඝ තෙමේ සමගි වනුයේ, ඔවුනොවුන් සතුටු වනුයේ, විරුද්ධ වාද රහිත වූයේ, සමාන උද්දේස ඇත්තේ සුවසේ වෙසේය'' යනුවෙන් මෙසේ කිය යුතු වන්නේ ය. ඒ භික්ෂු තෙම භික්ෂූන් වහන්සේලා විසින් මෙසේත් කියනු ලබන්නේ, එසේ ම දැඩි ව ගෙන සිටින්නේ නම්, එම ලබ්ධිය දුරලීම පිණිස භික්ෂූන් විසින් එම භික්ෂු තෙම තුන්යල දක්වා සමනුභාසනය කළ යුතු වේ. ඉදින් තුන්යල දක්වා සමනුභාසන කර්මය[2] කරනු ලබන්නේ ඒ ලබ්ධිය දුරලන්නේ නම් මැනවි. ඉදින් නො දුරලන්නේ නම් සඟවෙසෙස් වේ.

1. අටලොස් භේදකර වස්තුන්ගෙන් එකක් හෝ ගෙන, උපග්‍රන්ථය - II (ඉ) බලනු මැනවි.
2. ඤත්ති චතුත්ථ විනය කර්මයකි.

11. තස්සේව ඛෝ පන භික්ඛුස්ස භික්ඛූ හොන්ති අනුවත්තකා වග්ගවාදකා ඒකෝ වා ද්වේ වා තයෝ වා තේ ඒවං වදෙය්‍යුං; මා ආයස්මන්තෝ ඒතං භික්ඛුං කිඤ්චි අවචුත්ථ, ධම්මවාදී චේසෝ භික්ඛු විනයවාදී චේසෝ භික්ඛු අම්හාකඤ්චේසෝ භික්ඛු ඡන්දඤ්ච රුචිඤ්ච ආදාය වෝහරති. ජානාති නෝ භාසති අම්හාකම්පේතං ඛමතීති. තේ භික්ඛූ භික්ඛූහි ඒවමස්සු වචනීයා; මා ආයස්මන්තෝ ඒවං අවචුත්ථ, න චේසෝ භික්ඛු ධම්මවාදී, න චේසෝ භික්ඛු විනයවාදී, මා ආයස්මන්තානම්පි සඞ්ඝභේදෝ රුච්චිත්ථ. සමේතායස්මන්තානං සඞ්ඝේන, සමග්ගෝ හි සඞ්ඝෝ සම්මෝදමානෝ අවිවදමානෝ ඒකුද්දේසෝ ඵාසු විහරතීති.

ඒවඤ්ච තේ භික්ඛූ භික්ඛූහි වුච්චමානා තථේව පග්ගණ්හෙය්‍යුං, තේ භික්ඛූ භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චේ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍යුං, ඉච්චේතං කුසලං. නෝ චේ පටිනිස්සජ්ජෙය්‍යුං සඞ්ඝාදිසේසෝ.

12. භික්ඛු පනේව දුබ්බචජාතිකෝ හෝති, උද්දේසපරියාපන්නේසු සික්ඛාපදේසු භික්ඛූහි සහධම්මිකං වුච්චමානෝ අත්තානං අවචනීයං

11. සංඝභේදය සඳහා ප්‍රයත්න දරන ඒ භික්ෂුවට අනුවර්තනය වූවාහු එම පක්ෂයේ වෘද්ධිය පිණිස සිටියාහු එක් භික්ෂුවක් හෝ දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ වෙත් ද ඔවුහු ''ඇවැත්නි තෙල භික්ෂුවට කිසිත් නො කියවු; ඒ භික්ෂුව ධර්මවාදී ය, විනයවාදී ය; අපගේ ඡන්දයත් රුචියත්ගෙන ව්‍යවහාර කෙරෙයි; අපගේ ඡන්දාදිය දනි යි; අප සමග බෙණෙ යි; තෙල අපට ද රුචි වේ'' යැයි මෙසේ කියන්නාහු නම්, ඒ භික්ෂූහු භික්ෂූන් විසින් ''ඇවැත්නි මෙසේ නො කියවු; ඒ භික්ෂුව ධර්මවාදී නො වේය; විනයවාදී නො වේය; ආයුෂ්මතුන් වහන්සේලාට ද සංඝභේදය රුචි නො වේවා; ආයුෂ්මතුන් වහන්සේලාගේ සිත සංඝයා සමග ඒකීභාවයට යේවා; සංඝ තෙමේ සමගි වනුයේ, ඔවුනොවුන් සතුටු වනුයේ, විවාද නො කරනුයේ, සමාන උද්දේස ඇත්තේ සුවසේ වෙසේය'' යනුවෙන් මෙසේ කිය යුත්තාහ.

ඒ අනුවර්තක භික්ෂූහු භික්ෂූන් විසින් මෙසේත් කියනු ලබන්නාහු, එසේ ම දැඩි කොට ගන්නාහු නම්, ඒ ලබ්ධිය දුරලීම පිණිස ඒ භික්ෂූහු භික්ෂූන් විසින් තුන්යළ දක්වා සමනුභාසනය කළ යුත්තාහ. ඉදින් තුන්යළ දක්වා සමනුභාසන කර්මය කරනු ලබන්නාහු, ඒ ලබ්ධිය දුරලන්නේ නම් මැනවි. ඉදින් නො දුරලන්නේ නම් සඟවෙසෙස් වේ.

12. භික්ෂුවක් වනාහිම අකීකරු ස්වභාව ඇත්තේ වේ ද, භික්ෂූන් විසින් පාමොක් උදෙසීමෙහි ඇතුළත් වූ සිකපදයන්හි සහධර්මයෙන් (පැනවූ සිකපදයෙන්) කියනු ලබන්නේ

කරෝති; මා මං ආයස්මන්තෝ කිඤ්චි අවචුත්ථ කල්‍යාණං වා පාපකං වා, අහම්පායස්මන්තේ න කිඤ්චි වක්ඛාමි කල්‍යාණං වා පාපකං වා, විරමථායස්මන්තෝ මම වචනායාති.

සෝ භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයෝ; මා ආයස්මා අත්තානං අවචනීයං අකාසි, වචනීයමේවායස්මා අත්තානං කරෝතු, ආයස්මාපි භික්ඛූ වදේතු සහධම්මේන, භික්ඛූපි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මේන, ඒවං සංවද්ධා හි තස්ස භගවතෝ පරිසා, යදිදං අඤ්ඤමඤ්ඤවචනේන අඤ්ඤමඤ්ඤවුට්ඨාපනේනාති.

ඒවඤ්ච සෝ භික්ඛු භික්ඛූහි වුච්චමානෝ තථේව පග්ගණ්හෙය්‍ය, සෝ භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බෝ තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චේ සමනුභාසියමානෝ තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චේතං කුසලං. නෝ චේ පටිනිස්සජ්ජෙය්‍ය සඞ්ඝාදිසේසෝ.

13. භික්ඛු පනේව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති, කුලදූසකෝ පාපසමාචාරෝ. තස්ස ඛෝ පාපකා සමාචාරා දිස්සන්ති චේව සුය්‍යන්ති ච, කුලානි ච තේන දුට්ඨානි දිස්සන්ති චේව සුය්‍යන්ති ච,

''ආයුෂ්මතුන් වහන්සේලා මට යහපත් වූ හෝ අයහපත් වූ හෝ කිසිවක් නො කියවු; මම ද ආයුෂ්මතුන් වහන්සේලාට යහපත් වූ හෝ අයහපත් වූ හෝ කිසිවක් නො කියමි; ආයුෂ්මතුන් වහන්සේලා මට අවවාදයෙන් වෙන් වවු'' යැයි තමා නො කියයුත්තකු කරයි.

ඒ භික්ෂු තෙම භික්ෂූන් විසින් ''ආයුෂ්මතුන් වහන්සේ තමාව නො කියයුත්තකු නො කෙරේවා; ආයුෂ්මත් තෙම තමාව කියයුත්තකු ම කරාවා; ආයුෂ්මත් තෙමේ ද භික්ෂූන්හට පැනවූ ශික්ෂාපදයෙන් කියාවා; භික්ෂූහු ද ආයුෂ්මතුන්හට පැන වූ ශික්ෂාපදයෙන් කියත්; මෙසේ, ඉදින් මේ ඔවුනොවුන්ගේ අනුශාසනයෙන් ඔවුනොවුන් ඇවතින් නගාලීමෙන් ඒ භාග්‍යවතුන් වහන්සේගේ පිරිස වැඩුනේ ම වෙයි'' යනුවෙන් මෙසේ කිය යුතු වන්නේ ය.

ඒ භික්ෂු තෙම භික්ෂූන් වහන්සේලා විසින් මෙසේත් කියනු ලබන්නේ, එසේ ම දැඩි ව ගෙන සිටින්නේ නම්, එම ලබ්ධිය දුරලීම පිණිස භික්ෂූන් විසින් එම භික්ෂු තෙම තුන්යළ දක්වා සමනුභාසනය කළ යුතු වේ. ඉදින් තුන්යළ දක්වා සමනුභාසන කර්මය කරනු ලබන්නේ ඒ ලබ්ධිය දුරලන්නේ නම් මැනවි. ඉදින් නො දුරලන්නේ නම් සඟවෙසෙස් වේ.

13. භික්ෂුවක් වනාහි කුල දූෂණය[1] කරන්නේ, පාප සමාචාර[2] (ලාමක හැසිරීම්) ඇත්තේ, එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරු කොට වෙසෙයි. ඒ භික්ෂුවගේ ලාමක හැසිරීම් දක්නා ලැබෙත් මෙන් ම අසනු ලැබෙත් ද, ඔහු විසින් දූෂිත කුලයෝ ද දක්නා ලැබෙත් මෙන් ම අසනු ලැබෙත් ද,

1. පුෂ්පදානාදියෙන් මිනිසුන්ගේ ශ්‍රද්ධාව විනාශ කරමින් කුලයෝ දූෂණය කරත්නුයි කුලදූෂක නම් වේ.

2. ගිහියන්ට දීම සඳහා මල්පැල රෝපණය කිරීම් ආදී ලාමක හැසිරීම් ඔහුට ඇත්තේනුයි පාප සමාචාර නම් වේ.

සො භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයො; ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො. ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනාති.

ඒවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තෙ භික්ඛූ ඒවං වදෙය්‍ය; ඡන්දගාමිනො ච භික්ඛූ දොසගාමිනො ච භික්ඛූ මොහගාමිනො ච භික්ඛූ භයගාමිනො ච භික්ඛූ, තාදිසිකාය ආපත්තියා ඒකච්චං පබ්බාජෙන්ති, ඒකච්චං න පබ්බාජෙන්තීති.

සො භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයො; මා ආයස්මා ඒවං අවච, න ච භික්ඛූ ඡන්දගාමිනො න ච භික්ඛූ දොසගාමිනො න ච භික්ඛූ මොහගාමිනො න ච භික්ඛූ භයගාමිනො, ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනාති.

ඒවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං

ඒ භික්ෂු තෙම භික්ෂූන් විසින් ''ආයුෂ්මතුන් වහන්සේ කුලදූෂක ය; ලාමක හැසිරීම් ඇත්තෙහි ය; ආයුෂ්මතුන්ගේ ලාමක හැසිරීම් දක්නා ලැබෙත් මෙන් ම අසනු ලැබෙත් ය; ආයුෂ්මතුන් වහන්සේ විසින් දූෂිත කුලයෝ ද දක්නා ලැබෙත් මෙන් ම අසනු ලැබෙත්; ආයුෂ්මතුන් වහන්සේ මේ ආවාසයෙන් නික්ම යේවා; නුඹ වහන්සේගේ මෙහි විසීමෙන් කම් නැත'' යනුවෙන් මෙසේ කිය යුතු වන්නේ ය.

ඒ භික්ෂු තෙම භික්ෂූන් විසින් මෙසේත් කියනු ලබන්නේ, ඒ භික්ෂූන්ට ''භික්ෂූහු ඡන්දයෙන් අගතියට යන්නෝ වෙත්; භික්ෂූහු ද්වේෂයෙන් අගතියට යන්නෝ වෙත්; භික්ෂූහු මෝහයෙන් අගතියට යන්නෝ වෙත්; භික්ෂූහු භයෙන් අගතියට යන්නෝ වෙත්; එබඳු වූ ඇවතින් ඇතමෙකු (ආරාමයෙන්) බැහැර කරත්; සමහර අය බැහැර නො කරත්'' යැයි මෙසේ කියන්නේ නම්,

ඒ භික්ෂු තෙම අනෙක් භික්ෂූන් විසින් ''ආයුෂ්මතුන් වහන්සේ මෙසේ නො කියව; භික්ෂූහු ඡන්දයෙන් අගතියට යන්නෝ නො වෙත්; භික්ෂූහු ද්වේෂයෙන් අගතියට යන්නෝ නො වෙත්; භික්ෂූහු මෝහයෙන් අගතියට යන්නෝ නො වෙත්; භික්ෂූහු භයෙන් අගතියට යන්නෝ නො වෙත්; ආයුෂ්මතුන් වහන්සේ කුලදූෂක ය; ලාමක හැසිරීම් ඇත්තෙහි ය; ආයුෂ්මතුන්ගේ ලාමක හැසිරීම් දක්නා ලැබෙත් මෙන් ම අසනු ලැබෙත්; ආයුෂ්මතුන් වහන්සේ විසින් දූෂිත කුලයෝ ද දක්නා ලැබෙත් මෙන් ම අසනු ලැබෙත්; ආයුෂ්මතුන් වහන්සේ මේ ආවාසයෙන් නික්ම යේවා; නුඹ වහන්සේගේ මෙහි විසීමෙන් කම් නැත'' යැයි මෙසේ කිය යුතු වන්නේ ය.

ඒ භික්ෂු තෙම භික්ෂූන් වහන්සේලා විසින් මෙසේත් කියනු ලබන්නේ, එසේ ම දැඩි ව ගෙන සිටින්නේ නම්, එම ලබ්ධිය

සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සඞ්ඝාදිසෙසො.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො තේරස සඞ්ඝාදිසෙසා ධම්මා, නව පඨමාපත්තිකා, චත්තාරො යාවතතියකා. යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා, යාවතිහං ජානං පටිච්ඡාදෙති, තාවතිහං තේන භික්ඛුනා අකාමා පරිවත්ථබ්බං. පරිවුත්ථපරිවාසෙන භික්ඛුනා උත්තරිං[1] ඡාරත්තං භික්ඛුමානත්තාය පටිපජ්ජිතබ්බං. චිණ්ණමානත්තො භික්ඛු යත්ථ සියා වීසතිගණො භික්ඛුසඞ්ඝො, තත්ථ සො භික්ඛු අබ්භෙතබ්බො. ඒකේනපි චෙ ඌනො වීසතිගණො භික්ඛුසඞ්ඝො තං භික්ඛුං අබ්භෙය්‍ය, සො ච භික්ඛු අනබ්භිතො. තේ ච භික්ඛූ ගාරය්හා, අයං තත්ථ සාමීචි.

තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී, ඒවමෙතං ධාරයාමීති.

සඞ්ඝාදිසෙසුද්දෙසො තතියො.

1. උත්තරි (ම.ඡ.සං.)

දුරලීම පිණිස භික්ෂූන් විසින් එම භික්ෂු තෙම තුන්යළ දක්වා සමනුභාසනය කළ යුතු වේ. ඉදින් තුන්යළ දක්වා සමනුභාසන කර්මය කරනු ලබන්නේ ඒ ලබ්ධිය දුරලන්නේ නම් මැනවි. ඉදින් නො දුරලන්නේ නම් සඟවෙසෙස් වේ.

ආයුෂ්මත්වරුනි! දහතුනක් වූ සඟවෙසෙස් ධර්මයෝ උදෙසන ලද්දාහු ය. පඨමාපත්තික[1] සිකපද නවයකි. යාවතතියක[2] සිකපද සතරකි. භික්ෂු තෙම යම් සඟවෙසෙසුන් අතරින් එක්තරා එක්තරා ඇවතකට පැමිණ, යම්තාක් දින ගණනක් දැන දැන සඟවයි ද, ඒ තාක් දින ගණනක් නොකැමැත්තෝ නමුදු පිරිවෙස් විසිය යුතු වේ. වසන ලද පිරිවෙස් ඇති භික්ෂුව විසින් ඉන් මත්තෙහි සය රැයක් භික්ෂුන්ට බුහුමන් පිණිස පිළිපැදිය යුතු ය. පුරන ලද මානත් ඇති භික්ෂුවක් වෙයි ද ඒ භික්ෂු තෙම විංශත්වාර්ගික[3] භික්ෂු සංඝ තෙම යම් සීමාවක වන්නේ ද, ඒ සීමාවෙහිදී අබ්භාන කර්මය කළ යුත්තේ ය. ඉදින් එක් නමකිනුදු අඩුවූ විංශත්වාර්ගික භික්ෂු සංඝ තෙම ඒ භික්ෂුව අබ්භානය කරන්නේ නම්, ඒ භික්ෂු තෙම අනබ්භිත (ඇතුළත් නොකරන ලද්දේ) වෙයි. ඒ භික්ෂුහු ද ගැරහිය යුත්තාහු වෙති. මේ එහි අනුධර්මතාවය යි.

එහි ලා ආයුෂ්මතුන් වහන්සේලා විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
දෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
තෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?

මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධය හ. නිහඬ එබැවිනි. 'මෙසේ මෙය ධරමි' යැයි

## තුන්වෙනි සංඝාදිසේස උද්දේසය යි.

1. පළමු ව්‍යතික්‍රමණ ක්ෂණයෙහි ම ඇවතට පත්වන්නේ පඨමාපත්තික නම් වේ.
2. තුන්යළ දක්වා සමණුභාසන කර්මය කළ කල්හි ඇවතට පත්වන්නේ යාවතතියක නම් වේ.
3. අබ්භානාරහ භික්ෂුව හැර සීමාව තුළ ප්‍රකෘති භික්ෂූන් විසි නමක් සිටිය යුතු ය.

# (3) අනියතා ධම්මා

ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ අනියතා ධම්මා උද්දේසං ආගච්ඡන්ති.

1. යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං ඒකො ඒකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙය්‍ය, තමෙනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා තිණ්ණං ධම්මානං අඤ්ඤතරේන වදෙය්‍ය, පාරාජිකේන වා සඞ්ඝාදිසේසේන වා පාචිත්තියේන වා. නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරේන කාරේතබ්බො, පාරාජිකේන වා සඞ්ඝාදිසේසේන වා පාචිත්තියේන වා. යේන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තේන සො භික්ඛු කාරේතබ්බො අයං ධම්මො අනියතො.

2. නහේව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති නාලංකම්මනියං, අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං. යො පන භික්ඛු තථාරූපෙ ආසනෙ මාතුගාමෙන සද්ධිං ඒකො ඒකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය, තමෙනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා ද්වින්නං ධම්මානං අඤ්ඤතරේන වදෙය්‍ය, සඞ්ඝාදිසේසේන වා පාචිත්තියේන වා. නිසජ්ජං භික්ඛු පටිජානමානො

# (3) අනියත ධර්මයෝ

ඇවැත්නි ! මේ අනියත ධර්මයෝ දෙදෙන උදෙසීමට පැමිණෙත්.

1. යම් භික්ෂුවක් වනාහි හුදකලා වූයේ, හුදකලා මිනිස් මාගමක් සමග එකලා ව රහසිගත වූ පිළිසන් වූ මෙවුන්දම් සේවනයට සුදුසු අසුනක හිඳීම කරන්නේ නම්, ඇදහිය හැකි වචන ඇති උපාසිකාවක්[1] ඒ භික්ෂුව දැක පරිජියෙන් හෝ සඟවෙසෙසින් හෝ පචිතියෙන් හෝ යන තුන් ඇවැත් අතරින් එක්තරා ඇවතකින් කියා නම්, හිඳීම පිළිගන්නා භික්ෂුව පරිජියෙන් හෝ සඟවෙසෙසින් හෝ පචිතියෙන් හෝ යන තුන් ඇවැත් අතරින් එක්තරා එකකින් ඇවැත් කරවිය යුත්තේ ය. ඇදහිය යුතු වචන ඇති ඒ උපාසිකාව හිඳීම් ආදී යම් ආකාරයකින් කියා නම්, ඒ භික්ෂුව ඒ ආකාරයෙන් ඇවත් කරවිය යුත්තේ ය. මේ ඇවැත අනියත[2] ය.

2. අසුන වැසුනක් නො වූයේ ම වෙයි ද, මෙවුන්දම් සේවනයට යෝග්‍ය නො වේ ද, මිනිස් මාගමකට දුහුල් වචන කීමට යෝග්‍යවේ ද, යම් භික්ෂුවක් වනාහි හුදකලා වූයේ එබඳු අසුනක හුදකලා මාගමක් සමග රහසිගත ව හිඳීම කරයි නම්, ඇදහිය හැකි වචන ඇති උපාසිකාවක් ඒ භික්ෂුව දැක සඟවෙසෙසින් හෝ පචිතියෙන් හෝ යන ඇවැත් දෙක අතරින් එක්තරා ඇවතකින් කියා නම්, හිඳීම පිළිගන්නා භික්ෂුව

1. සෝවාන් ආර්ය ශ්‍රාවිකාවක්.
2. ප්‍රතිඥාවෙන් කටයුතු බැවින් නියත නොවන.

ද්වින්නං ධම්මානං අඤ්ඤතරේන කාරේතබ්බෝ, සඞ්ඝාදිසේසේන වා පාචිත්තියේන වා. යේන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තේන සෝ භික්ඛු කාරේතබ්බෝ අයම්පි ධම්මෝ අනියතෝ.

උද්දිට්ඨා ඛෝ ආයස්මන්තෝ ද්වේ අනියතා ධම්මා. තත්ථායස්මන්තේ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තෝ තස්මා තුණ්හී, ඒවමේතං ධාරයාමීති.

අනියතුද්දේසෝ චතුත්ථෝ.

## (4) නිස්සග්ගියා පාචිත්තියා ධම්මා

ඉමේ ඛෝ පනායස්මන්තෝ තිංසනිස්සග්ගියා පාචිත්තියා ධම්මා උද්දේසං ආගච්ඡන්ති.

1. නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනේ, දසාහපරමං අතිරේකචීවරං ධාරේතබ්බං. තං අතික්කාමයතෝ නිස්සග්ගියං පාචිත්තියං.

2. නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනේ,

සඟවෙසෙසින් හෝ පචිතියෙන් හෝ යන ඇවැත් දෙක අතරින් එක්තරා එකකින් ඇවැත් කරවිය යුත්තේ ය. ඇදහිය හැකි වචන ඇති ඒ උපාසිකාව යම් ආකාරයකින් හෝ කියන්නේ නම්, ඒ භික්ෂුව ඒ ආකාරයෙන් ඇවැත් කරවිය යුත්තේ ය. මේ ඇවත ද අනියත වේ.

ආයුෂ්මත්වරුනි! දෙකක් වූ අනියත ධර්මයෝ උදෙසන ලද්දාහු ය.
එහි ලා ආයුෂ්මතුන් වහන්සේලා විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
දෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
තෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධය හ. නිහඬ එබැවිනි. 'මෙසේ මෙය ධරමි' යැයි

## සිවුවැනි අනියත උද්දේසය යි.

# (4) නිසඟි පචිති ධර්මයෝ

ඇවැත්නි! මේ තිස් නිසඟි පචිති ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1. භික්ෂුවක් විසින් සිවුර නිම වූ කල්හි, කඨිනය උදුරන ලද කල්හි උපරිම දස දිනක් දක්වා අතිරේක සිවුරක්[1] දැරිය යුතු ය. එම දස දින ඉක්මවන්නාට, නිසඟි පචිති වේ.

2. භික්ෂුවගේ සිවුර නිම වූ කල්හි කඨිනය උදුරන ලද කල්හි

1. අතිරේක සිවුරක් යනු අධිෂ්ඨානය හෝ විකප්පනය නො කළ සිවුරකි.

ඒකරත්තම්පි චෙ භික්ඛු තිචීවරේන විප්පවසෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං.

3. නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනේ, භික්ඛුනො පනේව අකාලචීවරං උප්පජ්ජෙය්‍ය, ආකඞ්ඛමානේන භික්ඛුනා පටිග්ගහේතබ්බං, පටිග්ගහෙත්වා ඛිප්පමේව කාරේතබ්බං. නො චස්ස පාරිපූරී, මාසපරමං තේන භික්ඛුනා තං චීවරං නික්ඛිපිතබ්බං ඌනස්ස පාරිපූරියා සතියා පච්චාසාය, තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය සතියාපි පච්චාසාය නිස්සග්ගියං පාචිත්තියං.

4. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා ආකොටාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියං.

5. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගණ්හෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා[1] නිස්සග්ගියං පාචිත්තියං.

6. යො පන භික්ඛු අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙය්‍ය අඤ්ඤත්‍ර සමයා නිස්සග්ගියං පාචිත්තියං. තත්ථායං සමයො, අච්ඡින්නචීවරො වා හොති භික්ඛු නට්ඨචීවරො වා අයං තත්ථ සමයො.

1. පරිවත්තකා (ම.ඡ.සං.)

ඉදින් භික්ෂු තෙම භික්ෂු සම්මුතියකින් තොර ව එක් රැයකුදු තුන් සිවුරෙන් වෙන් ව වසන්නේ නම්, නිසඟි පචිති වේ.

3. භික්ෂුවගේ සිවුර නිම වූ කල්හි කඨිනය උදුරන ලද කල්හි භික්ෂුවකට ම වනාහි නොකල් සිවුරක් උපදනේ නම්, කැමති වන්නා වූ භික්ෂුව විසින් පිළිගත යුතු ය. පිළිගෙන වහා ම කරවිය යුතු වේ. ඉදින් සිවුරකට ප්‍රමාණවත් නො වේ ද සිවුරු ලැබීමේ ආශාවක් ඇති කල්හි ඒ භික්ෂුව විසින් ඌන පූර්ණය පිණිස ඒ සිවුර උපරිම මාසයක් දක්වා අදිටන් නො කර විකප්පනය නො කර තැබිය යුතු ය. චීවරය ලැබීමේ ආශාවක් ඇති කල්හිදු එයින් මත්තෙහි තබන්නේ නම්, නිසඟි පචිති වේ.

4. යම් භික්ෂුවක් වනාහි භික්ෂුණියක ලවා පැරණි සිවුරක්[1] සෝදවන්නේ නම්, හෝ පඬු පොවන්නේ නම්, හෝ අපුල්ලවන්නේ නම්, නිසඟි පචිති වේ.

5. යම් භික්ෂුවක් වනාහි නො නෑ භික්ෂුණියක අතින් යටත් පිරිසෙයින් අරළු කඩකුදු මාරු කර ගැනීමක් නැති ව සිවුරක් පිළිගන්නේ නම්, නිසඟි පචිති වේ.

6. යම් භික්ෂුවක් වනාහි නො නෑ ගෘහපතියකු හෝ ගෘහපතිනියකගෙන් හෝ සුදුසු සමය හැර සිවුරක් ඉල්ලා ගන්නේ නම්, නිසඟි පචිති වේ. එහි ඒ සිවුරු ඉල්ලීමෙහි මේ සුදුසු සමය වෙයි; භික්ෂු තෙම පැහැරගන්නා ලද සිවුරු ඇත්තේ හෝ නැසුනු සිවුරු ඇත්තේ හෝ වෙයි ද, මේ එහි සුදුසු සමය වේ.

1. පැරණි සිවුරක් යනු වරක් නමුදු හඳනා හෝ පොරෝනා ලද සිවුරකි.

7. තඤ්චෙ අඤ්ඤාතකො ගහපති වා ගහපතානී වා බහූහි චීවරේහි අභිහට්ඨුං පවාරෙය්‍ය, සන්තරුත්තරපරමං තේන භික්ඛුනා තතො චීවරං සාදිතබ්බං, තතො චෙ උත්තරිං සාදියෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

8. භික්ඛුං පනේව උද්දිස්ස අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා ගහපතානියා වා චීවරචේතාපන්නං උපක්ඛටං හෝති; ඉමිනා චීවරචේතාපන්නේන චීවරං චේතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරේන අච්ඡාදෙස්සාමීති. තත්‍ර චෙ සො භික්ඛු පුබ්බේ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරේ විකප්පං ආපජ්ජෙය්‍ය; සාධු වත මං ආයස්මා ඉමිනා චීවරචේතාපන්නේන ඒවරූපං වා ඒවරූපං වා චීවරං චේතාපෙත්වා අච්ඡාදේහීති, කල්‍යාණකම්‍යතං උපාදාය නිස්සග්ගියං පාචිත්තියං.

9. භික්ඛුං පනේව උද්දිස්ස උභින්නං අඤ්ඤාතකානං ගහපතීනං වා ගහපතානීනං වා පච්චේකචීවරචේතාපන්නානි උපක්ඛටානි[1] හොන්ති; ඉමේහි මයං පච්චේකචීවරචේතාපන්නේහි පච්චේකචීවරානි චේතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරේහි අච්ඡාදෙස්සාමාති. තත්‍ර චෙ සො භික්ඛු පුබ්බේ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරේ

1. පච්චේකචීවරචේතාපන්නා උපක්ඛටා (බු.ජ.මු.)

7. ඉදින් නො නෑ වූ ගෘහපතියෙක් හෝ ගෘහපතිනියක් හෝ (ඒ පැහැරගත් හෝ නැසුනු සිවුරු ඇති) භික්ෂුව කැමතිතාක් ගෙන යන්නට බොහෝ සිවුරු වලින් පවරන්නේ නම්, ඒ භික්ෂුව විසින් ඒ එළවූ සිවුරු වලින් අඳනය හා උතුරු සඟල (තනිපට සිවුර) පමණක් ඉවසිය යුතු ය. ඉදින් ඉන් මත්තෙහි ඉවසා නම්, නිසඟි පචිති වේ.

8. භික්ෂුවක් ම උදෙසා නො නෑ ගෘහපතියෙකු හෝ ගෘහපතිනියක විසින් ''මේ සිවුරු මිලයෙන් සිවුරක් මිල දී ගෙන මෙ නම් ඇති භික්ෂුව සිවුරෙන් පුදන්නෙමි'' යැයි සිවුරු මිලයක් එකතු කරන ලද්දේ වෙයි. ඉදින් ඒ භික්ෂුව පෙර නො පවරන ලදුයේ එහි එළඹ ''ආයුෂ්මතුනි, මේ සිවුරු මිලයෙන් මෙබඳු වූ හෝ මෙබඳු වූ හෝ සිවුරක් මිල දී ගෙන මට දෙව'' යැයි හොඳ සිවුරක් ලබනු කැමති ව සිවුරෙහි අධික විධානයට පැමිණියේ වී නම්, නිසඟි පචිති වේ.

9. භික්ෂුවක් ම උදෙසා නො නෑ වූ ගෘහපතියන් දෙදෙනෙකු හෝ ගෘහපතිනියන් දෙදෙනෙකු විසින් ''අපි මේ වෙන් වෙන් වූ සිවුරු මිලයෙන් වෙන වෙන ම සිවුරු මිල දී ගෙන මෙ නම් ඇත්තා වූ භික්ෂුව සිවුරු වලින් පුදමු'' යැයි වෙන වෙන ම සිවුරු මිලයන් රැස්කරන ලද්දාහු වෙත්. එහි ලා එම භික්ෂුව ද පෙර නො පවරන ලදුයේ ඔවුන් වෙත ගොස්

විකප්පං ආපජ්ජෙය්‍ය; සාධු වත මං ආයස්මන්තො ඉමෙහි පච්චෙකචීවරචෙතාපන්නෙහි ඒවරූපං වා ඒවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙථ, උභොව සන්තා ඒකේනාති, කල්‍යාණකම්‍යතං උපාදාය නිස්සග්ගියං පාචිත්තියං.

10. භික්ඛුං පනේව උද්දිස්ස රාජා වා රාජභොග්ගො වා බ්‍රාහ්මණො වා ගහපතිකො වා දූතේන චීවරචෙතාපන්නං පහිණෙය්‍ය; ඉමිනා චීවරචෙතාපන්නේන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරේන අච්ඡාදෙහීති. සො චෙ දූතො තං භික්ඛුං උපසඞ්කමිත්වා ඒවං වදෙය්‍ය; ඉදං ඛො භන්තේ ආයස්මන්තං උද්දිස්ස චීවරචෙතාපන්නං ආභතං, පතිගණ්හාතු ආයස්මා චීවරචෙතාපන්නන්ති.

තේන භික්ඛුනා සො දූතො ඒවමස්ස වචනීයො; න ඛො මයං ආවුසො චීවරචෙතාපන්නං පතිගණ්හාම,[1] චීවරඤ්ච ඛො මයං පතිගණ්හාම කාලේන කප්පියන්ති. සො චෙ දූතො තං භික්ඛුං ඒවං වදෙය්‍ය; අත්ථි පනායස්මතො කොචි වෙය්‍යාවච්චකරොති. චීවරත්ථිකේන භික්ඛවේ භික්ඛුනා වෙය්‍යාවච්චකරො නිද්දිසිතබ්බො, ආරාමිකො වා උපාසකො වා, ඒසො ඛො ආවුසො භික්ඛූනං වෙය්‍යාවච්චකරොති.

1. පටිග්ගණ්හාම (ම.ඡ.සං.)

''ආයුෂ්මත්නි, නුඹලා දෙදෙනා ම එක්ව, මේ වෙන් වෙන් වූ සිවුරු මිලයන්ගෙන් මෙබඳු වූ ද මෙබඳු වූ ද සිවුරක් මිල දී ගෙන එක් සිවුරකින් මාව පුදන්නේ නම් මැනව'' යි හොඳ සිවුරක් කැමැති ව සිවුරෙහි අධික විධානයට පැමිණෙන්නේ නම්, නිසඟි පචිති වේ.

10. භික්ෂුවක් ම උදෙසා රජෙක් හෝ රජ ඇමතියෙක් හෝ බමුණෙක් හෝ ගෘහපතියෙක් හෝ ''මෙම සිවුරු මිලයෙන් සිවුරක් මිල දී ගෙන මෙ නම් ඇති භික්ෂුව සිවුරෙන් පුදව''යි දූතයකු ලවා සිවුරු මිලයක් යවන්නේ නම්, ඉදින් ඒ දූතයා ඒ භික්ෂුව වෙත එළඹ ''ස්වාමීනි, මේ සිවුරු මිලය ආයුෂ්මතුන් වහන්සේ උදෙසා ගෙන එන ලද ය; ආයුෂ්මතුන් වහන්සේ සිවුරු මිලය පිළිගනිත්වා'' යි මෙසේ කියන්නේ නම්,

ඒ භික්ෂුව විසින් එම දූත තෙම ''ඇවැත්නි, අපි සිවුරු මිලය නො පිළිගනිමු; එහෙත් අපි සුදුසු කල්හි කැප වූ සිවුරක් පිළිගනිමු'' යැයි කිය යුතු වන්නේ ය. ඉදින් ඒ දූත තෙම එම භික්ෂුවට ''ආයුෂ්මතුන් වහන්සේගේ කිසියම් කැපකරුවෙක් ඇත්ද''යි මෙසේ කියා නම්, මහණෙනි, සිවුරු කැමති භික්ෂුව විසින් ආරාමිකයෙක් හෝ වේවා උපාසකයෙක් හෝ වේවා ''ඇවැත්නි, මේ තෙම භික්ෂූන්ගේ කැපකරුවා'' යැයි කැපකරු දැක්විය යුත්තේ ය.

සො චෙ දූතො තං වෙය්‍යාවච්චකරං සඤ්ඤාපෙත්වා තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය; යං ඛො භන්තෙ ආයස්මා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තො සො මයා. උපසඞ්කමතු ආයස්මා කාලේන චීවරේන තං අච්ඡාදෙස්සතීති. චීවරත්ථිකේන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො උපසඞ්කමිත්වා, ද්වත්තික්ඛත්තුං චොදේතබ්බො සාරේතබ්බො; අත්ථො මෙ ආවුසො චීවරේනාති.

ද්වත්තික්ඛත්තුං චොදයමානො සාරයමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය ඉච්චේතං කුසලං. නො චෙ අභිනිප්ඵාදෙය්‍ය, චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං තුණ්හීභූතේන උද්දිස්ස ඨාතබ්බං. චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං තුණ්හීභූතො උද්දිස්ස තිට්ඨමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඉච්චේතං කුසලං. තතො චෙ උත්තරිං වායමමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

නො චෙ අභිනිප්ඵාදෙය්‍ය, යතස්ස චීවරචෙතාපන්නං ආභතං, තත්ථ සාමං වා ගන්තබ්බං දූතො වා පාහේතබ්බො; යං ඛො තුම්හෙ ආයස්මන්තො භික්ඛුං උද්දිස්ස චීවරචෙතාපන්නං පහිණිත්ථ, න

ඉදින් ඒ දූත තෙම කැපකරුවා ගිවිස්සවා ඒ භික්ෂුව වෙත එළඹ ''ස්වාමීනි, ආයුෂ්මතුන් වහන්සේ යම් කැපකරුවෙක් දක්වී ද මා විසින් හෙතෙම ගිවිසගන්නා ලදී; ආයුෂ්මතුන් වහන්සේ සුදුසු කාලයෙහි එළඹෙත්වා! නුඹ වහන්සේ සිවුරෙන් පුදන්නේය'' යැයි මෙසේ කියන්නේ නම්, මහණෙනි, සිවුරු කැමති භික්ෂුව විසින් කැපකරුවා වෙත එළඹ ''ඇවැත්නි, මට සිවුරෙන් ප්‍රයෝජන ඇත''යි දෙතුන්වරක් ඉල්විය යුත්තේ ය. සිහි කරවිය යුත්තේ ය.

දෙතුන්වරක් ඉල්ලනු ලබන්නේ සිහි කරවනු ලබන්නේ ඒ සිවුර සපයා දෙන්නේ නම් මෙසේ මෙය මැනවි. ඉදින් නො ම නිපදවා නම් සතර වරක්, පස් වරක්, සය වරක් උපරිම කොට එහි ගොස් නිහඬව උදෙසා සිටිය යුතු ය. සතර වරක්, පස් වරක්, සය වරක් උපරිම කොට නිහඬව උදෙසා සිටිනුයේ ඒ සිවුර සපයා දේ නම් මෙසේ මෙය මැනවි. ඉදින් ඉන් මත්තෙහි වෑයම් කරනුයේ ඒ සිවුර සපයා දෙන්නේ නම්, නිසඟි පචිති වේ.

ඉදින් සපයා නො දේ නම්, යමෙකු කෙරෙන් ඒ භික්ෂුව වෙත සිවුරු මුදල ගෙන එන ලද ද, එහි තෙමේ ම හෝ යා යුතු ය ''ඇවැත්නි, නුඹ භික්ෂුවක් උදෙසා යම් සිවුරු

තං තස්ස භික්ඛුනෝ කිඤ්චි අත්ථං අනුභෝති. යුඤ්ජන්තායස්මන්තෝ සකං, මා වෝ සකං විනස්සාති. අයං තත්ථ සාමීචි.

චීවරවග්ගෝ පඨමෝ.

❀ ❀ ❀

11. යෝ පන භික්ඛු කෝසියමිස්සකං සන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

12. යෝ පන භික්ඛු සුද්ධකාළකානං[1] ඒළකලෝමානං සන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

13. නවං පන භික්ඛුනා සන්ථතං කාරයමානේන, ද්වේ භාගා සුද්ධකාළකානං ඒළකලෝමානං ආදාතබ්බා, තතියං ඕදාතානං චතුත්ථං ගෝචරියානං. අනාදා චේ භික්ඛු ද්වේ භාගේ සුද්ධකාළකානං ඒළකලෝමානං තතියං ඕදාතානං චතුත්ථං ගෝචරියානං නවං සන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

14. නවං පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා, ඡබ්බස්සානි ධාරේතබ්බං. ඕරේන චේ ඡන්නං වස්සානං තං සන්ථතං විස්සජ්ජෙත්වා වා, අවිස්සජ්ජෙත්වා වා අඤ්ඤං නවං සන්ථතං

1. සුද්ධකාලකානං (හේ.වි.මු.)

මිලක් යැවී ද එය ඒ භික්ෂුවට කිසි දු අර්ථයක් සිදු නො කරයි; ආයුෂ්මත්හු ස්වකීය ධනය ලබත්වා; නුඹ සතු ධනය නො වැනසේවා''යි දූතයෙකු හෝ යැවිය යුතු ය. මේ එහි අනුධර්මතාවය යි.

## පළමුවැනි චීවර වර්ගය යි.

11. යම් භික්ෂුවක් වනාහි කෝසෙයය නූල් (පට නූල්) නූල් මිශ්‍ර ඇතිරියක් කරවන්නේ නම්, නිසඟි පචිති වේ.

12. යම් භික්ෂුවක් වනාහි හුදු කළු එළුලොම් වලින් ඇතිරියක් කරවන්නේ නම්, නිසඟි පචිති වේ.

13. අලුත් ඇතිරියක් කරවන භික්ෂුව විසින් (ඊට අවශ්‍ය ප්‍රමාණයෙන්) දෙකොටසක් (1/2) හුදු කළු එළුලොම් ගත යුතු ය. තෙවැනි කොටස (1/4) සුදු එළුලොම් ද සිවුවන කොටස (1/4) කිඹුල්වන් පැහැ ඇති (පඬුවන්) එළුලොම් ද ගත යුතු ය. ඉදින් භික්ෂුවක් දෙකොටසක් කළු එළුලොම් ද තෙවැනි කොටස සුදු එළුලොම් ද සිවුවන කොටස කිඹුල්වන් එළුලොම් ද නො ගෙන අලුත් ඇතිරියක් කරවන්නේ නම්, නිසඟි පචිති වේ.

14. භික්ෂුවක් විසින් අලුත් ඇතිරියක් කරවා සවසක් (වසර 6ක්) දැරිය යුතු ය. ඉදින් සාවුරුද්දකින් මෙපිට ඒ ඇතිරිය විස්සජ්ජනය කොට (කිසිවකුට දී) හෝ විස්සජ්ජනය නො කොට (කිසිවකුට නො දී) යම් භික්ෂුවක් විසින් භික්ෂු

කාරාපෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං.

15. නිසීදනසන්ථතං පන භික්ඛුනා කාරයමානේන, පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථි ආදාතබ්බා දුබ්බණ්ණකරණාය. අනාදා චෙ භික්ඛු පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං නවං නිසීදනසන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

16. භික්ඛුනෝ පනේව අද්ධානමග්ගපටිපන්නස්ස ඒළකලෝමානි උප්පජ්ජෙය්‍යුං, ආකඞ්ඛමානේන භික්ඛුනා පටිග්ගහේතබ්බානි. පටිග්ගහෙත්වා තියෝජනපරමං සහත්ථා හරිතබ්බානි අසන්තේ හාරකේ. තතෝ චෙ උත්තරිං හරෙය්‍ය, අසන්තේපි හාරකේ නිස්සග්ගියං පාචිත්තියං.

17. යෝ පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා ඒළකලෝමානි ධෝවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා විජටාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියං.

18. යෝ පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

සම්මුතියෙන් තොර ව අනෙක් අලුත් ඇතිරියක් කරවන්නේ නම්, නිසඟි පචිති වේ.

15. හිඳිනා ඇතිරියක් කරවන භික්ෂුව විසින් එය දුර්වර්ණ කරනු පිණිස පැරණි ඇතිරියේ හාත්පසින් සුගත වියතක් පමණ කොටසක් ගත යුතු ය. ඉදින් භික්ෂුවක් පැරණි ඇතිරියේ හාත්පසින් සුගත වියතක් නො ගෙන අලුත් හිඳින ඇතිරියක් කරවන්නේ නම්, නිසඟි පචිති වේ.

16. දීර්ඝ මාර්ගයකට පිළිපන් භික්ෂුවකට ම එළුලොම් ලැබෙන්නාහු නම් කැමති වන්නාවූ භික්ෂුවක් විසින් පිළිගත යුතු ය. පිළිගෙන ගෙන යෑමට කැපකරුවකු ද නැති නම් උපරිම තුන් යොදුනක් දක්වා සියතින් ගෙන යා යුත්තාහ. ඉදින් ගෙන යන්නකු නැති කල්හිදු තුන් යොදුන් ඉක්මවා ගෙනයන්නේ නම්, නිසඟි පචිති වේ.

17. යම් භික්ෂුවක් වනාහි නො නෑ භික්ෂුණියක් ලවා එළුලොම් සෝදවන්නේ නම් හෝ රදන් (පඬු) ගන්වන්නේ නම් හෝ අවුල් හරවන්නේ නම්, නිසඟි පචිති වේ.

18. යම් භික්ෂුවක් වනාහි රන්, රිදී, මසු කහවණු තෙමේ ගන්නේ නම් හෝ අනෙකෙකු ලවා ගන්වන්නේ නම් හෝ ගෙනැවිත් ළඟ තබන ලද්දක් සිතින් ඉවසන්නේ නම්, හෝ නිසඟි පචිති වේ.

19. යෝ පන භික්ඛු නානප්පකාරකං රූපියසංවෝහාරං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

20. යෝ පන භික්ඛු නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

කෝසියවග්ගෝ දුතියෝ.

❀ ❀ ❀

21. දසාහපරමං අතිරේකපත්තෝ ධාරේතබ්බෝ. තං අතික්කාමයතෝ නිස්සග්ගියං පාචිත්තියං.

22. යෝ පන භික්ඛු ඌනපඤ්චබන්ධනේන පත්තේන අඤ්ඤං නවං පත්තං චේතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

තේන භික්ඛුනා සෝ පත්තෝ භික්ඛුපරිසාය නිස්සජ්ජිතබ්බෝ.[1] යෝ ච තස්සා භික්ඛුපරිසාය පත්තපරියන්තෝ, සෝ තස්ස භික්ඛුනෝ පදාතබ්බෝ; අයං තේ භික්ඛු පත්තෝ යාව භේදනාය ධාරේතබ්බෝති. අයං තත්ථ සාමීචි.

23. යානි ඛෝ පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනීයානි භේසජ්ජානි, සෙය්‍යථීදං; සප්පි නවනීතං තේලං මධු ඵාණිතං, තානි පටිග්ගහෙත්වා

1. නිස්සජිතබ්බෝ (බු.ජ.මු.)

19. යම් භික්ෂුවක් වනාහි නන් වැදෑරුම් රන්, රිදී, මසු කහවණු ගනුදෙනු කිරීමට පැමිණෙන්නේ නම්, නිසඟි පචිති වේ.

20. යම් භික්ෂුවක් වනාහි නන් වැදෑරුම් භාණ්ඩ හුවමාරු ගනුදෙනු කිරීමට පැමිණෙන්නේ නම්, නිසඟි පචිති වේ.

## දෙවැනි කෝසිය වර්ගය යි.

❀ ❀ ❀

21. උපරිම දසදිනක් අතිරේක පාත්‍රයක්[1] දැරිය යුතු වේ. එය ඉක්මවන්නහුට, නිසඟි පචිති වේ.

22. යම් භික්ෂුවක් වනාහි බැඳුම් පසකට අඩුවෙන් ඇති පාත්‍රයක් ඇතිව අනික් අලුත් පාත්‍රයක් ඉල්වා ගන්නේ නම්, නිසඟි පචිති වේ.

ඒ භික්ෂුව විසින් ඒ ඉල්ලා ගත් පාත්‍රය භික්ෂූන් පිරිසෙහි නිස්සජ්ජනය කළ යුතු වේ. ඒ භික්ෂු පිරිස අන්තයෙහි යම් පාත්‍රයක් වේ ද එය ''මහණ නුඹ විසින් මේ පාත්‍රය බිඳෙන තෙක් දැරිය යුතු'' යැයි කියා එම භික්ෂුවට දිය යුතු වේ. මේ එහි අනුධර්මතාවය යි.

23. ගිලන් භික්ෂූන් විසින් වැළඳිය යුතු වූ යම් ඒ බෙහෙත් වෙත් ද, එනම් ගිතෙල් ය, වෙඬරු ය, තලතෙල් ආදී ය, මී පැණි ය, උක් සකුරු ය. ඒවා පිළිගෙන සත් දිනක් උපරිම

1. අතිරේක පාත්‍රයක් යනු අධිෂ්ඨානය හෝ විකප්පනය නො කළ පාත්‍රයකි.

සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි. තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං.

24. මාසො සේසො ගිම්හානන්ති භික්ඛුනා වස්සිකසාටිකචීවරං පරියේසිතබ්බං. අද්ධමාසො සේසො ගිම්හානන්ති කත්වා නිවාසේතබ්බං. ඕරේන චෙ මාසො සේසො ගිම්හානන්ති වස්සිකසාටිකචීවරං පරියේසෙය්‍ය, ඕරේනද්ධමාසො සේසො ගිම්හානන්ති කත්වා නිවාසෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

25. යො පන භික්ඛු භික්ඛුස්ස සාමං චීවරං දත්වා, කුපිතො අනත්තමනො අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියං.

26. යො පන භික්ඛු සාමං සුත්තං විඤ්ඤාපෙත්වා, තන්තවායේහි චීවරං වායාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

27. භික්ඛුං පනේව උද්දිස්ස අඤ්ඤාතකො ගහපති වා ගහපතානී වා තන්තවායේහි චීවරං වායාපෙය්‍ය, තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො තන්තවායේ උපසඞ්කමිත්වා චීවරේ විකප්පං ආපජ්ජෙය්‍ය; ඉදං ඛො ආවුසො චීවරං මං උද්දිස්ස වියාති, ආයතඤ්ච කරොථ විත්ථතඤ්ච, අප්පිතඤ්ච, සුවීතඤ්ච,

කොට ඇති කාලයක් සන්නිධි කොට වැළඳිය යුත්තාහ. එය ඉක්මවන්නහුට, නිසඟි පචිති වේ.

24. භික්ෂුවක් විසින් ගිම්හාන ඍතුවේ මාස හතරෙන් මාසයක් ඉතිරිව ඇත්තේ යැයි වැසි සළුව සෙවිය යුත්තේ ය. ගිම්හාන ඍතුවේ අඩමසක් ඉතිරිව ඇත්තේ යැයි හැඳිය යුතු ය. ඉදින් ගිම්හාන ඍතුවේ මාසයක් ඉතිරිව ඇති කාලයට මෙපිට සිට[1] වැසි සළුවක් සොයන්නේ නම්, ගිම්හාන ඍතුවේ අඩමසක් ඉතිරිව ඇති කාලයට මෙපිට සිට නිමවා හඳින්නේ නම්, නිසඟි පචිති වේ.

25. යම් භික්ෂුවක් වනාහි භික්ෂුවකට තෙමේ ම සිවුරක් දී, කිපියේ නො සතුටු සිත් ඇත්තේ පැහැර ගන්නේ නම් හෝ අනිකකු ලවා පැහැර ගන්වන්නේ නම්, නිසඟි පචිති වේ.

26. යම් භික්ෂුවක් වනාහි තෙමේ ම නූල් ඉල්වාගෙන රෙදි වියන්නන් ලවා සිවුරක් වියවන්නේ නම්, නිසඟි පචිති වේ.

27. භික්ෂුවක් ම උදෙසා නො නෑ ගෘහපතියකු හෝ ගෘහපතිනියක් හෝ රෙදි වියන්නන් ලවා සිවුරක් වියවන්නේ නම්, ඉදින් එහි ලා ඒ භික්ෂු තෙම පෙර නො පවරන ලද්දේ, රෙදි වියන්නන් වෙත එළඹ ''ඇවැත්නි, මේ සිවුර මා උදෙසා වියනු ලැබේ; දිගු ද කරවු; පළල් වූවක් ද, ඝනව නූල් එලන ලද්දක් ද, මනා කොට වියන ලද්දක් ද,

1. හේමන්ත ඍතුවේ මුළු කාලයත්, ගිම්හාන ඍතුවේ පළමු මාස තුනත් අයත් වේ.

සුප්පවායිතඤ්ච, සුවිලේඛිතඤ්ච, සුවිතච්ඡිතඤ්ච කරෝථ, අප්පේවනාම මයම්පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමාති. ඒවඤ්ච සෝ භික්ඛු වත්වා කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍ය, අන්තමසෝ පිණ්ඩපාතමත්තම්පි නිස්සග්ගියං පාචිත්තියං.

28. දසාහානාගතං කත්තිකතේමාසිකපුණ්ණමං භික්ඛුනෝ පනේව අච්චෙකචීවරං උප්පජ්ජෙය්‍ය, අච්චෙකං මඤ්ඤමානේන භික්ඛුනා පටිග්ගහේතබ්බං, පටිග්ගහෙත්වා යාව චීවරකාලසමයං නික්ඛිපිතබ්බං, තතෝ චේ උත්තරිං නික්ඛිපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

29. උපවස්සං ඛෝ පන කත්තිකපුණ්ණමං, යානි ඛෝ පන තානි ආරඤ්ඤකානි සේනාසනානි සාසඞ්කසම්මතානි, සප්පටිභයානි, තථාරූපේසු භික්ඛු සේනාසනේසු විහරන්තෝ ආකඞ්ඛමානෝ තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරේ නික්ඛිපෙය්‍ය, සියා ච තස්ස භික්ඛුනෝ කෝචිදේව පච්චයෝ තේන චීවරේන විප්පවාසාය, ඡාරත්තපරමං තේන භික්ඛුනා තේන චීවරේන විප්පවසිතබ්බං. තතෝ චේ උත්තරිං විප්පවසෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං.

සම සේ නූල් එලන ලද්දක් ද, මනා කොට හිරි අඳින ලද්දක් ද, මනා කොට මදින ලද්දක් ද කරවු; ඉදින් අපිදු ආයුෂ්මතුන්ලාට කිසිවක් දෙන්නෙමු නම් යෙහෙක'' යැයි සිවුරෙහි අධික විධානයට පැමිණෙන්නේ නම්, ඒ භික්ෂුව මෙසෙත් කියා කිසිවක්, යටත් පිරිසෙයින් පිණ්ඩපාත මාත්‍රයකුදු දෙන්නේ නම්, නිසඟි පචිති වේ.

28. දස දිනකින් නොපැමිණි වප් මස මැදි පොහොය දක්වා (වප් පොහොයට දස දිනක් තබා) භික්ෂුවකට ඉක්මන් කටයුත්තක් සඳහා පුදන සිවුරක් උපන්නේ නම්, ඉක්මන් සිවුරක් බව දත් භික්ෂුව විසින් පිළිගත යුතු ය. පිළිගෙන චීවරකාලසමය තෙක් තැබිය යුතු ය. ඉදින් ඉන්මත්තෙහි තබන්නේ නම්, නිසඟි පචිති වේ.

29. යම් ඒ සැක සහිත යැයි සම්මත, බිය සහිත වූ අරණ්‍ය සේනාසන වෙත් ද, එබඳු සෙනසුන් හි වසන භික්ෂුවක් කැමැත්තේ නම්, වස් වැස ඉල් මස මැදි පොහොය දක්වා කාලය තුළ තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගම තබන්නේ ය. ඒ භික්ෂුවට ඒ සිවුරෙන් වෙන් ව විසීමට කිසියම් හේතුවක් ඇත්තේ නම්, ඒ භික්ෂුව විසින් උපරිම සය රැයක් ඒ සිවුරෙන් වෙන් ව විසිය යුතු ය. ඉදින් ඉන් මත්තෙහි භික්ෂු සම්මුතියකින් හැර වෙන් ව වසන්නේ නම්, නිසඟි පචිති වේ.

30. යෝ පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනෝ පරිණාමෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

පත්තවග්ගෝ තතියෝ.

උද්දිට්ඨා ඛෝ ආයස්මන්තෝ තිංසනිස්සග්ගියා පාචිත්තියා ධම්මා.
තත්ථායස්මන්තේ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
පරිසුද්ධෙත්ථායස්මන්තෝ තස්මා තුණ්හී, ඒවමේතං ධාරයාමීති.

නිස්සග්ගියා පාචිත්තියා ධම්මා නිට්ඨිතා.

## (5) පාචිත්තියා ධම්මා

ඉමෙ ඛෝ පනායස්මන්තෝ ද්වේ නවුති පාචිත්තියා ධම්මා උද්දේසං ආගච්ඡන්ති.

1. සම්පජානමුසාවාදේ පාචිත්තියං.
2. ඕමසවාදේ පාචිත්තියං.
3. භික්ඛුපේසුඤ්ඤේ පාචිත්තියං.

30. යම් භික්ෂුවක් වනාහි දැන දැන සඟසතු, සංඝයාවෙත පිරිනැමූ ලාභය තමාට පිරිනම වන්නේ නම්, නිසඟි පචිති වේ.

## තෙවැනි පාත්‍ර වර්ගය යි.

ආයුෂ්මත්වරුනි! තිස් නිසඟි පචිති ධර්මයෝ උදෙසන ලද්දාහු ය.
එහි ලා ආයුෂ්මතුන් වහන්සේලා විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
දෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
තෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධය හ. නිහඬ එබැවිනි. 'මෙසේ මෙය ධරමි' යැයි

## නිසඟි පචිති ධර්මයෝ අවසන් ය.

# (5) ශුද්ධ පචිති ධර්මයෝ

ඇවැත්නි! මේ දෙඅනූ පචිති ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1. දැන දැන බොරු කීමෙහි පචිති වේ.

2. ඕමසවාදයෙහි[1] පචිති වේ.

3. භික්ෂූන්ගේ කේලාම් කීමෙහි පචිති වේ.

1. ජාති, නාම, ගෝත්‍ර, කම්ම, සිප්ප, ආබාධ, ලිංග, කිලේස, ආපත්ති, අක්කෝස යන දස ආකාරයන්ගෙන් ගටා ආක්‍රෝෂ කිරීමෙහි.

4. යො පන භික්ඛු අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙය්‍ය පාචිත්තියං.

5. යො පන භික්ඛු අනුපසම්පන්නේන උත්තරිං[1] දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං.

6. යො පන භික්ඛු මාතුගාමේන සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං.

7. යො පන භික්ඛු මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දේසෙය්‍ය, අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන පාචිත්තියං.

8. යො පන භික්ඛු අනුපසම්පන්නස්ස උත්තරිමනුස්සධම්මං ආරෝචෙය්‍ය භූතස්මිං පාචිත්තියං.

9. යො පන භික්ඛු භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරෝචෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා පාචිත්තියං.

10. යො පන භික්ඛු පඨවිං[2] ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා පාචිත්තියං.

මුසාවාදවග්ගො පඨමො.

11. භූතගාමපාතව්‍යතාය[3] පාචිත්තියං.

---

1. උත්තරිදිරත්තතිරත්තං (මා.පා.)
2. පඨවිං (මා.පා.)
3. භූතගාමපාතබ්‍යතාය (මා.පා.)

4. යම් භික්ෂුවක් වනාහි අනුපසම්පන්නයෙකුට පද වශයෙන් ධර්මය කියවන්නේ නම්, පචිති වේ.

5. යම් භික්ෂුවක් වනාහි අනුපසම්පන්නයෙකු සමග දෙතුන් රැයක් ඉක්මවා[1] නිදන්නේ නම්, පචිති වේ.

6. යම් භික්ෂුවක් වනාහි ස්ත්‍රියක සමග නිදන්නේ නම්, පචිති වේ.

7. යම් භික්ෂුවක් වනාහි නුවණැති පුරුෂයකු නොමැති ව ස්ත්‍රියකට වචන පහ හයකට වැඩියෙන් දහම් දෙසන්නේ නම්, පචිති වේ.

8. යම් භික්ෂුවක් වනාහි අනුපසම්පන්නයෙක් හට උතුරුමිනිස්දම් කියන්නේ නම්, (ඒවා තමා වෙත) විද්‍යමාන වන කල්හි, පචිති වේ.

9. යම් භික්ෂුවක් වනාහි භික්ෂු සම්මුතියකින් තොර ව භික්ෂුවකගේ දුහුල් ඇවැතක් අනුපසම්පන්නයෙකුට කියන්නේ නම්, පචිති වේ.

10. යම් භික්ෂුවක් වනාහි පොළොව සාරන්නේ නම් හෝ සාරවන්නේ නම්, පචිති වේ.

## පළමුවැනි මුසාවාද වර්ගය යි.

11. වැඩෙන ගහකොළ[2] සිඳීමෙන් පචිති වේ.

1. සිවුවන දිනයේ හිරු බැස ගිය කල්හි හිඳීමෙන් ඇවැත් වේ.
2. භූතගාමයෙන් වෙන් කරන ලද බීජ ගාමයන්ට හානි සිදු කිරීමෙන් දුකුලා වේ. බීජගාම කැප කරවා ගැනීම පිළිබඳ, උපග්‍රන්ථය - II (ඊ) බලනු මැනවි.

12. අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තියං.

13. උජ්ඣාපනකෙ ඛීයනකෙ පාචිත්තියං.

14. යො පන භික්ඛු සඞ්ඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා කොච්ඡං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා, තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය, අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය පාචිත්තියං.

15. යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා, තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය, අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය පාචිත්තියං.

16. යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ ජානං පුබ්බූපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙය්‍ය; යස්ස සම්බාධො භවිස්සති සො පක්කමිස්සතීති, එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං.

17. යො පන භික්ඛු භික්ඛුං කුපිතො අනත්තමනො සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා පාචිත්තියං.

18. යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ උපරිවෙහාසකුටියා, ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා අභිනිසීදෙය්‍ය[1] වා අභිනිපජ්ජෙය්‍ය වා, පාචිත්තියං.

1. සහසා අභිනිසීදෙය්‍ය (බු.ජ.මු.)

12. සඟ මැද විචාල දෙය හැර අනෙකක් කීමෙහි ද, නිහඬව හිඳීමෙන් සංඝයා වෙහෙස කරවීමෙහි ද පචිති වේ.

13. ලමු කොට සිත වීමෙහි නුගුණ කීමෙහි පචිති වේ.

14. යම් භික්ෂුවක් වනාහි සඟසතු ඇඳක් හෝ පුටුවක් හෝ මෙට්ටයක් හෝ කොච්ඡයක්[1] හෝ එළිමහනෙහි අතුරා හෝ අනුන් ලවා අතුරවා ආරාමයෙන් පිටව යන විට නැවත තැන්පත් නො කරන්නේ නම් හෝ අනුන් ලවා තැන්පත් නො කරවන්නේ නම් හෝ අනිකකුට ඒ බව නො දන්වා පිටව යන්නේ නම්, පචිති වේ.

15. යම් භික්ෂුවක් වනාහි සඟසතු විහාරයක් තුළ දී සෙනසුන් අතුරා හෝ අනුන් ලවා අතුරවා පිටව යන විට නැවත තැන්පත් නො කරන්නේ නම් හෝ අනුන් ලවා තැන්පත් නො කරවන්නේ නම් හෝ අනිකකුට ඒ බව නො දන්වා පිටව යන්නේ නම්, පචිති වේ.

16. යම් භික්ෂුවක් වනාහි සඟසතු විහාරයක දැන දැන, කලින් පැමිණි භික්ෂූන් අතුරෙහි පිවිස ''යමෙකුට බාධා වන්නේ නම් හෙතෙම බැහැර යන්නේ'' යැයි අනෙකක් නො ව මෙය ම හේතු කොටගෙන සයනය කරන්නේ නම්, පචිති වේ.

17. යම් භික්ෂුවක් වනාහි කෝපවූයේ නො සතුටු සිතැත්තේ භික්ෂුවක් සඟසතු විහාරයකින් නෙරපන්නේ නම් හෝ අනුන්ලවා නෙරපවන්නේ නම්, පචිති වේ.

18. යම් භික්ෂුවක් වනාහි සඟසතු විහාරයක වේහාස කුටියක[2] මත්තෙහි ඇති අටනිය විද සවි කළ පා ඇති ඇඳක හෝ පුටුවක හිඳගන්නේ නම් හෝ නිදන්නේ නම්, පචිති වේ.

1. කොච්ඡයක් යනු වැහැරි ආදියකින් කරන ලද, වෙළා බඳින ලද අසුනකි.
2. වේහාස කුටිය නම් මතු තලයෙහි නොම අතුරණ ලද දෙමහල් හෝ තෙමහල් කුටිය වේ.

19. මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානේන, යාව ද්වාරකෝසා අග්ගලට්ඨපනාය ආලෝකසන්ධිපරිකම්මාය ද්වත්තිච්ඡදනස්ස පරියායං අප්පහරිතේ ඨිතේන අධිට්ඨාතබ්බං. තතෝ චේ උත්තරිං අප්පහරිතේපි ඨිතෝ අධිට්ඨහෙය්‍ය පාචිත්තියං.

20. යෝ පන භික්ඛු ජානං සප්පාණකං උදකං, තිණං වා මත්තිකං වා සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා පාචිත්තියං.

භූතගාමවග්ගෝ දුතියෝ.

21. යෝ පන භික්ඛු අසම්මතෝ භික්ඛුනියෝ ඔවදෙය්‍ය පාචිත්තියං.

22. සම්මතෝපි චේ භික්ඛු අත්ථඞ්ගතේ සූරියේ භික්ඛුනියෝ ඔවදෙය්‍ය පාචිත්තියං.

23. යෝ පන භික්ඛු භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියෝ ඔවදෙය්‍ය, අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයෝ; ගිලානා හෝති භික්ඛුනී අයං තත්ථ සමයෝ.

24. යෝ පන භික්ඛු ඒවං වදෙය්‍ය; ආමිසහේතු භික්ඛූ[1] භික්ඛුනියෝ ඔවදන්තීති පාචිත්තියං.

1. ආමිසහේතු ථේරා භික්ඛූ (මා.පා.)

19. මහල්ලක විහාරයක්[1] කරවන භික්ෂුවක් විසින් දොරගුළු තරවනු පිණිස ද වාකවුළු පිරියම් පිණිස ද, දොර උළුවහු අවට රියන් දෙකහමාරක් දක්වා බිත්තියට නැවත නැවත මැටි, බදාම ආදිය ගැසීම කළ යුතු ය. එහි සෙවිළි කරන වහළයට ද (ධාන්‍ය වගා භෝග ආදී) වැවිලි නැති තැනක සිට දෙතුන් වරක් විධාන දිය හැකි ය. ඉදින් දෙතුන් වරකට වැඩියෙන් වැවිලි නැති තැනක ද හිඳ විධාන කරන්නේ නම්, පචිති වේ.

20. යම් භික්ෂුවක් වනාහි දැන දැන ප්‍රාණීන් සහිත ජලය තණ කොළවලට හෝ මැටිවලට හෝ ඉසින්නේ නම් හෝ ඉස්සවන්නේ නම්, පචිති වේ.

## දෙවැනි භූතගාම වර්ගය යි.

❀ ❀ ❀

21. යම් භික්ෂුවක් වනාහි සම්මත නො කරන ලදුයේ භික්ෂුණීන්ට අෂ්ඨ ගරු ධර්ම වලින් අවවාද දෙන්නේ නම්, පචිති වේ.

22. ඉදින් සම්මත කරන ලද භික්ෂුවක් නමුදු හිරු බැස ගිය කල්හි භික්ෂුණීන්ට අවවාද දෙන්නේ නම්, පචිති වේ.

23. යම් භික්ෂුවක් වනාහි සුදුසු සමය හැර භික්ෂුණී ආරාමයට ගොස් භික්ෂුණීන්ට අවවාද දෙන්නේ නම්, පචිති වේ. එහි මේ සුදුසු සමය යි; භික්ෂුණියක් ගිලන් වූවා වේ නම්, මේ එහි සුදුසු සමය යි.

24. යම් භික්ෂුවක් වනාහි ''භික්ෂූහු ආමිස හේතු කොටගෙන භික්ෂුණීන්ට අවවාද දෙත්'' යැයි මෙසේ කියන්නේ නම්, පචිති වේ.

1. මහල්ලක විහාරයක් යනු කරවාදෙන දායකයන් ඇති විහාරයකි.

25. යෝ පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය, අඤ්ඤත්‍ර පාරිවට්ටකා පාචිත්තියං.

26. යෝ පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බෙය්‍ය වා සිබ්බාපෙය්‍ය වා පාචිත්තියං.

27. යෝ පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය ඒකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය, අන්තමසෝ ගාමන්තරම්පි, අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයෝ; සත්ථගමනීයෝ හෝති මග්ගෝ සාසඞ්කසම්මතෝ සප්පටිභයෝ අයං තත්ථ සමයෝ.

28. යෝ පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය ඒකං නාවං අභිරූහෙය්‍ය, උද්ධගාමිනිං[1] වා අධෝගාමිනිං වා, අඤ්ඤත්‍ර තිරියං තරණාය පාචිත්තියං.

29. යෝ පන භික්ඛු ජානං භික්ඛුනීපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය, අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහීසමාරම්භා පාචිත්තියං.

30. යෝ පන භික්ඛු භික්ඛුනියා සද්ධිං ඒකෝ ඒකාය රහෝ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං.

භික්ඛුනෝවාදවග්ගෝ[2] තතියෝ.

❀ ❀ ❀

1. උද්ධං ගාමිනිං (මා.පා.)
2. ඕවාදවග්ගෝ (මා.පා.)

25. යම් භික්ෂුවක් වනාහි නො නෑ භික්ෂුණියකට (යටත් පිරිසෙයින් අරළු කඩකුදු) මාරුකර ගැනීමක් නැති ව සිවුරක් දෙන්නේ නම්, පචිති වේ.

26. යම් භික්ෂුවක් වනාහි නො නෑ භික්ෂුණියකගේ සිවුරක් මසන්නේ නම් හෝ, අනුන් ලවා මස්සවන්නේ නම්, පචිති වේ.

27. යම් භික්ෂුවක් වනාහි සුදුසු සමය හැර භික්ෂුණියක් සමග සංවිධාන වී එක් දීර්ඝ මාර්ගයකට යටත් පිරිසෙයින් ගමකින් ගමකට හෝ පිවිසෙන්නේ නම්, පචිති වේ. එහි ලා මේ සුදුසු සමය යි; මාර්ගය, ගැල් සාත්තුවක් සමග යා යුතු වෙයි; සැක සහිත යැයි සම්මත වෙයි; බිය සහිත වෙයි; මේ එහි සුදුසු සමය යි.

28. යම් භික්ෂුවක් වනාහි භික්ෂුණියක් සමග සංවිධාන වී ගඟ හරහා එතෙර වීම හැර උඩුගං බලා යන්නා වූ හෝ යටිගං බලා යන්නා වූ හෝ එක් නැවකට නඟින්නේ නම්, පචිති වේ.

29. යම් භික්ෂුවක් වනාහි දැන දැන කලින් ගිහි අය පිළියෙළ කළ දෙයක් හැර භික්ෂුණියක විසින් පිළියෙළ කරවන ලද පිණ්ඩපාතයක් වළඳන්නේ නම්, පචිති වේ.

30. යම් භික්ෂුවක් වනාහි හුදකලා වූයේ, හුදකලා භික්ෂුණියක් සමග රහසිගත ව (වැසුණු තැනක) හිඳීම කරන්නේ නම්, පචිති වේ.

තෙවැනි භික්ඛුනෝවාද වර්ගය යි.

31. අගිලානේන භික්ඛුනා ඒකෝ ආවසථපිණ්ඩෝ භුඤ්ජිතබ්බෝ, තතෝ චේ උත්තරිං භුඤ්ජෙය්‍ය පාචිත්තියං.

32. ගණභෝජනේ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො; ගිලානසමයෝ චීවරදානසමයෝ, චීවරකාරසමයෝ අද්ධානගමනසමයෝ නාවාභිරූහනසමයෝ මහාසමයෝ සමණභත්තසමයෝ, අයං තත්ථ සමයෝ.

33. පරම්පරභෝජනේ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයෝ; ගිලානසමයෝ චීවරදානසමයෝ චීවරකාරසමයෝ, අයං තත්ථ සමයෝ.

34. භික්ඛුං පනේව කුලං උපගතං පූවේහි වා මන්ථේහි වා අභිහට්ඨුං පවාරෙය්‍ය, ආකඞ්ඛමානේන භික්ඛුනා ද්වත්තිපත්තපූරා පටිග්ගහේතබ්බා. තතෝ චේ උත්තරිං පටිග්ගණ්හෙය්‍ය[1] පාචිත්තියං. ද්වත්තිපත්තපූරේ පටිග්ගහෙත්වා තතෝ නීහරිත්වා භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බං. අයං තත්ථ සාමීචි.

35. යෝ පන භික්ඛු භුත්තාවී පවාරිතෝ අනතිරිත්තං ඛාදනීයං වා භෝජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං.

1. පටිගණ්හෙය්‍ය (බු.ජ.මු.)

31. නො ගිලන් භික්ෂුවක් විසින් එක් ආවසථ පිඬුවක්[1] වැළඳිය යුතු ය. ඉදින් ඊට වැඩි වාරයක් වළඳන්නේ නම්, පචිති වේ.

32. සුදුසු කාලය හැර ගණ බොජුනෙහි,[2] පචිති වේ. එහි මේ සුදුසු කාලය යි. ගිලන් කාලය ය; සිවුරු දෙන කාලය ය; සිවුරු කරවන කාලය ය; දීර්ඝ ගමනකට පිළිපන් කාලය ය; නැව් නගින කාලය ය; භික්ෂූන් වැඩි කාලය හා ශාසනයේ හෝ ඉන්පිට පැවිද්දකු විසින් සකස් කළ දානයක් පවතින කාලය යන මේ එහි සුදුසු කාලය යි.

33. සුදුසු කාලය හැර පරම්පර බොජුනෙහි[3] පචිති වේ. එහි මේ සුදුසු කාලය යි. ගිලන් කාලය ය; සිවුරු දෙන කාලය ය; සිවුරු කරවන කාලය යන මේ එහි සුදුසු කාලය යි.

34. කුලයකට එළඹුනාවූ භික්ෂුවකට කැවුම්[4] වලින් හෝ අග්ගලා[5] වලින් හෝ කැමතිතාක් පවරන්නේ නම්, කැමති වන්නා වූ භික්ෂුව විසින් පිරූ පාත්‍ර දෙක තුනක් පිළිගත යුත්තාහ. ඉදින් තුන් පාත්‍රයකට වඩා වැඩිපුර පිළිගන්නේ නම්, පචිති වේ. පිරූ පාත්‍ර දෙක තුනක් පිළිගෙන ඉන් බැහැරට ගෙන ගොස් භික්ෂූන් සමග බෙදා ගත යුතු ය. මේ එහි අනුධර්මතාවය යි.

35. යම් භික්ෂුවක් වනාහි වළඳන ලදුයේ, කළ පවාරණය[6] ඇතියේ අතිරික්ත නො කළ කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් කන්නේ නම් හෝ බුදින්නේ නම්, පචිති වේ.

1. උපග්‍රන්ථය - II ( උ) 2. උපග්‍රන්ථය - II (ඌ) 3. උපග්‍රන්ථය - II (එ) බලනු මැනවි.
4. යම් තැනකට ගෙනයාම සඳහා පිළියෙළ කරන ලද කැවුම්.
5. මග වියදම සඳහා පිළියෙළ කරන ලද අග්ගලා.
6. උපග්‍රන්ථය - II (ඒ) බලනු මැනවි.

36. යෝ පන භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං, අනතිරිත්තේන ඛාදනීයේන වා භෝජනීයේන වා අභිහට්ඨුං පවාරෙය්‍ය; හන්ද භික්ඛු ඛාද වා භුඤ්ජ වාති, ජානං ආසාදනාපෙක්ඛෝ භුත්තස්මිං පාචිත්තියං.

37. යෝ පන භික්ඛු විකාලේ ඛාදනීයං වා භෝජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං.

38. යෝ පන භික්ඛු සන්නිධිකාරකං ඛාදනීයං වා භෝජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං.

39. යානි ඛෝ පන තානි පණීතභෝජනානි සෙය්‍යථීදං; සප්පි නවනීතං තේලං මධු ඵාණිතං මච්ඡෝ මංසං ඛීරං දධි. යෝ පන භික්ඛු ඒවරූපානි පණීතභෝජනානි අගිලානෝ අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පාචිත්තියං.

40. යෝ පන භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය, අඤ්ඤත්‍ර උදකදන්තපෝනා පාචිත්තියං.

භෝජනවග්ගෝ චතුත්ථෝ.

❀ ❀ ❀

36. යම් භික්ෂුවක් වනාහි වළඳා පවාරණය වූ භික්ෂුවකට පවාරණය වූ බව දැන දැන ''භික්ෂුව කව කියා හෝ බුදිව කියා'' හෝ අතිරිත්ත නො කළ කෑ යුතු දෙයින් හෝ බුදිය යුතු දෙයින් චෝදනා කරනු කැමතිව කැමතිතාක් ගැනීමට පවරන්නේ නම්, වැළඳූ කෙනෙහි පචිති වේ.

37. යම් භික්ෂුවක් වනාහි විකාලයෙහි කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් කන්නේ නම් හෝ බුදින්නේ නම්, පචිති වේ.

38. යම් භික්ෂුවක් වනාහි පිළිගෙන තැන්පත් කර තැබූ එක් රැයක් ඉක්ම වූ කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් කන්නේ නම් හෝ බුදින්නේ නම්, පචිති වේ.

39. යම් ඒ ප්‍රණීත බොජුන් වෙත් ද, එනම් ගිතෙල් ය, වෙඬරු ය, තෙල් ය (තල ආදී), මී පැණි ය, උක් සකුරු ය, දියමස් ය, ගොඩමස් ය, කිරි ය, දී ය. යම් භික්ෂුවක් වනාහි නො ගිලන් ව මෙබඳු ප්‍රණීත බොජුන් තමා පිණිස ඉල්ලාගෙන වළඳන්නේ නම්, පචිති වේ.

40. යම් භික්ෂුවක් වනාහි පැන් හා දැහැටි හැර යම් නොපිළිගත් ආහාරයක් මුව දොරට (උගුරට) ගන්නේ නම්, පචිති වේ.

සිවුවැනි භෝජන වර්ගය යි.

41. යෝ පන භික්ඛු අචේලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භෝජනීයං වා දදෙය්‍ය පාචිත්තියං.

42. යෝ පන භික්ඛු භික්ඛුං[1], ඒහාවුසෝ ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමාති, තස්ස දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යෝජෙය්‍ය; ගච්ඡාවුසෝ න මේ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හෝති, ඒකකස්ස මේ කථා වා නිසජ්ජා වා ඵාසු හෝතීති, ඒතදේව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං.

43. යෝ පන භික්ඛු සභෝජනේ කුලේ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං.

44. යෝ පන භික්ඛු මාතුගාමේන සද්ධිං රහෝ පටිච්ඡන්නේ ආසනේ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං.

45. යෝ පන භික්ඛු මාතුගාමේන සද්ධිං ඒකෝ ඒකාය රහෝ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං.

46. යෝ පන භික්ඛු නිමන්තිතෝ සභත්තෝ සමානෝ සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරේභත්තං වා පච්ඡාභත්තං වා කුලේසු චාරිත්තං ආපජ්ජෙය්‍ය, අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්ථායං සමයෝ; චීවරදානසමයෝ චීවරකාරසමයෝ, අයං තත්ථ සමයෝ.

1. මෙහිලා 'භික්ඛුං ඒවං වදෙය්‍ය' යනුවෙන් ඇතැම් විට උදේසීම කළත් බුද්ධ ජයන්ති, මරම්ම (බුරුමරට) ඡට්ඨසංගායනා, හේවාවිතාරණ යන ත්‍රිපිටක සංස්කරණයන්හි 'ඒවං වදෙය්‍ය' යන්න දක්නට නොලැබේ.

41. යම් භික්ෂුවක් වනාහි අචේලකයෙකුට[1] හෝ පරිබ්‍රාජකයෙකුට[2] හෝ පරිබ්‍රාජිකාවකට[3] සියතින් කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් දෙන්නේ නම්, පචිති වේ.

42. යම් භික්ෂුවක් වනාහි භික්ෂුවක්හට ''ඇවැත්නි එව, ගමට හෝ නියම් ගමට හෝ පිඬු පිණිස පිවිසෙන්නෙමු''යි මෙසේ කියන්නේ ඒ භික්ෂුවට දෙවා හෝ නො දෙවා හෝ ''ඇවැත්නි යව; නුඹ සමග කථාව හෝ හිඳීම හෝ මට පහසු නො වේ; එකලා වූ මට කථා කිරීම හෝ හිඳීම පහසු වෙයි'' යැයි අන් කරුණක් නොමැති ව මෙය ම හේතු කොටගෙන එතැනින් පිටත් කර යවන්නේ නම්, පචිති වේ.

43. යම් භික්ෂුවක් වනාහි අඹු සැමි යුවළ පමණක් සිටින නිවසකට ඇතුළු වී, හිඳීම කරන්නේ නම්, පචිති වේ.

44. යම් භික්ෂුවක් වනාහි ස්ත්‍රියක් සමග රහසිගතව, පිළිසන් අසුනක එකට හිඳින්නේ නම්, පචිති වේ.

45. යම් භික්ෂුවක් වනාහි හුදකලා වූයේ හුදකලා වූ ස්ත්‍රියක සමග රහසිගත තැනක හිඳින්නේ නම්, පචිති වේ.

46. යම් භික්ෂුවක් වනාහි නිමන්ත්‍රණ ලදුයේ බොජුන් සහිත වූයේ සුදුසු කාලයෙහි හැර විද්‍යමාන භික්ෂුවක් නො විචාරා පෙරබතෙහි හෝ පසුබතෙහි හෝ අන්‍ය කුලයන්හි හැසිරීමට පැමිණෙන්නේ නම්, පචිති වේ. එහි මේ සුදුසු සමය යි; සිවුරු දෙන සමය ය; සිවුරු කරන සමය ය; යන මේ එහි සුදුසු සමය යි.

1. නග්නයකු හට.
2. භික්ෂුවය, සාමණේරයාය යන දෙදෙනා හැර සෙසු පැවිද්දකුට.
3. භික්ෂුණිය, සික්ඛමානාව, සාමණේරිය හැර සෙසු මෙහෙණියකට.

47. අගිලානේන භික්ඛුනා චාතුමාසප්පච්චයපවාරණා සාදිතබ්බා. අඤ්ඤත්‍ර පුනපවාරණාය අඤ්ඤත්‍ර නිච්චපවාරණාය, තතෝ චේ උත්තරිං සාදියෙය්‍ය පාචිත්තියං.

48. යෝ පන භික්ඛු උය්‍යුත්තං සේනං දස්සනාය ගච්ඡෙය්‍ය, අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියං.

49. සියා ච තස්ස භික්ඛුනෝ කෝචිදේව පච්චයෝ සේනං ගමනාය දිරත්තතිරත්තං තේන භික්ඛුනා සේනාය වසිතබ්බං. තතෝ චේ උත්තරිං වසෙය්‍ය පාචිත්තියං.

50. දිරත්තතිරත්තඤ්චේ භික්ඛු සේනාය වසමානෝ උය්‍යෝධිකං වා බලග්ගං වා සේනාබ්‍යූහං වා අනීකදස්සනං වා ගච්ඡෙය්‍ය පාචිත්තියං.

### අචේලකවග්ගෝ පඤ්චමෝ.

❀ ❀ ❀

51. සුරාමේරයපානේ පාචිත්තියං.

52. අඞ්ගුලිපතෝදකේ පාචිත්තියං.

53. උදකේ හස්සධම්මේ[1] පාචිත්තියං.

54. අනාදරියේ පාචිත්තියං.

1. හසධම්මේ (ම.ඡ.සං.)

47. නො ගිලන් භික්ෂුවක් විසින් නැවත නැවත පැවරීම හා නිති පැවරීම හැර මාස හතරක බෙහෙතින් කරන පැවරීම ඉවසිය යුතු ය. ඉදින් එයට වැඩි කාලයක් තුළ ඉවසන්නේ නම්, පචිති වේ.

48. යම් භික්ෂුවක් වනාහි සුදුසු කරුණක දී හැර යුද්ධයට නික්මුණු භට සේනා දැකීමට යන්නේ නම්, පචිති වේ.

49. යම් ඒ භික්ෂුවට, සේනාවට යාම පිණිස කිසියම් කරුණක් වේ නම් ඒ භික්ෂුව විසින් දෙතුන් රැයක් සේනාවෙහි විසිය යුතු ය. ඉදින් ඉන් මත්තෙහි තුන් රැයකට වැඩිය වසන්නේ නම්, පචිති වේ.

50. ඉදින් දෙතුන් රැයක් සේනාවෙහි වසන්නාවූ භික්ෂුව රණබිමට හෝ බලසෙන් ගණින තැනට හෝ සේනාව කඳවුරු බැඳි තැනට හෝ බලඇණි දැකීමට යන්නේ නම්, පචිති වේ.

## පස්වැනි අචේලක වර්ගය යි.

51. සුරා හා මේරය[1] බීමෙහි පචිති වේ.

52. ඇඟිලිවලින් කිති කැවීමෙහි පචිති වේ.

53. ජලයෙහි ක්‍රීඩා කිරීමෙහි පචිති වේ.

54. අනදර[2] කිරීමෙහි පචිති වේ.

1. උපග්‍රන්ථය - II (ඔ) බලනු මැනවි.
2. සිකපදයෙන් අවවාද කළ පුද්ගලයාට හෝ ධර්මයට.

55. යො පන භික්ඛු භික්ඛුං භිංසාපෙය්‍ය පාචිත්තියං.

56. යො පන භික්ඛු අගිලානො විසිබ්බනාපෙක්ඛො,[1] ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා, අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියං.

57. යො පන භික්ඛු ඔරේනද්ධමාසං නහායෙය්‍ය, අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො; දියඩ්ඪො මාසො සේසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චේතෙ අඩ්ඪතෙය්‍යමාසා උණ්හසමයො, පරිළාහසමයො ගිලානසමයො කම්මසමයො, අද්ධානගමනසමයො වාතවුට්ඨිසමයො. අයං තත්ථ සමයො.

58. නවං පන භික්ඛුනා චීවරලාභේන තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං ආදාතබ්බං, නීලං වා කද්දමං වා කාළසාමං වා. අනාදා චෙ භික්ඛු තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං.

59. යො පන භික්ඛු භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණේරස්ස වා සාමණේරියා වා සාමං චීවරං විකප්පෙත්වා,

1. විසිබ්බනාපේඛො (බු.ජ.මු.)

55. යම් භික්ෂුවක් වනාහි භික්ෂුවක බිය ගන්වන්නේ නම්, පචිති වේ.

56. යම් භික්ෂුවක් වනාහි නො ගිලන් වූයේ, ගිණි තපිනු කැමැත්තේ සුදුසු කරුණක් නොමැති ව, ගිනි දල්වන්නේ නම් හෝ දල්වවන්නේ නම්, පචිති වේ.

57. යම් භික්ෂුවක් වනාහි සුදුසු කාලයේ හැර අඩමසකින් මෙපිට නහන්නේ නම්, පචිති වේ. එහි මේ සුදුසු කාලය යි; ගිම්හාන ඍතුවේ අවසන් මාස එකහමාර, වස්සාන ඍතුවේ පළමු මාසය යන මේ මාස දෙකහමාර උණුසුම් කාලය ය; පරිදාහ කාලය ය; ගිලන් කාලය ය; කර්මාන්ත සිදුකරන කාලය ය; දීර්ඝ ගමන් යන කාලය ය; දූහුවිලි සහිත සුළඟ හා මඳ වැසි පවතින (වාතවුට්ඨි) කාලය ය යන මේ එහි සුදුසු කාලය යි.

58. අලුත් සිවුරක්[1] ලත් භික්ෂුව විසින් නිල් පැහැය,[2] මඩ පැහැය, කළු පැහැය යන තෙවැදෑරුම් දුර්වර්ණ කිරීම් අතුරින් එක්තරා දුර්වර්ණ කිරීමක් ගත යුත්තේ ය. (කප්බිංදු තැබිය යුත්තේ ය). ඉදින් භික්ෂුවක් තෙවැදෑරුම් දුර්වර්ණ කිරීම් අතරින් එක්තරා දුර්වර්ණ කිරීමක් නො ගෙන අලුත් සිවුරක් පරිභෝග කරන්නේ නම්, පචිති වේ.

59. යම් භික්ෂුවක් වනාහි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ සික්ඛමානාවකට හෝ සාමණේරයකුට හෝ සාමණේරියකට හෝ තමා විසින් සිවුරක් විකල්පනය කර

1. අලුත් සිවුරක් යනු කප්බිංදු නො තැබූ සිවුරකි.
2. නිල් පැහැය කංස නීල හෝ පලාස නීල යනුවෙන් දෙ වැදෑරුම් වේ.

අපච්චුද්ධාරකං[1] පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං.

60. යො පන භික්ඛු භික්ඛුස්ස පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙය්‍ය වා අපනිධාපෙය්‍ය වා අන්තමසො හස්සාපෙක්ඛොපි,[2] පාචිත්තියං.

සුරාපානවග්ගො ඡට්ඨො.

❀ ❀ ❀

61. යො පන භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍ය පාචිත්තියං.

62. යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං.

63. යො පන භික්ඛු ජානං යථාධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙය්‍ය පාචිත්තියං.

64. යො පන භික්ඛු භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙය්‍ය පාචිත්තියං.

65. යො පන භික්ඛු ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය, සො ච පුග්ගලො අනුපසම්පන්නො තෙ ච භික්ඛූ ගාරය්හා, ඉදං තස්මිං පාචිත්තියං.

1. අපච්චුද්ධාරණං (ම.ඡ.සං.)
2. හසාපෙක්ඛොපි (ම.ඡ.සං.) / හස්සාපේඛෝපි (හේ.වි.මු.)

නැවත පච්චුද්ධාරය නො කර පරිභෝග කරන්නේ නම්, පචිති වේ.

60. යම් භික්ෂුවක් වනාහි යටත් පිරිසෙයින් ක්‍රීඩා පිණිස හෝ භික්ෂුවකගේ පාත්‍රයක් හෝ සිවුරක් හෝ නිසීදනයක් හෝ ඉදිකටු ගුළාවක් හෝ ඉණ පටියක් හෝ සඟවන්නේ නම් හෝ සඟවවන්නේ නම්, පචිති වේ.

## හයවැනි සුරාපාන වර්ගය යි.

❀ ❀ ❀

61. යම් භික්ෂුවක් වනාහි දැන දැන සතෙකු දිවියෙන් තොර කරන්නේ නම්, පචිති වේ.

62. යම් භික්ෂුවක් වනාහි දැන දැන ප්‍රාණීන් සහිත ජලය පරිභෝග කරන්නේ නම්, පචිති වේ.

63. යම් භික්ෂුවක් වනාහි දැන දැන ධර්මය වූ පරිද්දෙන් සන්සිඳුවන ලද අධිකරණයක් නැවත විසඳීම සඳහා මතු කරන්නේ නම්, පචිති වේ.

64. යම් භික්ෂුවක් වනාහි දැන දැන භික්ෂුවකගේ දුහුල් ඇවැතක් සඟවන්නේ නම්, පචිති වේ.

65. යම් භික්ෂුවක් වනාහි දැන දැන වයස විස්සට අඩු පුද්ගලයෙකු උපසම්පදා කරවන්නේ නම් ඒ පුද්ගල තෙමේ ද අනුපසම්පන්න වේ. කාරක භික්ෂූන් වහන්සේලා ද ගැරහිය යුත්තෝ වෙත්. ඒ උපාධ්‍යායයන් වහන්සේ කෙරෙහි, මේ පචිතිය වේ.

66. යො පන භික්ඛු ජානං ථෙය්‍යසත්ථේන සද්ධිං සංවිධාය ඒකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය, අන්තමසො ගාමන්තරම්පි පාචිත්තියං.

67. යො පන භික්ඛු මාතුගාමේන සද්ධිං සංවිධාය ඒකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය, අන්තමසො ගාමන්තරම්පි පාචිත්තියං.

68. යො පන භික්ඛු ඒවං වදෙය්‍ය; තථාහං භගවතා ධම්මං දේසිතං ආජානාමි, යථා යේමේ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තේ පටිසේවතො නාලං අන්තරායායාති. සො භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයො; මා ආයස්මා ඒවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා ඒවං වදෙය්‍ය, අනේකපරියායේන ආවුසො අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලඤ්ච පන තේ පටිසේවතො අන්තරායායාති. ඒවඤ්ච පන සො භික්ඛු භික්ඛූහි වුච්චමානො, තථේව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චේ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චේතං කුසලං. නො චේ පටිනිස්සජ්ජෙය්‍ය පාචිත්තියං.

66. යම් භික්ෂුවක් වනාහි දැන දැන සොර ගැල් කණ්ඩායමක් සමග සංවිධානය වී එක් ව දීර්ඝ මාර්ගයකට පිවිසින්නේ ද, යටත් පිරිසෙයින් අන් ගමකටදු පිළිපන්නේ නම්, පචිති වේ.

67. යම් භික්ෂුවක් වනාහි කාන්තාවක් සමග සංවිධානය වී එක්ව දීර්ඝ මාර්ගයකට පිළිපන්නේ ද, යටත් පිරිසෙයින් අන් ගමකටදු පිළිපන්නේ නම්, පචිති වේ.

68. යම් භික්ෂුවක් වනාහි ''භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකර ධර්මයක් වදාරන ලද්දාහු ද ඒ ධර්මයන් සේවනය කරන්නහුට අන්තරාය පිණිස නො වේ යැයි එසේ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ධර්මය මම දනිමි'' යැයි මෙසේ කියන්නේ නම්, ඒ භික්ෂුතෙම භික්ෂූන් විසින් ''ඇවැත්නි මෙසේ නො කියව; භාග්‍යවතුන් වහන්සේට නුගුණ නො කියව; භාග්‍යවතුන් වහන්සේට නුගුණ කීම නො මැනවි; භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො ම වදාරන්නේ ය; ඇවැත්නි නොයෙක් ආකාරයෙන් අන්තරායකර ධර්මයෝ අන්තරායකර යැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ ද, ඒ ධර්මයන් සේවනය කළහුට අන්තරාය පිණිස පවතින්නේ ම ය'' යැයි මෙසේ කිය යුතු වන්නේ ය. මෙසේ ද වනාහි ඒ භික්ෂුතෙම භික්ෂූන් විසින් කියනු ලබන්නේ එසේ ම දැඩි ව ගන්නේ නම් ඒ භික්ෂුතෙම භික්ෂූන් විසින් ඒ දෘෂ්ටිය අත්හැරීම පිණිස තුන්යල දක්වා සමනුභාසන කර්මය[1] කළ යුතු වේ. ඉදින් තුන්යල දක්වා සමනුභාසන කර්මය කරනු ලබන්නේ ඒ දෘෂ්ටිය අත්හරින්නේ නම් මෙසේ මෙය මැනවි. ඉදින් අත් නො හරින්නේ නම්, පචිති වේ.

1. ඤත්ති චතුත්ථ විනය කර්මයකි.

**69.** යෝ පන භික්ඛු ජානං තථාවාදිනා භික්ඛුනා අකතානුධම්මේන[1] තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨේන සද්ධිං සම්භුඤ්ජෙය්‍ය වා සංවසෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං.

**70.** සමනුද්දේසෝපි චේ ඒවං වදෙය්‍ය; තථාහං භගවතා ධම්මං දේසිතං ආජානාමි, යථා යේමේ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තේ පටිසේවතෝ නාලං අන්තරායායාති. සෝ සමණුද්දේසෝ භික්ඛූහි ඒවමස්ස වචනීයෝ; මා ආවුසෝ සමණුද්දේස ඒවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතෝ අබ්භක්ඛානං, න හි භගවා ඒවං වදෙය්‍ය, අනේකපරියායේන ආවුසෝ සමණුද්දේස, අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලඤ්ච පන තේ පටිසේවතෝ අන්තරායායාති. ඒවඤ්ච පන සෝ සමණුද්දේසෝ භික්ඛූහි වුච්චමානෝ තථේව පග්ගණ්හෙය්‍ය, සෝ සමණුද්දේසෝ භික්ඛූහි ඒවමස්ස වචනීයෝ; අජ්ජතග්ගේ තේ ආවුසෝ සමණුද්දේස, න චේව සෝ භගවා සත්ථා අපදිසිතබ්බෝ. යම්පි චඤ්ඤේ සමණුද්දේසා ලභන්ති භික්ඛූහි සද්ධිං දිරත්තතිරත්තං සහසෙය්‍යං, සාපි තේ නත්ථි චර පරේ,[2] විනස්සාති.

1. අකටානුධම්මේන (ම.ඡ.සං.)
2. චර පිරේ (ම.ඡ.සං.)

69. යම් භික්ෂුවක් වනාහි දැන දැන එසේ ම කියන ඒ දෘෂ්ටි අත් නො හළ, උක්ෂේපණය[1] කර ඕසාරණය[2] නො කළ භික්ෂුවක් සමග ධර්මාමිෂ සම්භෝගය පවත්වන්නේ නම් හෝ උපෝසථ ආදි සංඝකර්ම කරන්නේ නම් හෝ එක වහලක් යට නිදන්නේ නම්, පචිති වේ.

70. සාමණේරයකුදු ''භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ අන්තරායකර ධර්මයක් වදාරන ලද්දාහු ද ඒ ධර්මයන් සේවනය කරන්නහුට අන්තරාය පිණිස නො වේ යැයි එසේ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ධර්මය මම දනිමි''යැයි මෙසේ කියන්නේ නම්, ඒ සාමණේර තෙම භික්ෂූන් විසින් ''ඇවැත් සාමණේරය, මෙසේ නො කියව; භාග්‍යවතුන් වහන්සේට නුගුණ නො කියව; භාග්‍යවතුන් වහන්සේට නුගුණ කීම නො මැනවි; භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො ම වදාරන්නේ ය; ඇවැත් සාමණේරය, නොයෙක් ආකාරයෙන් අන්තරායකර ධර්මයෝ අන්තරායකර යැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ ද, ඒ ධර්මයන් සේවනය කළහුට අන්තරාය පිණිස පවතින්නේ ම ය'' යැයි මෙසේ කිය යුතු වන්නේ ය. මෙසේ ද වනාහි ඒ සාමණේර තෙම භික්ෂූන් විසින් කියනු ලබනුයේ එසේ ම දැඩි ව ගන්නේ නම්, ඒ සාමණේර තෙම භික්ෂූන් විසින් ''ඇවැත් සාමණේරය අද පටන් ඒ භාග්‍යවතුන් වහන්සේ නුඹගේ ශාස්තෘෘන් වහන්සේ යැයි නො ම කිය යුත්තේ ය; අනෙකුත් සාමණේරයෝ භික්ෂූන් වහන්සේලා සමග දෙතුන් රැයකුදු එක්ව යම් සයනයක් (සහසෙය්‍යාවක්) ලබත් නම් නුඹට එය ද නැත්තේ ය; බැහැර යව; නො දැක්මට යව'' යැයි මෙසේ කිය යුතු වන්නේ ය.

1. හික්මී එනතුරු සංඝ සමාජයේ සියලු සම්බන්ධකම්වලින් ඉවත් කිරීම.
2. යම් භික්ෂුවක් විනය කර්මයක් මගින් සංඝයා වෙතින් ඉවත් කොට, නැවත ආයති සංවරය පිහිටිය පසු සංඝයා වෙතට ඇතුළත් කිරීම.

යො පන භික්ඛු ජානං තථා නාසිතං සමණුද්දෙසං උපලාපෙය්‍ය වා උපට්ඨාපෙය්‍ය වා සම්භුඤ්ජෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං.

සප්පාණකවග්ගො සත්තමො.

71. යො පන භික්ඛු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො එවං වදෙය්‍ය; න තාවාහං ආවුසො එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි, යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමීති පාචිත්තියං.

සික්ඛමානේන භික්ඛවේ භික්ඛුනා අඤ්ඤාතබ්බං පරිපුච්ඡිතබ්බං පරිපඤ්හිතබ්බං. අයං තත්ථ සාමීචි.

72. යො පන භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය; කිං පනිමෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි, යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්තීති, සික්ඛාපදවිවණ්ණකෙ පාචිත්තියං.

73. යො පන භික්ඛු අන්වද්ධමාසං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය; ඉදානෙව ඛො

යම් භික්ෂුවක් වනාහි දැන දැන එසේ නසන ලද සාමණේරයකුට සංග්‍රහ කරන්නේ නම් හෝ උපස්ථාන කරවා ගන්නේ නම් හෝ ධර්ම ආමිස සම්භෝග කරන්නේ නම් හෝ එක්ව සයනය කරන්නේ නම්, පචිති වේ.

## සත්වැනි සප්පාණක වර්ගය යි.

71. යම් භික්ෂුවක් වනාහි භික්ෂූන් විසින් පැනවූ ශික්ෂා පදයකින් කියනු ලබන්නේ ''ඇවැත්නි මම ව්‍යක්ත විනයධර අන්‍ය භික්ෂුවකගෙන් විමසන තාක් ඒ සික පදයෙහි නො හික්මෙන්නෙමි'' යැයි මෙසේ කියන්නේ නම්, පචිති වේ.

මහණෙනි, හික්මෙනු කැමති භික්ෂුව විසින් ඒවා පිළිබඳව දත යුතු ය; පිළිවිසිය යුතු ය; සිතිය යුතු ය. මේ එහි අනුධර්මතාවය යි.

72. යම් භික්ෂුවක් වනාහි පාමොක් උදෙසනු ලබන කල්හි[1] ''කිම, මේ උදෙසන ලද කුඩා අනුකුඩා සිකපද වලින් කවර වැඩක් ද? ඒවා යම්තාක් කුකුස් පිණිස, වෙහෙස පිණිස, විලේඛන පිණිස පවතියි'' යැයි සිකපදයන්ට ගැරහීමෙහි පචිති වේ.

73. යම් භික්ෂුවක් වනාහි අඩමසක් පාසා පාමොක් උදෙසනු ලබන කල්හි ''මේ ධර්මය ද සූත්‍රයෙහි (විනයෙහි)

1. උදෙසනු ලබන කල්හි යනු ආචාර්යවරයෙකු විසින් අතවැසි හිමිනමකට උගන්වනු ලබන කල්හි, ඉගෙන ගන්නා කල්හි.

අහං ජානාමි, අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතීති, තඤ්චෙ භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානෙය්‍යුං, නිසින්නපුබ්බං ඉමිනා භික්ඛුනා ද්වත්තික්ඛත්තුං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ, කො පන වාදො භීයො‍ති.[1] න ච තස්ස භික්ඛුනො අඤ්ඤාණකේන මුත්ති අත්ථි. යඤ්ච තත්ථ ආපත්තිං ආපන්නො, තඤ්ච යථාධම්මො කාරෙතබ්බො, උත්තරිං චස්ස මොහො ආරොපෙතබ්බො; තස්ස තෙ ආවුසො අලාභා, තස්ස තෙ දුල්ලද්ධං, යං ත්වං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ, න සාධුකං අට්ඨිකත්වා[2] මනසිකරොසීති, ඉදං තස්මිං මොහනකෙ පාචිත්තියං.

74. යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො පහාරං දදෙය්‍ය පාචිත්තියං.

75. යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරෙය්‍ය පාචිත්තියං.

76. යො පන භික්ඛු භික්ඛුං අමූලකේන සඞ්ඝාදිසෙසේන අනුද්ධංසෙය්‍ය පාචිත්තියං.

77. යො පන භික්ඛු භික්ඛුස්ස සඤ්චිච්ච කුක්කුච්චං උපදහෙය්‍ය;[3] ඉතිස්ස මුහුත්තම්පි අඵාසු භවිස්සතීති, එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං.

1. භියො‍ (ම.ඡ.සං.)
2. අට්ඨිං කත්වා (ම.ඡ.සං.)
3. උප්පාදෙය්‍ය (ම.ඡ.සං.)

ආයේ ය; සූත්‍රයට (විනයට) ඇතුළත් ය; අඩමසක් පාසා උදෙසීමට පැමිණෙයි යැයි මම දැන් ම දනිමි'' යැයි මෙසේ කියන්නේ නම්, ඉදින් ඒ භික්ෂුව ''මේ භික්ෂුව විසින් දෙතුන් වරක් පාමොක් උදෙසනු ලබන කල්හි පෙර හුන්නේ'' යැයි අනෙක් භික්ෂූහු දන්නාහු නම්, ඒ භික්ෂුවට නො දැන්මෙන් මිදීමක් නැත. බොහෝ වූ කළ කවර කථා ද? එසේ ම එහි ලා යම් ඇවතකට පැමිණියේ නම්, ඒ ඇවතට ධර්මයේ වූ පරිද්දෙන් කරවිය යුතු වේ. මත්තෙහි ද ඔහුට ''ඇවැත්නි යම් හෙයකින් නුඹ පාමොක් උදෙසනු ලබන කල්හි මනාසේ අර්ථ ඇති කොට මෙනෙහි නො කරන්නෙහි ද, එහෙයින් එය තොපට අලාභයකි. ඒ තොපට නො මනා ලෙස ලැබීමකි'' යැයි මෝහාරෝපණ විනය කර්මය කළ යුතු ය. මෙසේ මෝහාරෝපණය කළ කල්හි නැවත මෝහනය (මුලාකිරීම) කරයි ද එසේ මෝහනය කරන භික්ෂුව කෙරෙහි මේ පචිතිය වේ.

74. යම් භික්ෂුවක් වනාහි කිපියේ නො සතුටු සිත් ඇතියේ භික්ෂුවකට පහරක් දෙන්නේ නම්, පචිති වේ.

75. යම් භික්ෂුවක් වනාහි කිපියේ නො සතුටු සිත් ඇත්තේ භික්ෂුවකට පහර දෙන ආකාරය දක්වා කය හෝ කාය පටිබද්ධයක් නඟන්නේ නම්, පචිති වේ.

76. යම් භික්ෂුවක් වනාහි භික්ෂුවක්හට අමූලික[1], අසත්‍ය සංඝාදිසේස ඇවතකින් චෝදනා කරන්නේ නම්, පචිති වේ.

77. යම් භික්ෂුවක් වනාහි භික්ෂුවකට දැන දැන ''මෙසේ මොහුට මොහොතක් නමුදු අපහසුතාවක් වන්නේ'' යැයි අනෙකක් නො ව මෙය ම කරුණු කොට කුකුසක් උපදවන්නේ නම්, පචිති වේ.

1. දැකීමෙන්, ඇසීමෙන් හෝ සැකකිරීමෙන් මුල් රහිත වූවක්.

78. යො පන භික්ඛු භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨෙය්‍ය; යං ඉමෙ භණිස්සන්ති තං සොස්සාමීති, එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං.

79. යො පන භික්ඛු ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය පාචිත්තියං.

80. යො පන භික්ඛු සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමෙය්‍ය පාචිත්තියං.

81. යො පන භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා, පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය; යථාසන්ථුතං භික්ඛූ සඞ්ඝිකං ලාභං පරිණාමෙන්තීති පාචිත්තියං.

82. යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය පාචිත්තියං.

සහධම්මිකවග්ගො අට්ඨමො.

❀ ❀ ❀

83. යො පන භික්ඛු රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස අනික්ඛන්තරාජකෙ අනීහතරතනකෙ[1] පුබ්බෙ අප්පටිසංවිදිතො ඉන්දඛීලං අතික්කාමෙය්‍ය පාචිත්තියං.

1. අනිග්ගතරතනකෙ (ම.ඡ.සං.)

78. යම් භික්ෂුවක් වනාහි හටගත් දබර ඇත්තාවූ, හටගත් කලහ ඇත්තාවූ, විරුද්ධ වාදයට පැමිණියාවූ භික්ෂූන්ගේ කථා බස් ඇසෙන තැනක ''මොවුහු යමක් කියන්නාහුද එය අසන්නෙමි'' යැයි අනෙකක් නො ව මෙය ම කරුණු කොට සිටින්නේ නම්, පචිති වේ.

79. යම් භික්ෂුවක් වනාහි දැහැමි විනය කර්මයන්ට ඡන්දය දී පසුව ඒවාට දොස් කීමට පැමිණෙන්නේ නම්, පචිති වේ.

80. යම් භික්ෂුවක් වනාහි සඟමැද විනය විනිශ්චයක් පවතින කල්හි ඡන්දය නො දී හුනස්නෙන් නැගිට (කර්මය කෝපාය කරණු වස්) පිටත යන්නේ නම්, පචිති වේ.

81. යම් භික්ෂුවක් වනාහි සමගි සංඝයා සමග එක් ව සිවුරක් දී ''භික්ෂූහු සංඝික ලාභය හිතවතුන්ට පිරිනමන්නේ'' යැයි පසුව නුගුණ කියන බවට පැමිණෙන්නේ නම්, පචිති වේ.

82. යම් භික්ෂුවක් වනාහි දැන දැන පිරිනමන ලද සංඝික ලාභයක් පුද්ගලයෙකුට පිරිනමන්නේ නම්, පචිති වේ.

## අටවැනි සහධම්මික වර්ගය යි.

❀ ❀ ❀

83. යම් භික්ෂුවක් වනාහි රජු නික්ම නො ගිය, මෙහෙසිය නික්ම නො ගිය අභිෂේක ලද ක්ෂත්‍රිය රජකුගේ නිදන කාමරයේ, පෙර (තමා පැමිණි බව) නොදන්වන ලදුයේ එළිපත ඉක්මවන්නේ නම්, පචිති වේ.

84. යො පන භික්ඛු රතනං වා රතනසම්මතං වා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා පාචිත්තියං. රතනං වා පන භික්ඛුනා රතනසම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා වා නික්ඛිපිතබ්බං, යස්ස භවිස්සති සො හරිස්සතීති. අයං තත්ථ සාමීචි.

85. යො පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා, විකාලෙ ගාමං පවිසෙය්‍ය, අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා පාචිත්තියං.

86. යො පන භික්ඛු අට්ඨිමයං වා දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙය්‍ය භේදනකං පාචිත්තියං.

87. නවං පන භික්ඛුනා මඤ්චං වා පීඨං වා කාරයමානේන අට්ඨඞ්ගුලපාදකං කාරේතබ්බං සුගතඞ්ගුලේන, අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා. තං අතික්කාමයතො ඡේදනකං පාචිත්තියං.

88. යො පන භික්ඛු මඤ්චං වා පීඨං වා තූලොනද්ධං කාරාපෙය්‍ය උද්දාලනකං පාචිත්තියං.

89. නිසීදනං පන භික්ඛුනා කාරයමානේන පමාණිකං කාරේතබ්බං, තත්‍රිදං පමාණං; දීඝසො

84. යම් භික්ෂුවක් වනාහි ආරාමය ඇතුළත දී හෝ ආවාසය ඇතුළත දී හෝ හැර අන් තැනක ඇති රත්නයක් හෝ රත්න යැයි සම්මත වස්තුවක් ගන්නේ නම් හෝ ගන්වවන්නේ නම්, පචිති වේ. භික්ෂුවක් විසින් ඇතුළු ආරාමයේ හෝ ඇතුළු ආවාසයේ රත්නයක් හෝ රත්න සම්මත දෙයක් රැගෙන හෝ ගෙන්වාගෙන යමෙකුගේ වන්නේ නම් හෙතෙම ගෙන යන්නේ යැයි තැන්පත් කර තැබිය යුතු ය. මේ එහි අනුධර්මතාවය යි.

85. යම් භික්ෂුවක් වනාහි විද්‍යමාන භික්ෂුවකට නො දන්වා එබඳු හදිසි කටයුත්තක දී හැර විකාලයෙහි ගමට ඇතුළු වීමෙන්, පචිති වේ.

86. යම් භික්ෂුවක් වනාහි අස්ථිමය හෝ දළමය හෝ අංමය හෝ ඉදිකටු ගුළාවක් කරවන්නේ නම්, භේදනක[1] පචිතියක් වේ.

87. අලුත් ඇඳක් හෝ පුටුවක් කරවන භික්ෂුව විසින් යට අටනිය හැර සුගත අඟුලෙන් අඟුල් අටක් වන සේ පාදවල උස තබා කරවිය යුතු ය. එය ඉක්මවන්නහුට ඡේදනක[2] පචිතියක් වේ.

88. යම් භික්ෂුවක් වනාහි ඇඳක් හෝ පුටුවක් හෝ පුළුන් බහා කරවන්නේ නම්, උද්දාලනක[3] පචිතියක් වේ.

89. නිසීදනයක් කරවන කැමති භික්ෂුව විසින් ප්‍රමාණවත් කොට කරවිය යුතු ය. එහි ලා මේ ප්‍රමාණය යි. දිගින් සුගත්

1. බිඳ දමා දෙසිය යුතු පචිතිය.
2. වැඩි කොටස කපා දමා දෙසිය යුතු පචිතිය.
3. පුළුන් උදුරා දමා දෙසිය යුතු පචිතිය.

ද්වෙ විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං දියඩ්ඪං, දසා විදත්ථි. තං අතික්කාමයතො ඡේදනකං පාචිත්තියං.

90. කණ්ඩුපටිච්ඡාදිං පන භික්ඛුනා කාරයමානේන, පමාණිකා කාරේතබ්බා, තත්‍රිදං පමාණං; දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං ද්වෙ විදත්ථියො. තං අතික්කාමයතො ඡේදනකං පාචිත්තියං.

91. වස්සිකසාටිකං පන භික්ඛුනා කාරයමානේන, පමාණිකා කාරේතබ්බා, තත්‍රිදං පමාණං; දීඝසො ඡ විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං අඩ්ඪතෙය්‍යා. තං අතික්කාමයතො ඡේදනකං පාචිත්තියං.

92. යො පන භික්ඛු සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙය්‍ය, අතිරේකං වා ඡේදනකං පාචිත්තියං. තත්‍රිදං සුගතස්ස සුගතචීවරප්පමාණං; දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං ඡ විදත්ථියො. ඉදං සුගතස්ස සුගතචීවරප්පමාණං.

රතනවග්ගො[1] නවමො.

❀ ❀ ❀

1. රාජවග්ගො (බු.ජ.මු.)

වියතින්[1] දෙවියතකි. සරස (පළල) සුගත් වියතින් වියත් එකහමාරකි. දහවලු වියතකි. එය ඉක්මවන්නාට ඡේදනක පචිත්තිය වේ.

90. කණ්ඩු පටිච්ඡාදනයක්[2] කරවන භික්ෂුව විසින් ප්‍රමාණවත් ව කරවිය යුතු ය. එහි ලා මේ ප්‍රමාණය යි. දිගින් සුගත් වියතින් සිවු වියතකි. සරස දෙවියතකි. එය ඉක්මවන්නහුට ඡේදනක පචිත්තිය වේ.

91. වැසි සළුවක් කරවන භික්ෂුව විසින් ප්‍රමාණවත් ව කරවිය යුතු ය. එහිලා මේ ප්‍රමාණය යි. දිගින් සුගත් වියතින් වියත් සයකි. සරස වියත් දෙකහමාරකි. එය ඉක්මවන්නහුට ඡේදනක පචිත්තිය වේ.

92. යම් භික්ෂුවක් වනාහි සුගත් සිවුරේ ප්‍රමාණයේ හෝ ඊට වැඩි ප්‍රමාණයේ හෝ සිවුරක් කරවන්නේ නම්, ඡේදනක පචිත්තිය වේ. එහි ලා මේ සුගතයන් වහන්සේගේ සුගත් සිවුරේ ප්‍රමාණය යි. දිගින් සුගත් වියතින් නව වියතකි. සරස වියත් සයකි. මේ සුගතයන් වහන්සේගේ සුගත් සිවුරේ ප්‍රමාණය යි.

නවවැනි රතන වර්ගය යි.

❀ ❀ ❀

1. මෙහි දී මධ්‍යම පුරුෂයකුගේ වියතින් වියත් 3ක් හෙවත් වඩු රියන් 1-1/2ක් සුගත්වියත් 1කි.
2. චර්ම රෝග (හොරි, දද, කුෂ්ඨ) වසන චීවරයක්.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො ද්වෙ නවුති පාචිත්තියා ධම්මා.
තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී, ඒවමෙතං ධාරයාමීති.

පාචිත්තියා ධම්මා නිට්ඨිතා.

## (6) පාටිදේසනීයා ධම්මා

ඉමෙ ඛො පනායස්මන්තො, චත්තාරො පාටිදේසනීයා ධම්මා උද්දේසං ආගච්ඡන්ති.

1. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා, ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදේසේතබ්බං තේන භික්ඛුනා; ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං, අසප්පායං පාටිදේසනීයං තං පටිදේසේමීති.

2. භික්ඛූ පනේව කුලේසු නිමන්තිතා භුඤ්ජන්ති, තත්‍ර චෙ සා භික්ඛුනී වොසාසමානරූපා ඨිතා

ආයුෂ්මත්වරුනි! අනූදෙකක් වූ පචිති ධර්මයෝ උදෙසන ලද්දාහු ය.
එහි ලා ආයුෂ්මතුන් වහන්සේලා විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
දෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
තෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?

මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධය හ. නිහඬ එබැවිනි. 'මෙසේ මෙය ධරමි' යැයි

## පචිති ඇවැත් ධර්ම අවසන් ය.

# (6) පාටිදේසනීය ධර්මයෝ

ආයුෂ්මත්වරුනි! මේ සතර පාටිදේසනීය ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1. යම් භික්ෂුවක් වනාහි, ඇතුළුගමට පිවිසි නො නෑ වූ භික්ෂුණියකගේ අතින් කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් හෝ සියතින් පිළිගෙන කන්නේ නම් හෝ බුදින්නේ නම් හෝ, ඒ භික්ෂුව විසින් ''ඇවැත්නි, ගැරහිය යුතු වූ අසත්ප්‍රාය වූ නැවත දෙසිය යුතු ඇවතකට පැමිණියෙමි; එය පෙරළා දෙසමි'' යැයි පෙරළා දෙසිය යුතු ය.

2. භික්ෂූහු වනාහිම කුලයන්හි නිමන්ත්‍රණය කරන ලද්දාහු දන් වළඳත්. ඉදින් එහි ලා භික්ෂුණියක් ''මෙහි සූප දෙව;

හෝති; ඉධ සූපං දේථ ඉධ ඕදනං දේථාති. තේහි භික්ඛූහි සා භික්ඛුනී අපසාදේතබ්බා; අපසක්ක තාව භගිනි, යාව භික්ඛූ භුඤ්ජන්තීති. ඒකස්සපි චේ[1] භික්ඛුනෝ නප්පටිභාසෙය්‍ය තං භික්ඛුනිං අපසාදේතුං; අපසක්ක තාව භගිනි, යාව භික්ඛූ භුඤ්ජන්තීති, පටිදේසේතබ්බං තේහි භික්ඛූහි; ගාරය්හං ආවුසෝ ධම්මං ආපජ්ජිම්හා, අසප්පායං පාටිදේසනීයං තං පටිදේසේමාති.

3. යානි ඛෝ පන තානි සෙක්ඛසම්මතානි[2] කුලානි, යෝ පන භික්ඛු තථාරූපේසු සෙක්ඛසම්මතේසු කුලේසු පුබ්බේ අනිමන්තිතෝ, අගිලානෝ, ඛාදනීයං වා භෝජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා, ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පටිදේසේතබ්බං තේන භික්ඛුනා; ගාරය්හං ආවුසෝ ධම්මං ආපජ්ජිං, අසප්පායං පාටිදේසනීයං තං පටිදේසේමීති.

4. යානි ඛෝ පන තානි ආරඤ්ඤකානි සේනාසනානි සාසඞ්කසම්මතානි සප්පටිභයානි, යෝ පන භික්ඛු තථාරූපේසු සේනාසනේසු විහරන්තෝ,[3] පුබ්බේ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භෝජනීයං වා අජ්ඣාරාමේ සහත්ථා පටිග්ගහෙත්වා, අගිලානෝ ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පටිදේසේතබ්බං තේන භික්ඛුනා; ගාරය්හං ආවුසෝ ධම්මං ආපජ්ජිං, අසප්පායං පාටිදේසනීයං තං පටිදේසේමීති.

1. ඒකස්ස චේපි (ම.ඡ.සං.)
2. සේඛසම්මතානි (බු.ජ.මු.)
3. විහරන්තෝ නොමැති ව සේනාසනේසු පමණක් ඇත. (ම.ඡ.සං.)

මෙහි බත් දෙව'' යැයි විධාන කරමින් සිටියා වෙයි ද, එහි සිටින භික්ෂූන් විසින් ''නැඟණියනි, භික්ෂූන් වහන්සේලා වළඳා අවසන් වනතුරු නුඹ මෙතනින් ඉවත් ව යව''යැයි ඉවත් කළ යුතු ය. ඉදින් එක් භික්ෂුවකුදු ''නැඟණියනි භික්ෂූන් වහන්සේලා වළඳා අවසන් වනතුරු ඉවත් ව යව'' යැයි ඒ භික්ෂුණිය ඉවත් කරන්නට නො වැටහෙන්නේ නම්, ඒ භික්ෂූහු විසින් ''ඇවැත්නි, ගැරහිය යුතු වූ අසත්ප්‍රාය වූ නැවත දෙසිය යුතු ඇවතකට පැමිණියෙමු; එය පෙරළා දෙසමු''යැයි පෙරළා දෙසිය යුත්තාහු ය.

3. යම් ඒ සේඛසම්මත කුලයෝ[1] ඇත් ද, යම් භික්ෂුවක් එබඳු සේඛසම්මත කුලයන්හි පෙර නිමන්ත්‍රණය නො කරන ලදුයේ, නො ගිලන් වූයේ, කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් හෝ සියතින් පිළිගෙන කන්නේ නම් හෝ බුදින්නේ නම් හෝ, ඒ භික්ෂුව විසින් ''ඇවැත්නි, ගැරහිය යුතු වූ අසත්ප්‍රාය වූ නැවත දෙසිය යුතු ඇවතකට පැමිණියෙමි; එය පෙරළා දෙසමි''යැයි පෙරළා දෙසිය යුතු ය.

4. යම් ඒ සැක සහිත යැයි සම්මත වූ බිය සහිත වූ වන සෙනසුන් ඇත් ද, යම් භික්ෂුවක් එබඳු සෙනසුන්හි වාසය කරනුයේ, නො ගිලන් වූයේ, පෙර නො දන්වා ගෙනෙන ලද කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් හෝ ඇතුළුආරාමයේ දී, සියතින් පිළිගෙන කන්නේ නම් හෝ බුදින්නේ නම් හෝ, ඒ භික්ෂුව විසින් ''ඇවැත්නි, ගැරහිය යුතු වූ අසත්ප්‍රාය වූ නැවත දෙසිය යුතු ඇවතකට පැමිණියෙමි; එය පෙරළා දෙසමි''යැයි පෙරළා දෙසිය යුතු ය.

1. මාර්ගඵල ලබන ලද පවුල්.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො, චත්තාරො පාටිදෙසනීයා ධම්මා.
තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා ?
තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා ?
පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී, ඒවමෙතං ධාරයාමීති.

පාටිදෙසනීයා ධම්මා නිට්ඨිතා.

## (7) සෙඛියා ධම්මා

ඉමෙ ඛො පනායස්මන්තො සෙඛියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයා.

2. පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා.

3. සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

ආයුෂ්මත්වරුනි! සතරක් වූ පාටිදේසනීය ධර්මයෝ උදෙසන ලද්දාහු ය.
එහි ලා ආයුෂ්මතුන් වහන්සේලා විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
දෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
තෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධය හ. නිහඬ එබැවිනි. 'මෙසේ මෙය ධරමි' යැයි

## පාටිදේසනීය ඇවැත් ධර්ම අවසන් ය.

# (7) සේඛියා ධර්මයෝ

ආයුෂ්මත්වරුනි! මේ සේඛියා ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

1. හාත්පස පිරිමඬුලු කොට අඳනය අඳින්නෙමි'යි හික්මිය යුතු ය.

2. හාත්පස පිරිමඬුලු කොට සිවුරු පොරවන්නෙමි'යි හික්මිය යුතු ය.

3. සුපිළිසන් ව සිවුරු පොරවාගෙන ඇතුළුගමෙහි වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

4. සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

5. සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

6. සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

7. ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

8. ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

9. න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

10. න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

පරිමණ්ඩලවග්ගො පඨමො.

11. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

12. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

4. සුපිළිසන් ව සිවුරු පොරවාගෙන ඇතුළුගමෙහි වැඩ හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

5. මනා සංවරයකින් යුතු ව ඇතුළුගමෙහි වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

6. මනා සංවරයකින් යුතු ව ඇතුළුගමෙහි වැඩ හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

7. බිමට යොමා ගත් ඇස් ඇති ව (වියදඬු පමණ දුර බලමින්) ඇතුළුගමෙහි වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

8. බිමට යොමා ගත් ඇස් ඇති ව (වියදඬු පමණ දුර බලමින්) ඇතුළුගමෙහි වැඩ හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

9. සිවුරු ඔසවාගෙන ඇතුළුගමෙහි නො වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

10. සිවුරු ඔසවාගෙන ඇතුළුගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

## පළමුවැනි පරිමණ්ඩල වර්ගය යි.

11. මහ හඬින් සිනා සෙමින් ඇතුළුගමෙහි නො වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

12. මහ හඬින් සිනා සෙමින් ඇතුළුගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

13. අප්පසද්දො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

14. අප්පසද්දො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

15. න කායප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

16. න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

17. න බාහුප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

18. න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

19. න සීසප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

20. න සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

උජ්ජග්ඝිකවග්ගො දුතියො.

21. න ඛම්භකතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

13. ශබ්ද නො කොට ඇතුළුගමෙහි වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

14. ශබ්ද නො කොට ඇතුළුගමෙහි හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

15. කය සොලවමින් ඇතුළුගමෙහි නො වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

16. කය සොලවමින් ඇතුළුගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

17. අත් සොලවමින් ඇතුළුගමෙහි නො වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

18. අත් සොලවමින් ඇතුළුගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

19. හිස සොලවමින් ඇතුළුගමෙහි නො වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

20. හිස සොලවමින් ඇතුළුගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

### දෙවැනි උජ්ජග්ඝික වර්ගය යි.

21. උකුළෙහි අත් තබාගෙන ඇතුළුගමෙහි නො වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

22. න ඛම්භකතෝ අන්තරඝරේ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

23. න ඔගුණ්ඨිතෝ අන්තරඝරේ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

24. න ඔගුණ්ඨිතෝ අන්තරඝරේ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

25. න උක්කුටිකාය අන්තරඝරේ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

26. න පල්ලත්ථිකාය අන්තරඝරේ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

27. සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

28. පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

29. සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

30. සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

ඛම්භකතවග්ගෝ තතියෝ.

❀ ❀ ❀

22. උකුළෙහි අත් තබාගෙන ඇතුළුගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

23. හිස වසා පොරවාගෙන ඇතුළුගමෙහි නො වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

24. හිස වසා පොරවාගෙන ඇතුළුගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

25. විළුඹ හෝ ඇඟිලි බිම අනිමින් ඇතුළුගමෙහි නො වඩින්නෙමි'යි හික්මිය යුතු ය.

26. අකවටු බැඳගෙන ඇතුළුගමෙහි නො හිඳින්නෙමි'යි  හික්මිය යුතු ය.

27. සිහි එළවාගෙන පිණ්ඩපාතය පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය.

28. පාත්‍රය යන සංඥාව ඇති ව පිණ්ඩපාතය පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය.

29. බතින් හතරෙන් කොටසක් (1/4) සූප ඇති සේ පිණ්ඩපාතය පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය.

30. පාත්‍රයේ ඇතුළුමුව විටට සමවන සේ පිණ්ඩපාතය පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය.

තෙවැනි ඛම්භකත වර්ගය යි.

31. සක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

32. පත්තසඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

33. සපදානං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

34. සමසූපකං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

35. න ථූපතො[1] ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

36. න සූපං වා බ්‍යඤ්ජනං[2] වා ඔදනේන පටිච්ඡාදෙස්සාමි, භියෙ‍යා්කම්‍යතං උපාදායාති සික්ඛා කරණීයා.

37. න සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

38. න උජ්ඣානසඤ්ඤී පරේසං පත්තං ඔලෝකෙස්සාමීති සික්ඛා කරණීයා.

39. නාතිමහන්තං කබළං කරිස්සාමීති සික්ඛා කරණීයා.

1. න ථූපකතො (ම.ඡ.සං.)
2. ව්‍යඤ්ජනං (හේ.වි.මු.)

31. සිහි එළවාගෙන දන් වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

32. පාත්‍රය යන සංඥාව ඇති ව දන් වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

33. තමා දෙස පටන් අනුපිළිවෙළින් (පාත්‍රයේ තැනින් තැන නො ගෙන) දන් වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

34. බතෙන් හතරෙන් කොටසක් (1/4) සූප ඇති සේ දන් වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

35. බත මුදුනින් අනා දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

36. සූප, ව්‍යඤ්ජන වැඩිපුර ගනු අදහසින් ඒවා බතින් නො වසන්නෙමි'යි හික්මිය යුතු ය.

37. නො ගිලන්ව සූප හෝ බත් හෝ තමා උදෙසා ඉල්ලාගෙන නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

38. ගරහනු කැමතිව අනුන්ගේ පාත්‍රය දෙස බැලීමෙන් වළකින්නෙමි'යි හික්මිය යුතු ය.

39. මහත් විශාලව බත් පිඬු කිරීමෙන් වළකින්නෙමි'යි හික්මිය යුතු ය.

40. පරිමණ්ඩලං ආලෝපං කරිස්සාමීති සික්ඛා කරණීයා.

සක්කච්චවග්ගෝ චතුත්ථෝ.

41. න අනාහටේ කබළේ මුඛද්වාරං විවරිස්සාමීති සික්ඛා කරණීයා.

42. න භුඤ්ජමානෝ සබ්බං හත්ථං මුඛේ පක්ඛිපිස්සාමීති සික්ඛා කරණීයා.

43. න සකබළේන මුඛේන බ්‍යාහරිස්සාමීති සික්ඛා කරණීයා.

44. න පිණ්ඩුක්ඛේපකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

45. න කබළාවච්ඡේදකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

46. න අවගණ්ඩකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

47. න හත්ථනිද්ධුනකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

48. න සිත්ථාවකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

40. හාත්පසින් ගුලි කොට බත් පිඬු සකස් කරන්නෙමි'යි හික්මිය යුතු ය.

## සිවුවැනි පිණ්ඩපාත වර්ගය යි.

✿ ✿ ✿

41. බත් පිඬ මුවට ළංකිරීමට පෙර මුව විවෘත නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

42. දන් වළඳමින් මුළු අත මුව තුළට ඇතුළු නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

43. මුව තුළ ආහාර තිබිය දී (කථාකිරීමට නො හැකි පමණට) කථා බස් නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

44. බත් පිඬු ආදිය මුව තුළට විසිකරමින් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

45. බත් පිඬුව කටින් කඩ කඩා නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

46. හකු පුරවාගෙන දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

47. අත් ගසා දමමින් දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

48. බත් ඇට තැන තැන විසුරුවමින් දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

49. න ජිව්හානිච්ඡාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

50. න චපුචපුකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

කබළවග්ගො පඤ්චමො.

❀ ❀ ❀

51. න සුරුසුරුකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

52. න හත්ථනිල්ලේහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

53. න පත්තනිල්ලේහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

54. න ඔට්ඨනිල්ලේහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

55. න සාමිසේන හත්ථේන පානීයථාලකං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

56. න සසිත්ථකං පත්තධෝවනං අන්තරඝරේ ඡඩ්ඩෙස්සාමීති සික්ඛා කරණීයා.

57. න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

49. දිව පිටතට නෙරමින් දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

50. 'චපු චපු' යන හඬ නඟමින් දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

## පස්වැනි කබල වර්ගය යි.

❀ ❀ ❀

51. 'සුරු සුරු' යන හඬ නඟමින් දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

52. අත ලෙවකමින් දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

53. පාත්‍රය ලෙවමින් (ඇඟිලිවලින් සූර සූරා) දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

54. තොල් ලෙවමින් දන් නො වළඳන්නෙමි'යි හික්මිය යුතු ය.

55. ඉඳුල් සහිත අතින් පැන් භාජනය නො පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය.

56. බත් ඇට, ඉඳුල් සහිත පාත්‍ර දෙවූ ජලය ඇතුළුගමෙහි හෝ ඇතුළුගෙයි නො දමන්නෙමි'යි හික්මිය යුතු ය.

57. කුඩ අතැතිව සිටින නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

58. න දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

59. න සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

60. න ආයුධපාණිස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

සුරුසුරුවග්ගො ඡට්ඨො.

❀ ❀ ❀

61. න පාදුකාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

62. න උපාහනාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

63. න යානගතස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

64. න සයනගතස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

65. න පල්ලත්ථිකාය නිසින්නස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

66. න වේඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

58. දඬු අතැතිව සිටින නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

59. සැත් අතැතිව සිටින නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

60. ආයුධ අතැතිව සිටින නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

සවැනි සුරුසුරු වර්ගය යි.

❀ ❀ ❀

61. පයලූ ලී සෙරෙප්පු ඇති නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

62. පයලූ වහන් ඇති නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

63. යානයෙහි හුන්නා වූ නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

64. යහනෙහි සයනය කරන්නා වූ නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

65. අකවටු බැඳ සිටින නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

66. හිස වෙළා සිටින (ජටාවක් බැඳි) නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

67. න ඕගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

68. න ඡමාය[1] නිසීදිත්වා ආසනේ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

69. න නීචේ ආසනේ නිසීදිත්වා උච්චේ ආසනේ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

70. න ඨිතෝ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

71. න පච්ඡතෝ ගච්ඡන්තෝ, පුරතෝ ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

72. න උප්පථේන ගච්ඡන්තෝ, පථේන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමීති සික්ඛා කරණීයා.

73. න ඨිතෝ අගිලානෝ උච්චාරං වා පස්සාවං වා කරිස්සාමීති සික්ඛා කරණීයා.

74. න හරිතේ අගිලානෝ උච්චාරං වා පස්සාවං වා ඛේළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා.

75. න උදකේ අගිලානෝ උච්චාරං වා පස්සාවං වා ඛේළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා.

පාදුකාවග්ගෝ[2] සත්තමෝ.

1. න ඡමායං (ම.ඡ.සං.)
2. පාදුකවග්ගෝ (ම.ඡ.සං.)

67. හිස වසාගෙන පොරවා සිටින නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

68. තමන් බිම හිඳ, ආසනයක හිඳ සිටින නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

69. තමන් පහත් අසුනක හිඳ උස් අසුනක හුන් නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

70. තමා සිටගෙන, හිඳගෙන සිටින නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

71. තමා පිටුපසින් ගමන් කරමින්, ඉදිරියෙන් යන නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

72. තමා නො මඟින් යමින් නියම මඟින් යන්නා වූ නො ගිලනාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

73. සිටගෙන, නො ගිලන් ව වැසිකිළි හෝ කැසිකිළි හෝ නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

74. තණ කොළ, පැළෑටි ආදිය ඇති තැනක නො ගිලන්ව වැසිකිළි හෝ කැසිකිළි හෝ කෙළ ගැසීම හෝ නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

75. නො ගිලන්ව ජලයෙහි වැසිකිළි හෝ කැසිකිළි හෝ කෙළ ගැසීම හෝ නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

සත්වැනි පාදුකා වර්ගය යි.

උද්දිට්ඨා ඛෝ ආයස්මන්තෝ, සේඛියා ධම්මා.
තත්ථායස්මන්තේ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
පරිසුද්ධෙත්ථායස්මන්තෝ තස්මා තුණ්හී, ඒවමේතං ධාරයාමීති.

සේඛියා ධම්මා නිට්ඨිතා.

## (8) අධිකරණසමථා ධම්මා

ඉමේ ඛෝ පනායස්මන්තෝ සත්ත අධිකරණසමථා ධම්මා උද්දේසං ආගච්ඡන්ති.

උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය;
සම්මුඛාවිනයෝ දාතබ්බෝ, සතිවිනයෝ දාතබ්බෝ,
අමූළ්හවිනයෝ දාතබ්බෝ,
පටිඤ්ඤාය කාරේතබ්බං, යේභුය්‍යසිකා,
තස්සපාපියය්‍යසිකා,[1] තිණවත්ථාරකෝති.

උද්දිට්ඨා ඛෝ ආයස්මන්තෝ, සත්ත අධිකරණසමථා ධම්මා.
තත්ථායස්මන්තේ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?
දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?

1. තස්සපාපියසිකා (ම.ඡ.සං.)

ආයුෂ්මත්වරුනි! සේඛියා ධර්මයෝ උදෙසන ලද්දාහු ය.
එහි ලා ආයුෂ්මතුන් වහන්සේලා විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
දෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
තෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?

මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධය හ. නිහඬ එබැවිනි. 'මෙසේ මෙය ධරමි' යැයි

සේඛියා ධර්මයෝ අවසන් ය.

## (8) අධිකරණසමථ ධර්මයෝ

ආයුෂ්මත්වරුනි! මේ සතක් වු අධිකරණසමථ ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

උපනුපන් අධිකරණයන් ගේ සන්සිඳීම පිණිස වූප සමනය පිණිස;

සම්මුඛාවිනය දියයුත්තේ ය. සතිවිනය දියයුත්තේ ය. අමූළ්හවිනය දියයුත්තේ ය. ප්‍රතිඥාව අනුව කරවිය යුත්තේ ය. යෙභුය්‍යසිකා ව, තස්සපාපිය්‍යසිකා ව, තිණවත්ථාරකය යන සමථයෝ ද දියයුත්තාහු ය.

ආයුෂ්මත්වරුනි! අධිකරණසමථ ධර්මයෝ සත උදෙසන ලද්දාහු ය.
එහි ලා ආයුෂ්මතුන් වහන්සේලා විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?
දෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?

තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී, ඒවමෙතං ධාරයාමීති.

අධිකරණසමථා ධම්මා නිට්ඨිතා.

උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං, උද්දිට්ඨා චත්තාරො පාරාජිකා ධම්මා, උද්දිට්ඨා තේරස සඞ්ඝාදිසේසා ධම්මා, උද්දිට්ඨා ද්වේ අනියතා ධම්මා, උද්දිට්ඨා තිංසනිස්සග්ගියා පාචිත්තියා ධම්මා, උද්දිට්ඨා ද්වේ නවුති පාචිත්තියා ධම්මා, උද්දිට්ඨා චත්තාරො පාටිදේසනීයා ධම්මා, උද්දිට්ඨා සේඛියා ධම්මා, උද්දිට්ඨා සත්ත අධිකරණසමථා ධම්මා. එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධමාසං උද්දේසං ආගච්ඡති, තත්ථ සබ්බෙහේව සමග්ගේහි සම්මෝදමානේහි අවිවදමානේහි සික්ඛිතබ්බන්ති.

විත්ථාරුද්දේසො පඤ්චමො.

## භික්ඛුපාතිමොක්ඛං නිට්ඨිතං.

*සාධු ! සාධු !! සාධු !!!*

තෙවනුව ද විචාරමි; කිම, පිරිසිදු වූවහු ද?

මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධය හ. නිහඬ එබැවිනි. 'මෙසේ මෙය ධරමි' යැයි

## අධිකරණසමථ ධර්මයෝ අවසන් ය.

ආයුෂ්මත්වරුනි! නිදානය උදෙසන ලදී. පාරාජිකා ඇවැත් සතර උදෙසන ලද හ. සංඝාදිසේස ඇවැත් දහතුන උදෙසන ලද හ. අනියත ඇවැත් දෙක උදෙසන ලද හ. නිසඟි පචිති ඇවැත් තිහ උදෙසන ලද හ. පචිති ඇවැත් අනූදෙක උදෙසන ලද හ. පාටිදේසනීය ඇවැත් සතර උදෙසන ලද හ. සේඛියා ඇවැත් උදෙසන ලද හ. අධිකරණසමථ සත උදෙසන ලද හ. ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ සූත්‍රසංඛ්‍යාත භික්ෂු විභංගයෙහි ආවා වූ භික්ෂු විභංගයට ඇතුළත් වූ මෙතෙක් ශික්ෂා පද අඩමසක් පාසා උදෙසීමට පැමිණේ යි. සමගි වූ, සතුටු වන විවාද නො කරන සැමදෙනා වහන්සේලා විසින් ම එහි ලා හික්මිය යුත්තාහ.

## පස්වැනි විස්තර උද්දේසය යි.

# භික්ෂු ප්‍රාතිමෝක්ෂය අවසන් ය.

*සාදූ ! සාදූ !! සාදූ !!!*

**''සුඡන්නමතිවස්සති විවටං නාතිවස්සති තස්මා ඡන්නං විවරේථ ඒවං තං නාතිවස්සතී'ති''**

*මොනවට වසාගන්නා ලදුයේ ඉතා වසී (අවන් ඇවැත් සඟවනුයේ තව තවත් ඇවැත්නට පැමිණේ). විවෘත වූයේ ඉතා නො වසී. (අවන් ඇවැත් විවෘත කරනුයේ අන් ඇවැතකට නො පැමිණෙයි). එහෙයින් වසන ලද ඇවැත විවෘත කරන්නේය (කළ යුතු ය). මෙසේ එය ඉතා නො වසී ය යි.*

*චුල්ලවග්ගපාළි II - පාතිමොක්ඛට්ඨපනඛන්ධකය. (බු.ජ.මු.), පි. 434*

# කෙටියෙන් පාමොක් උදෙසීම.

යම් විහාරයක උපෝසථ දිනයෙහි දසවිධ අන්තරාවන්ගෙන්[1] යම් අන්තරාවක් ඇති විටක නිදානය පමණක් උදෙසා සෙස්ස පහත පරිදි ශ්‍රැතයෙන් ඇස්විය යුතු ය.

**උද්දිට්ඨං ඛෝ ආයස්මන්තෝ නිදානං. සුතා ඛෝ පනායස්මන්තේහි චත්තාරෝ පාරාජිකා ධම්මා. සුතා ඛෝ පනායස්මන්තේහි තේරස සඞ්ඝාදිසේසා ධම්මා. සුතා ඛෝ පනායස්මන්තේහි ද්වේ අනියතා ධම්මා. සුතා ඛෝ පනායස්මන්තේහි තිංසනිස්සග්ගියා පාචිත්තියා ධම්මා. සුතා ඛෝ පනායස්මන්තේහි ද්වේ නවුති පාචිත්තියා ධම්මා. සුතා ඛෝ පනායස්මන්තේහි චත්තාරෝ පාටිදේසනීයා ධම්මා. සුතා ඛෝ පනායස්මන්තේහි සේඛියා ධම්මා. සුතා ඛෝ පනායස්මන්තේහි සත්ත අධිකරණසමථා ධම්මා.**

**තත්ථායස්මන්තේ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?**
**දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?**
**තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?**
**පරිසුද්ධෙත්ථායස්මන්තෝ තස්මා තුණ්හී, ඒවමේතං ධාරයාමීති.**

**එත්තකං තස්ස භගවතෝ සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධමාසං උද්දේසං ආගච්ඡති. තත්ථ සබ්බේහේව සමග්ගේහි සම්මෝදමානේහි අවිවදමානේහි සික්ඛිතබ්බන්ති.**

❀ ❀ ❀

1. උපග්‍රන්ථය - II (ඕ) බලනු මැනවි.

අන්තරායකර තත්ත්වය අනුව හැකිනම් නිදානය පටන් පාරාජිකා ධර්ම දක්වා උදෙසා සෙස්ස පහත පරිදි ශ්‍රැතයෙන් ඇස්විය යුතු ය.

**උද්දිට්ඨං බෝ ආයස්මන්තෝ නිදානං. උද්දිට්ඨා චත්තාරෝ පාරාජිකා ධම්මා. සුතා බෝ පනායස්මන්තේහි තේරස සඞ්ඝාදිසේසා ධම්මා. සුතා බෝ -පෙ- සික්ඛිතබ්බන්ති.**

මේ අයුරින්ම සංඝාදිසේස ධර්ම දක්වා උදෙසා හෝ අනියත ධර්ම දක්වා උදෙසා සෙස්ස පහත පරිදි ශ්‍රැතයෙන් ඇස්විය යුතු ය.

- සංඝාදිසේස දක්වා උදෙසා ශ්‍රැතයෙන් ඇස්සවීම.

**උද්දිට්ඨං බෝ ආයස්මන්තෝ නිදානං. උද්දිට්ඨා චත්තාරෝ පාරාජිකා ධම්මා. උද්දිට්ඨා තේරස සඞ්ඝාදිසේසා ධම්මා. සුතා බෝ පනායස්මන්තේහි ද්වේ අනියතා ධම්මා. සුතා බෝ -පෙ- සික්ඛිතබ්බන්ති.**

- අනියත දක්වා උදෙසා ශ්‍රැතයෙන් ඇස්සවීම.

**උද්දිට්ඨං බෝ ආයස්මන්තෝ නිදානං. උද්දිට්ඨා චත්තාරෝ පාරාජිකා ධම්මා. උද්දිට්ඨා තේරස සඞ්ඝාදිසේසා ධම්මා. උද්දිට්ඨා ද්වේ අනියතා ධම්මා. සුතා බෝ පනායස්මන්තේහි තිංසනිස්සග්ගියා පාචිත්තියා ධම්මා. සුතා බෝ -පෙ- සික්ඛිතබ්බන්ති.**

යම් හෙයකින් විත්ථාරුද්දේසය උදෙසීමට පැමිණියේ නම් පාමොක් අවසන් වනතෙක් උදෙසිය යුතු වේ.

**කෙටියෙන් පාමොක් උදෙසීම අවසන් ය.**

# පාරිසුද්ධි උපෝසථය කිරීමේ පිළිවෙළ.

**● පාරිසුද්ධි උපෝසථය[1] භික්ෂූන් වහන්සේලා තුන් නමක් වූ විට;**

පූර්ව කෘත්‍ය[2] සිදු කොට ඇවැත් දේශනා කොට වර්ෂය, ඍතුව, පක්ෂය සඳහන් කිරීමෙන් අනතුරු ව ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුවක් විසින් නමස්කාරය ප්‍රකාශ කොට ඤත්තිය තැබිය යුතු ය.

**''සුණන්තු මේ ආයස්මන්තා අජ්ජුපෝසථෝ (පණ්ණරසො/ චාතුද්දසෝ). යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධිඋපෝසථං කරෙය්‍යාම''**

ඉන්පසු වැඩිහිටි භික්ෂුව විසින් උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට;

**''පරිසුද්ධෝ අහං ආවුසෝ! පරිසුද්ධෝති මං ධාරේහි,[3] පරිසුද්ධෝ අහං ආවුසෝ! පරිසුද්ධෝති මං ධාරේහි, පරිසුද්ධෝ අහං ආවුසෝ! පරිසුද්ධෝති මං ධාරේහි''**

යැයි ප්‍රකාශ කළ යුතු ය.

ඉන්පසු වැඩිහිටි පිළිවෙළින් අනෙක් භික්ෂූන් වහන්සේලා දෙනම විසින් උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට;

**''පරිසුද්ධෝ අහං භන්තේ! පරිසුද්ධෝති මං ධාරේථ, පරිසුද්ධෝ අහං භන්තේ! පරිසුද්ධෝති මං ධාරේථ, පරිසුද්ධෝ අහං භන්තේ! පරිසුද්ධෝති මං ධාරේථ''**

යැයි ප්‍රකාශ කළ යුතු ය.

---

1. පිරිසිදු බව සඳහා වූ පොහොය කිරීම.
2. පොහොය කිරීමට පෙර කළ යුතු ''සීමාව'' හැමදීම් ආදී කටයුතු.
3. ධාරේථ (බු.ජ.මු.)

**● පාරිසුද්ධි උපෝසථය භික්ෂූන් වහන්සේලා දෙනමක් වූ විට;**

පූර්ව කෘත්‍ය සිදු කොට ඇවැත් දේශනා කොට වර්ෂය, ඍතුව, පක්ෂය සඳහන් කිරීමෙන් අනතුරු ව වැඩිහිටි භික්ෂුව විසින් උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට;

**''පරිසුද්ධො අහං ආවුසො! පරිසුද්ධොති මං ධාරේහි, පරිසුද්ධො අහං ආවුසො! පරිසුද්ධොති මං ධාරේහි, පරිසුද්ධො අහං ආවුසො! පරිසුද්ධොති මං ධාරේහි''**

යැයි ප්‍රකාශ කළ යුතු ය.

ඉන්පසු නවක භික්ෂුව විසින් උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට;

**''පරිසුද්ධො අහං භන්තේ! පරිසුද්ධොති මං ධාරේථ, පරිසුද්ධො අහං භන්තේ! පරිසුද්ධොති මං ධාරේථ, පරිසුද්ධො අහං භන්තේ! පරිසුද්ධොති මං ධාරේථ''**

යැයි ප්‍රකාශ කළ යුතු ය.

**● අධිෂ්ඨාන උපෝසථය; එක් භික්ෂුවක් වූ විට;**

උපෝසථය කරන දිනයේ දී ආවාසයේ සිටිනුයේ එක් භික්ෂුවක් නම් මෙහි දී ඒ භික්ෂුව විසින් සාමාන්‍යයෙන් උපෝසථය කරන ස්ථානය ඇමද පැන් හා පරිභෝගයට ගන්නා දිය එළවා අසුන් පනවා පහන් දල්වා හිඳිය යුතු ය. ඉදින් අන් මහණහු එහි එත් ද, ඔවුන් සමග පොහොය කළ යුතු ය. ඉදින් නො එත් නම් වැඳ නමස්කාරය ප්‍රකාශ කොට වර්ෂය, ඍතුව, පක්ෂය සලකාගෙන, පසළොස්වක හෝ තුදුස්වක දිනයක් නම්;

**''අජ්ජ මේ උපෝසථෝ පණ්ණරසො'' (චාතුද්දසො)**

යි අධිෂ්ඨානය කළ යුතු ය.

# වස් අධිෂ්ඨානය කිරීම

වස් එළඹෙන දිනයෙහි විහාරය පිරිසිදු කොට පූර්ව කෘත්‍ය සිදු කොට උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට;

**''ඉමස්මිං විහාරේ ඉමං තේමාසං වස්සං උපේමි. ඉධ වස්සං උපේමි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

❀ ❀ ❀

● වස් අධිෂ්ඨානය කළ භික්ෂුවක් යම් හෙයකින් වස් විසූ ආවාසයෙන් යම් කරුණක් නිසා පිටත් ව යන්නේ නම් නැවත සත් දිනක් ඇතුළත පැමිණෙමි යි මෙසේ අධිෂ්ඨාන කළ යුතු ය.

**''සචෙ මෙ කෝචි අන්තරායෝ න භවිස්සති සත්තාහබ්භන්තරේ පුන නිවත්තිස්සාමි''**

ඉදින් යම් කිසි අනතුරක් නො වුණේ නම් සත්වන දින අරුණට පළමු නැවත පැමිණෙමි.

# පවාරණපුබ්බකරණාදි විධි

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

**විනය පුච්ඡා සම්මුති :-**

සුණාතු මේ භන්තේ සඞ්ඝෝ, යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං....(ථේරං/භික්ඛුං) විනයං පුච්ඡෙය්‍යං.

**විනය විස්සජ්ජන සම්මුති :-**

සුණාතු මේ භන්තේ සඞ්ඝෝ, යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මතා.... (ථේරේන /භික්ඛුනා) විනයං පුට්ඨෝ විස්සජ්ජෙය්‍යං.

**පුච්ඡා :-**

සම්මජ්ජනී පදීපෝ ච - උදකං ආසනේන ච
පවාරණාය ඒතානි - පුබ්බකරණන්ති වුච්චති.

ඔකාස! සම්මජ්ජනී සම්මජ්ජනකරණං කතං කිං?

**විස්සජ්ජන :-**

සම්මජ්ජනකරණං නිට්ඨිතං.

**පුච්ඡා :-**

පදීපෝ ච, පදීපුජ්ජලනං කතං කිං?

**විස්සජ්ජන :-**

පදීපුජ්ජලනං නිට්ඨිතං/ ඉදානි පන සූරියාලෝකස්ස අත්ථිතාය පදීපකිච්චං ඉධ නත්ථි.

**පුච්ඡා :-**

උදකං ආසනේන ච, ආසනේන සහ පානීයපරිභෝජනීය-උදකට්ඨපනං කතං කිං?

**විස්සජ්ජන :-**

ආසනේන සහ පානීයපරිභෝජනීයඋදකට්ඨපනං නිට්ඨිතං.

# පවාරණයෙහි පූර්වකරණ ආදී විධි

## ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!

**විනය ප්‍රශ්න විචාරීමේ සම්මුතිය :-**
ස්වාමීනි! සංඝ තෙමේ මාගේ කීම අසාවා. ඉදින් සංඝයාට ප්‍රාප්ත කාලය වී නම් මම ආයුෂ්මත්.... (තෙරුන් වහන්සේගෙන්/ භික්ෂුවගෙන්) විනය විචාරන්නෙමි.

**විනය ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීමේ සම්මුතිය :-**
ස්වාමීනි! සංඝ තෙමේ මාගේ කීම අසාවා. ඉදින් සංඝයාට ප්‍රාප්ත කාලය වී නම් මම ආයුෂ්මත්.... (තෙරුන් වහන්සේ විසින්/භික්ෂුව විසින්) විනය විමසන ලද්දේ විසඳන්නෙමි.

**ප්‍රශ්න විචාරීම :-**
ඇමදීම ද, පහන් දැල්වීම ද, ආසන පැනවීම සමග පැන් තැබීම ද යන ඒවා පවාරණයෙහි පූර්වකරණ යැයි කියනු ලැබේ.

අවසරයි! ඇමදීම, කෙසේ ද? ඇමදීම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
ඇමදීම නිමා කරන ලදී.

**ප්‍රශ්න විචාරීම :-**
පහන් දැල්වීම, කෙසේ ද? පහන් දැල්වීම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
පහන් දැල්වීම සිදු කරන ලදී./ දැන් සූර්යාලෝකය ඇති බැවින් පහන් දැල්වීමක් මෙහි නොමැත.

**ප්‍රශ්න විචාරීම :-**
අසුන් පැනවීම සමග පැන් තැබීම, කෙසේ ද? ආසන පැනවීම සමග පානය කළ යුතු පරිභෝග කළ යුතු පැන් තැබීම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
අසුන් පැනවීම සමග පානය කළ යුතු පරිභෝග කළ යුතු පැන් තැබීම නිමා කරන ලදී.

**පුච්ඡා :-**

පවාරණාය ඒතානි පුබ්බකරණන්ති වුච්චති කිං?

**විස්සජ්ජන :-**

ඒතානි චත්තාරි වත්තානි සම්මජ්ජනකරණාදීනි සඞ්ඝසන්නිපාතතෝ පඨමං කත්තබ්බත්තා, පවාරණාය, පවාරණකම්මස්ස පුබ්බකරණන්ති වුච්චති. පුබ්බකරණානීති අක්ඛාතානි.

**පුච්ඡා :-**

ඡන්දපවාරණා උතුක්ඛානං - භික්ඛුගණනා ච ඕවාදෝ,
පවාරණාය ඒතානි - පුබ්බකිච්චන්ති වුච්චති.

ඡන්දපවාරණා, ඡන්දපවාරණාරහානං භික්ඛූනං ඡන්දපවාරණාහරණං කතං කිං?

**විස්සජ්ජන :-**

ඡන්දපවාරණාහරණං ඉධ නත්ථි./ ඡන්දපවාරණාහරණං නිට්ඨිතං.

**පුච්ඡා :-**

උතුක්ඛානං, හේමන්තාදීනං තිණ්ණං උතූනං එත්තකං අතික්කන්තං, එත්තකං අවසිට්ඨන්ති. ඒවං උතු ආචික්ඛනං කතං කිං?

**විස්සජ්ජන :-**

උතූනීධ පන සාසනේ හේමන්තගිම්හවස්සානානං වසේන තීණි හොන්ති. අයං වස්සාන උතු, අස්මිං උතුම්හි අට්ඨ උපෝසථා, ඉමිනා පක්ඛේන ඒකෝ උපෝසථෝ සම්පත්තෝ පඤ්ච උපෝසථා අතික්කන්තා ද්වේ උපෝසථා අවසිට්ඨා.

**පුච්ඡා :-**

භික්ඛුගණනාච, ඉමස්මිං පවාරණග්ගේ සන්නිපතිතානං භික්ඛූනං ගණනා, කිත්තකා භික්ඛූ හොන්ති?

**ප්‍රශ්න විචාරීම :-**
කුමක් නිසා ඒවා පවාරණයෙහි පූර්වකරණ යැයි කියනු ලැබේ ද?

**පිළිතුරු ලබාදීම :-**
පවාරණයෙහි ඇමදීම ආදී ඒ වත් සතර සංඝරත්නයේ පැමිණීමට පළමුව කළ යුතු බැවින් පවාරණය කර්මයේ පූර්වකරණය යැයි කියනු ලැබේ. පූර්වකරණ යැයි කියන ලද්දාහු වෙත්.

**ප්‍රශ්න විචාරීම :-**
ඡන්ද පවාරණය ගෙන ඒම, ඍතුව කීම, භික්ෂූන් වහන්සේලා ගණන් කිරීම ද, අවවාද දීම ද යන ඒවා පවාරණයෙහි පූර්ව කෘත්‍ය යැයි කියනු ලැබේ.

ඡන්ද පවාරණ, කෙසේ ද? ඡන්ද පවාරණ දීමට සුදුසු භික්ෂූන්ගේ ඡන්ද පවාරණ ගෙන ඒම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
ඡන්ද පවාරණ ගෙන ඒමක් මෙහි නොමැත./ ඡන්ද පවාරණ ගෙන ඒම නිම කරන ලදී.

**ප්‍රශ්න විචාරීම :-**
ඍතු කීම, කෙසේ ද? හේමන්ත ආදී ඍතු තුනට අනුව මෙ පමණක් ඉක්ම ගියේ, මෙ පමණක් ශේෂ වූයේ යැයි මෙසේ ඍතුව කීම කරන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**
මේ ශාසනයෙහි හේමන්ත, ගිම්හාන, වස්සාන වශයෙන් ඍතු තුනක් වෙත්. මේ වස්සාන ඍතුවයි, මේ ඍතුවෙහි අටක් වූ උපෝසථයෝ වෙත්, මෙම පක්ෂයෙන් එක් පොහොයක් පැමිණියේ වෙයි. උපෝසථ පහක් ඉක්ම ගියහ. උපෝසථ දෙකක් ශේෂ වූහ.

**ප්‍රශ්න විචාරීම :-**
භික්ෂූන් ගණන් කිරීම, මෙම පවාරණ ගෙහි රැස්වූ භික්ෂූන්ගේ ගණනින් කොපමණ භික්ෂූහු වෙත් ද?

**විස්සජ්ජන :-**

ඉමස්මිං පවාරණග්ගේ සන්නිපතිතානං භික්ඛූනං ගණනා..... භික්ඛූ හොන්ති.

**පුච්ඡා :-**

ඕවාදො, භික්ඛුණීනං ඕවාදො දාතබ්බො දින්නො කිං?

**විස්සජ්ජන :-**

ඉදානි පන තාසං නත්ථිතාය සො ච ඕවාදො ඉධ නත්ථි.

**පුච්ඡා :-**

පවාරණාය ඒතානි පුබ්බකිච්චන්ති වුච්චති කිං?

**විස්සජ්ජන :-**

ඒතානි පඤ්චකම්මානි ඡන්දාහරණාදීනි පවාරණාය ඤත්ති ඨපනතො පඨමං කත්තබ්බත්තා පවාරණාය, පවාරණකම්මස්ස පුබ්බකිච්චන්ති වුච්චති. පුබ්බකිච්චානීති අක්ඛාතානි.

**පුච්ඡා :-**

පවාරණා යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා සභාගාපත්තියෝ ච, න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති.

පවාරණා, තීසු පවාරණදිවසේසු චාතුද්දසීපණ්ණරසීසාමග්ගීසු අජ්ජ පවාරණා කා පවාරණා?

**විස්සජ්ජන :-**

අජ්ජ පවාරණා පණ්ණරසී. (චාතුද්දසී)

**පුච්ඡා :-**

යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තාති කිං?

**විස්සජ්ජන :-**

යත්තකා භික්ඛූ තස්ස පවාරණකම්මස්ස, පත්තා යුත්තා අනුරූපා, සබ්බන්තිමේන පරිච්ඡේදේන චත්තාරෝ භික්ඛූ පකතත්තා. සඞ්ඝේන අනුක්ඛිත්තා, තේ ච ඛෝ හත්ථපාසං අවිජහිත්වා ඒකසීමායං ඨිතා.

**පිළිතුරු ලබාදීම :-**

මෙම පවාරණ ගෙහි රැස්වූ භික්ෂූන්ගේ ගණනින් භික්ෂූන් වහන්සේලා ...... නමක් වෙත්.

**ප්‍රශ්න විචාරීම :-**

අවවාද දීම, කෙසේ ද? කිම භික්ෂුණීන්ට දිය යුතු අවවාද දෙන ලද්දේ ද?

**පිළිතුරු ලබාදීම :-**

දැන් වනාහී අදාළ නොමැති බැවින් ඒ අවවාද දීමක් මෙහි නැත.

**ප්‍රශ්න විචාරීම :-**

කුමක් නිසා ඒවා පවාරණයෙහි පූර්ව කෘත්‍ය යැයි කියනු ලැබේ ද?

**පිළිතුරු ලබාදීම :-**

පවාරණයෙහි ඒ ඡන්දය රැගෙන ඒම ආදී ක්‍රියා පහ පවාරණය පිණිස ඥත්තිය තැබීමට පළමුව කළ යුතු බැවින්, පවාරණ කර්මයේ පූර්ව කෘත්‍ය යැයි කියනු ලැබේ. පූර්ව කෘත්‍යයෝ යැයි කියන ලද්දාහු වෙති.

**ප්‍රශ්න විචාරීම :-**

පවාරණ දිනය ද, පැමිණිය යුතු යම්තාක් භික්ෂූන් වහන්සේලා පවාරණ කර්මයට පැමිණියාහු ද, සමාන ඇවැත් කිසිවක් විද්‍යමාන නො වෙත් ද, බැහැර කළ යුතු පුද්ගලයන් පවාරණ ගෙයි නො වෙත් ද, එවිට එය පවාරණ කර්මයට පැමිණි කල් ඇත්තේ යැයි කියනු ලැබේ.

පවාරණය; චාතුද්දසී, පණ්ණරසී, සාමග්‍රී යන උපෝසථ දින තුන අතුරින් අද පවාරණය කවර පවාරණයක් ද?

**පිළිතුරු ලබාදීම :-**

අද පවාරණය පණ්ණරසී (චාතුද්දසී) පවාරණයකි.

**ප්‍රශ්න විචාරීම :-**

කිමෙක් ද? පැමිණිය යුතු යම්තාක් භික්ෂූන් වහන්සේලා පවාරණ කර්මයට පැමිණියාහූ ද?

**පිළිතුරු ලබාදීම :-**

යම් පමණ භික්ෂූන් වහන්සේලා ඒ පවාරණ කර්මයට පැමිණියාහූ ද, ඇතුළත් වූවාහූ ද, ගැළපුනාහූ ද, යටත් පිරිසෙයින් භික්ෂූන් වහන්සේලා සතර නමක්වත් ප්‍රකෘති භික්ෂූහු ද වෙත්. සංඝරත්නය විසින් උක්ෂේපණීය කර්මය නො කරන ලද්දාහූ, ඒ භික්ෂූන් වහන්සේලා අත්පසින් බැහැර නො වී එක සීමාවක වැඩ සිටියාහූ වෙත්.

**පුච්ඡා :-**
සභාගාපත්තියො ච න විජ්ජන්ති කිං?

**විස්සජ්ජන :-**
විකාලභොජනාදී වත්ථුසභාගාපත්තියො ච න විජ්ජන්ති.

**පුච්ඡා :-**
වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති කිං?

**විස්සජ්ජන :-**
ගහට්ඨපණ්ඩකාදයො ඒකවීසති වජ්ජනීයපුග්ගලා හත්ථපාසතො බහිකරණවසේන වජ්ජේතබ්බා. තේ අස්මිං න හොන්ති.

**පුච්ඡා :-**
පත්තකල්ලන්ති වුච්චති කිං?

**විස්සජ්ජන :-**
සඞ්ඝස්ස පවාරණකම්මං ඉමේහි චතූහි ලක්ඛණේහි සඞ්ගහිතං පත්තකල්ලන්ති වුච්චති. පත්තකාලවන්තන්ති අක්ඛාතං. පුබ්බකරණපුබ්බකිච්චානි සමාපෙත්වා දේසිතාපත්තිකස්ස සමග්ගස්ස භික්ඛුසඞ්ඝස්ස අනුමතියා පවාරණාය පවාරණකම්මස්ස ඤත්තිං ඨපේතුං ආරාධනං කරෝමි.

## සාධු ! සාධු !! සාධු !!!

## පවාරණපුබ්බකරණාදි විධි සමත්තා.

**ප්‍රශ්න විචාරීම :-**
කිමෙක් ද? සමාන ඇවැත් විද්‍යමාන නො වෙත් ද?

**පිළිතුරු ලබාදීම :-**
විකාල භෝජන ආදී සමාන වස්තු සහිත ඇවැත් විද්‍යමාන නො වෙත්.

**ප්‍රශ්න විචාරීම :-**
කිමෙක් ද? බැහැර කළ යුතු පුද්ගලයින් පවාරණ ගෙයි නො වෙත් ද?

**පිළිතුරු ලබාදීම :-**
ගිහි, පණ්ඩක ආදී එක් විසි වජ්ජනීය පුද්ගලයෝ අත්පසින් බැහැර කිරීම් වශයෙන් බැහැර කළ යුත්තාහු ය. ඔවුහු මෙහි නො වෙත්.

**ප්‍රශ්න විචාරීම :-**
කුමක් හෙයින් පැමිණි කල් ඇත්තේ යැයි කියනු ලැබේ ද?

**පිළිතුරු ලබාදීම :-**
සංඝයා වහන්සේලාගේ පවාරණ කර්මය මෙම ලක්ෂණ සතරින් සංග්‍රහ වූයේ පැමිණි කල් ඇත්තේ යැයි කියනු ලැබේ. පවාරණ කර්මය සඳහා සුදුසු කාලය පැමිණියේ යැයි කියන ලදී.

පූර්වකරණ, පූර්ව කෘත්‍ය නිමා කොට දෙසන ලද ආපත්ති ඇති සමගි භික්ෂු සංඝයා වහන්සේලාගේ අනුමැතියෙන් පවාරණය පිණිස පවාරණ කර්මයාගේ ඤත්තිය තැබීමට ආරාධනා කරමි.

**සාදූ ! සාදූ !! සාදූ !!!**

## පවාරණයෙහි පූර්වකරණ ආදී විධි සමාප්තයි.

# සඞ්ඝ පවාරණ විධි

ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ ඊට වැඩි භික්ෂූන් ප්‍රමාණයක් වැඩ සිටී නම් ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් පවාරණ ඤත්තිය තැබිය යුතු ය. (මෙහි ඤත්තිය තැබූ කල්හි එක් වරක් හෝ දෙවරක් හෝ තෙවරක් හෝ කියා පවාරණය කළ හැකි ය.)

**''සුණාතු මෙ භන්තේ! සඞ්ඝො. අජ්ජ පවාරණා (පණ්ණරසී/චාතුද්දසී) යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍ය.''**

යි ප්‍රකාශ කළ යුතු ය.

ඉන්පසු වැඩිමහල් භික්ෂුනම විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට පවාරණය කළ යුතු ය.

**''සඞ්ඝං ආවුසො! පවාරේමි. දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තෝ අනුකම්පං උපාදාය. පස්සන්තෝ පටිකරිස්සාමි.''**
**දුතියම්පි ආවුසො! සඞ්ඝං පවාරේමි.......**
**තතියම්පි ආවුසො! සඞ්ඝං පවාරේමි.......**

යි තෙවාචික පවාරණයේ දී ප්‍රකාශ කළ යුතු ය.

ඉන්පසු නවක භික්ෂුනම විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට පවාරණය කළ යුතු ය.

**''සඞ්ඝං භන්තේ! පවාරේමි. දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තෝ අනුකම්පං උපාදාය. පස්සන්තෝ පටිකරිස්සාමි.''**
**දුතියම්පි භන්තේ! සඞ්ඝං පවාරේමි.......**
**තතියම්පි භන්තේ! සඞ්ඝං පවාරේමි.......**

යි තෙවාචික පවාරණයේ දී ප්‍රකාශ කළ යුතු ය.

## ● ගණ පවාරණය

ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි සිවු නමක් භික්ෂූන් වැඩ සිටී නම් ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනම විසින් පවාරණ ඤත්තිය තැබිය යුතු ය.

**"සුණන්තු මෙ ආයස්මන්තො. අජ්ජ පවාරණා (පණ්ණරසී/චාතුද්දසී). යදායස්මන්තානං පත්තකල්ලං, මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම."**

යි ප්‍රකාශ කළ යුතු ය.

ඉන්පසු වැඩිමහල් භික්ෂුනම විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට පවාරණය කළ යුතු ය.

**"අහං ආවුසො! ආයස්මන්තේ පවාරේමි. දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි."**

**දුතියම්පි අහං ආවුසො! ආයස්මන්තේ .......**

**තතියම්පි අහං ආවුසො! ආයස්මන්තේ .......**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

ඉන්පසු නවක භික්ෂුනම විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට පවාරණය කළ යුතු ය.

**"අහං භන්තේ! ආයස්මන්තේ පවාරේමි. දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි."**

**දුතියම්පි අහං භන්තේ! ආයස්මන්තේ .......**

**තතියම්පි අහං භන්තේ! ආයස්මන්තේ .......**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## ● තුන්නමක් වූ විට පවාරණය

ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි තුන්නමක් භික්ෂූන් වැඩ සිටී නම් ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනම විසින් පවාරණ ඤත්තිය තැබිය යුතු ය.

**''සුණන්තු මෙ ආයස්මන්තා. අජ්ජ පවාරණා (පණ්ණරසී/චාතුද්දසී). යදායස්මන්තානං පත්තකල්ලං, මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම.''**

යි ප්‍රකාශ කළ යුතු ය.

ඉන්පසු වැඩිමහල් භික්ෂූනම විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට පවාරණය කළ යුතු ය.

**''අහං ආවුසෝ! ආයස්මන්තේ පවාරේමි. දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තා අනුකම්පං උපාදාය. පස්සන්තෝ පටිකරිස්සාමි.''**

**දුතියම්පි අහං ආවුසෝ! ආයස්මන්තේ .......**

**තතියම්පි අහං ආවුසෝ! ආයස්මන්තේ .......**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

ඉන්පසු නවක භික්ෂූනම විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට පවාරණය කළ යුතු ය.

**''අහං භන්තේ! ආයස්මන්තේ පවාරේමි. දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තා අනුකම්පං උපාදාය. පස්සන්තෝ පටිකරිස්සාමි.''**

**දුතියම්පි අහං භන්තේ! ආයස්මන්තේ .......**

**තතියම්පි අහං භන්තේ! ආයස්මන්තේ .......**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## ● දෙනමක් වූ විට පවාරණය

ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි දෙනමක් භික්ෂූන් වැඩ සිටී නම් වැඩිමහල් භික්ෂුනම විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට පවාරණය කළ යුතු ය.

**''අහං ආවුසෝ! ආයස්මන්තං පවාරේමි. දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය. පස්සන්තෝ පටිකරිස්සාමි.''**

**දුතියම්පි අහං ආවුසෝ! ආයස්මන්තං .......**

**තතියම්පි අහං ආවුසෝ! ආයස්මන්තං .......**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

ඉන්පසු අනෙක් භික්ෂුනම විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට පවාරණය කළ යුතු ය.

**''අහං භන්තේ! ආයස්මන්තං පවාරේමි. දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය. පස්සන්තෝ පටිකරිස්සාමි.''**

**දුතියම්පි අහං භන්තේ! ආයස්මන්තං .......**

**තතියම්පි අහං භන්තේ! ආයස්මන්තං .......**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## ● එක්නමක් වූ විට පවාරණය

ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි එක් නමක් වැඩ සිටී නම් ඒ භික්ෂුනම විසින් භික්ෂූහු උපස්ථාන ශාලාවක හෝ මණ්ඩපයෙක හෝ රුක්මුලෙක හෝ යම් තැනෙක රැස්වෙත් ද, ඒ පෙදෙස හැමද පැන් එළවා තබා අසුන් පණවා පහන් දල්වා හිඳිය යුතු ය. වෙනත් භික්ෂූහු එත් නම්, ඔවුන් සමග පැවරිය යුතු ය. ඉදින් නො එත් නම් වැඳ නමස්කාරය ප්‍රකාශ කොට වර්ෂය, ඍතුව, පක්ෂය සලකාගෙන, පසළොස්වක හෝ තුදුස්වක දිනයක් නම්;

**''අජ්ජ මේ පවාරණා පණ්ණරසී'' (චාතුද්දසී)**

යි අධිෂ්ඨානය කළ යුතු ය.

# කඨිනත්ථරණය

## • කඨින සිවුර සාංඝික කිරීම

දායකයන් විසින් කඨින දුස්සය (වස්ත්‍රය)/ කඨින සිවුර අත්ලෙහි තබාගෙන තුන් වතාවක් නමස්කාරය කීම. ඉන්පසු උපසපන් භික්ෂුවක් විසින් වාක්‍ය කියවිය යුතු ය.

**''ඉමං කඨිනදුස්සං භික්ඛුසඞ්ඝස්ස දේම.''**

හෝ ගෙනෙන්නේ චීවරයක් නම්;

**''ඉමං කඨිනචීවරං භික්ඛුසඞ්ඝස්ස දේම.''**

යැයි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## • කඨින චීවරය පැවරීමේ කර්ම වාක්‍ය

තුන් වතාවක් නමස්කාරය කියා කර්ම වාක්‍ය කීම;

සැ.යු:-
''**නාගස්ස**'' යන තැනට කඨින චීවර ලබන භික්ෂුවගේ නම යොදා කියනු මැනවි. මෙහි දී වස්ත්‍රයක් නම් ''**කඨිනචීවරං**'' වෙනුවට ''**කඨිනදුස්සං**'' යනුවෙන් යෙදිය යුතු ය.

**සුණාතු මේ භන්තේ සඞ්ඝෝ, ඉදං සඞ්ඝස්ස කඨිනචීවරං උප්පන්නං, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝෝ, ඉමං කඨිනචීවරං (නාගස්ස) භික්ඛුනෝ දදෙය්‍ය කඨිනං අත්ථරිතුං ඒසා ඤත්ති.**

**සුණාතු මේ භන්තේ සඞ්ඝෝ, ඉදං සඞ්ඝස්ස කඨිනචීවර උප්පන්නං, සඞ්ඝෝ, ඉමං කඨිනචීවරං (නාගස්ස) භික්ඛුනෝ දේති කඨිනං අත්ථරිතුං. යස්සායස්මතෝ ඛමති ඉමස්ස කඨිනචීවරස්ස**

**(නාගස්ස) භික්ඛුනෝ දාතුං කඨිනං අත්ථරිතුං, සෝ තුණ්හස්ස. යස්ස නක්ඛමති, සෝ භාසෙය්‍ය.**

**දින්නං ඉදං සඞ්ඝේන කඨිනචීවරං (නාගස්ස) භික්ඛුනෝ කඨිනං අත්ථරිතුං ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.**

## ● කඨිනය ඇතිරීම

දායකයන් විසින් දුන් කඨින දුස්සය (වස්ත්‍රය) ඒ දවස ම සෝදා, පිරිමැද (රැලි හැර), කඩ අතු බෙදා සිඳ, ගණ්ඨිපාස, ජඞ්ඝෙය්‍ය, ගීවෙය්‍ය ආදියෙන් පිරිපුන් සිවුරක් කොට මසා පඬු පොවා කප්බිංදු තබා කඨිනය ඇතිරිය යුතු ය. ඉදින් දෙපට සිවුරක් (සඞ්ඝාටිය) මසා ගත්තේ නම් පුරාණ අධිෂ්ඨාන කළ දෙපට සිවුර පච්චුද්ධරණය කළ යුතු ය. නව දෙපට සිවුර සඞ්ඝාටිය ලෙස අධිෂ්ඨාන කළ යුතු ය. **(අධිෂ්ඨානය සහ පච්චුද්ධරණය කරන ආකාරය උපග්‍රන්ථය - I හි බලනු මැනවි. පි. 236-237)**

**''ඉමාය සඞ්ඝාටියා කඨිනං අත්ථරාමි.''**

(මේ සඞ්ඝාටියෙන් කඨිනය අතුරමි යි) තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

ඉදින් තනිපට සිවුරක් (උත්තරාසඞ්ගය) මසා ගත්තේ නම් පුරාණ අධිෂ්ඨාන කළ තනිපට සිවුර පච්චුද්ධරණය කළ යුතු ය. නව තනිපට සිවුර උත්තරාසඞ්ගය ලෙස අධිෂ්ඨාන කළ යුතු ය.

**''ඉමිනා උත්තරාසඞ්ගේන කඨිනං අත්ථරාමි.''**

(මේ උත්තරාසඞ්ගයෙන් කඨිනය අතුරමි යි) තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

ඉදින් අඳන සිවුරක් (අන්තරවාසකය) මසා ගත්තේ නම් පුරාණ අධිෂ්ඨාන කළ අඳන සිවුර පච්චුද්ධරණය කළ යුතු ය. නව අඳන සිවුර අන්තරාවාසකය ලෙස අධිෂ්ඨාන කළ යුතු ය.

**''ඉමිනා අන්තරවාසකේන කඨිනං අත්ථරාමි.''**

(මේ අන්තරවාසකයෙන් කඨිනය අතුරමි යි) තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## • කඨිනත්ථාරණ අනුමෝදනය

කඨින චීවරය ලැබූ භික්ෂුව තමන් සමග එකට වස් විසූ ස්වාමීන් වහන්සේලාට අනුසස් අනුමෝදන් කළ යුතු ය. කඨින චීවරය ලැබූ භික්ෂුව සංඝයා වෙත එළඹ සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට;

**''අත්ථතං (ආවුසෝ/භන්තේ) සඞ්ඝස්ස කඨිනං. ධම්මිකෝ කඨිනත්ථාරෝ (අනුමෝදාහි/ අනුමෝදථ).''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

අනුසස් අනුමෝදන් වන සෙසු භික්ෂුව/ භික්ෂූන් වහන්සේලා විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ තෙවරක් නමස්කාරය ප්‍රකාශ කොට;

**''අත්ථතං (ආවුසෝ/භන්තේ) සඞ්ඝස්ස කඨිනං. ධම්මිකෝ කඨිනත්ථාරෝ (අනුමෝදාමි/ අනුමෝදාම).''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## • කඨිනෝද්ධාර විනය කර්ම වාක්‍ය

**සුණාතු මේ භන්තේ සඞ්ඝෝ, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝෝ කඨිනං උද්ධරෙය්‍ය, ඒසා ඤත්ති.**

**සුණාතු මේ භන්තේ සඞ්ඝෝ, සඞ්ඝෝ කඨිනං උද්ධරති, යස්සායස්මතෝ ඛමති කඨිනස්ස උබ්භාරෝ, සෝ තුණ්හස්ස. යස්ස නක්ඛමති, සෝ භාසෙය්‍ය.**

**උබ්භතං සඞ්ඝේන කඨිනං, ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී, ඒවමේතං ධාරයාමි.**

# උපසම්පදා කර්මය

## • උපාධ්‍යාය ග්‍රහණය

උපාධ්‍යාය :-

**පඨමං උපජ්ඣං ගාහාපේතබ්බෝ.**

සාමණේර :-

**උපජ්ඣායෝ මෙ භන්තේ හෝහි !**

උපාධ්‍යාය :-

**පතිරූපං.**

සාමණේර :-

**සාධු ඕකාස සම්පටිච්ඡාමි.**

## • පාසිවුරු විචාරීම

**උපජ්ඣං ගාහාපෙත්වා පත්තචීවරං ආචික්ඛිතබ්බං.**

| පුච්ඡා :- | විස්සජ්ජන :- |
|---|---|
| **අයං තේ පත්තෝ ?** | **ආම භන්තේ !** |
| **අයං සංඝාටි ?** | **ආම භන්තේ !** |
| **අයං උත්තරාසඞ්ගෝ ?** | **ආම භන්තේ !** |
| **අයං අන්තරවාසකෝ ?** | **ආම භන්තේ !** |

• නාම සම්මුතිය දීම

උපාධ්‍යායන් වහන්සේට ''තිස්ස'' යන නාමයද උපසම්පදාපේක්ෂකයාහට ''නාග'' යන නාමයද සඞ්ඝයා විසින් සම්මත කිරීම.

• හෙරණ අත්පසින් බැහැර කිරීම

**ගච්ඡ, අමුම්හි ඕකාසේ තිට්ඨාහි.**

• අනුශාසක සම්මුතිය

**සුණාතු මෙ භන්තේ සඞ්ඝො, නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො[1], යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං නාගං අනුසාසෙය්‍යං.**

• සඟ අත්පස හැර අන්තරායික ධර්ම විචාරීම

**සුණසි නාග ! අයං තේ සච්චකාලො, භූතකාලො, යං ජාතං තං සඞ්ඝමජ්ඣෙ පුච්ඡන්තේ සන්තං අත්ථීති වත්තබ්බං. අසන්තං නත්ථීති වත්තබ්බං. මා ඛො විත්ථාසි[2], මා ඛො මඞ්කු අහෝසි. ඒවං තං පුච්ඡිස්සන්ති, සන්ති තේ ඒවරූපා ආබාධා?**

1. උපසම්පදාපෙඛො (බු.ජ.මු.)
2. විත්ථායි (ම.ඡ.සං.)

| පුච්ඡා :- | විස්සජ්ජන :- |
| --- | --- |
| කුට්ඨං ? | නත්ථි භන්තේ ! |
| ගණ්ඩෝ ? | නත්ථි භන්තේ ! |
| කිලාසෝ ? | නත්ථි භන්තේ ! |
| සෝසෝ ? | නත්ථි භන්තේ ! |
| අපමාරෝ ? | නත්ථි භන්තේ ! |
| මනුස්සෝ'සි ? | ආම භන්තේ ! |
| පුරිසෝ'සි ? | ආම භන්තේ ! |
| භුජිස්සෝ'සි ? | ආම භන්තේ ! |
| අනණෝ'සි ? | ආම භන්තේ ! |
| නසි රාජභටෝ ? | ආම භන්තේ ! |
| අනුඤ්ඤාතෝ'සි මාතාපිතූහි? | ආම භන්තේ ! |
| පරිපුණ්ණවීසතිවස්සෝ'සි? | ආම භන්තේ ! |
| පරිපුණ්ණං තේ පත්තචීවරං? | ආම භන්තේ ! |
| කිං නාමෝසි ? | අහං භන්තේ ! නාගෝ නාම. |
| කෝ නාමෝ තේ උපජ්ඣායෝ ? | උපජ්ඣායෝ මේ භන්තේ! ආයස්මා තිස්සත්ථේරෝ නාම. |

• හෙරණ සඟ අත්පසට කැඳවීම

සුණාතු මේ භන්තේ! සඞ්ඝො, නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො අනුසිට්ඨො සො මයා යදි සඞ්ඝස්ස පත්තකල්ලං නාගො ආගච්ඡෙය්‍ය.

''ආගච්ඡාහීති වත්තබ්බො'' ආගච්ඡාහි.

• උපසම්පදා යාචනා වාක්‍යය

සඞ්ඝං භන්තේ! උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං භන්තේ සඞ්ඝො අනුකම්පං උපාදාය.

දුතියම්පි භන්තේ! සඞ්ඝං උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං භන්තේ සඞ්ඝො අනුකම්පං උපාදාය.

තතියම්පි භන්තේ! සඞ්ඝං උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං භන්තේ සඞ්ඝො අනුකම්පං උපාදාය.

• අනුසාසක සම්මුතිය

සුණාතු මේ භන්තේ! සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං නාගං අන්තරායිකේ ධම්මේ පුච්ඡෙය්‍යං.

• සඟ අත්පස සිට අන්තරායික ධර්ම විචාරීම

සුණසි නාග ! අයං තේ සච්චකාලො, භූතකාලො, යං ජාතං තං පුච්ඡාමි. සන්තං

අත්ථීති වත්තබ්බං, අසන්තං නත්ථීති වත්තබ්බං. සන්ති තේ ඒවරූපා ආබාධා ?

පුච්ඡා :- විස්සජ්ජන :-

කුට්ඨං ? නත්ථි භන්තේ !

ගණ්ඩෝ ? නත්ථි භන්තේ !

කිලාසෝ ? නත්ථි භන්තේ !

සෝසෝ ? නත්ථි භන්තේ !

අපමාරෝ ? නත්ථි භන්තේ !

මනුස්සෝ'සි ? ආම භන්තේ !

පුරිසෝ'සි ? ආම භන්තේ !

භුජිස්සෝ'සි ? ආම භන්තේ !

අනණෝ'සි ? ආම භන්තේ !

නසි රාජභටෝ ? ආම භන්තේ !

අනුඤ්ඤාතෝ'සි මාතාපිතූහි? ආම භන්තේ !

පරිපුණ්ණවීසතිවස්සෝ'සි? ආම භන්තේ !

පරිපුණ්ණං තේ පත්තචීවරං? ආම භන්තේ !

කිං නාමෝසි ? අහං භන්තේ ! නාගෝ නාම.

කෝ නාමෝ තේ උපජ්ඣායෝ ? උපජ්ඣායෝ මේ භන්තේ! ආයස්මා තිස්සත්ථේරෝ නාම.

# උපසම්පදා කර්ම වාක්‍යය

සුණාතු මෙ භන්තේ! සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො පරිසුද්ධො අන්තරායිකේහි ධම්මෙහි, පරිපුණ්ණස්ස පත්තචීවරං. නාගො සඞ්ඝං උපසම්පදං යාචති, ආයස්මතා තිස්සේන උපජ්ඣායේන, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො නාගං උපසම්පාදෙය්‍ය, ආයස්මතා තිස්සේන උපජ්ඣායේන, ඒසා ඤත්ති.

සුණාතු මෙ භන්තේ! සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො පරිසුද්ධො අන්තරායිකේහි ධම්මෙහි, පරිපුණ්ණස්ස පත්තචීවරං. නාගො සඞ්ඝං උපසම්පදං යාචති, ආයස්මතා තිස්සේන උපජ්ඣායේන. සඞ්ඝො නාගං උපසම්පාදේති, ආයස්මතා තිස්සේන උපජ්ඣායේන. යස්සායස්මතො ඛමති, නාගස්ස උපසම්පදා

ආයස්මතා තිස්සේන උපජ්ඣායේන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තේ! සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො පරිසුද්ධො අන්තරායිකේහි ධම්මෙහි, පරිපුණ්ණස්ස පත්තචීවරං. නාගො සඞ්ඝං උපසම්පදං යාචති, ආයස්මතා තිස්සේන උපජ්ඣායේන. සඞ්ඝො නාගං උපසම්පාදේති, ආයස්මතා තිස්සේන උපජ්ඣායේන. යස්සායස්මතො ඛමති, නාගස්ස උපසම්පදා ආයස්මතා තිස්සේන උපජ්ඣායේන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තේ! සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො පරිසුද්ධො

අන්තරායිකේහි ධම්මේහි, පරිපුණ්ණස්ස පත්තචීවරං. නාගෝ සඞ්ඝං උපසම්පදං යාචති, ආයස්මතා තිස්සේන උපජ්ඣායේන. සඞ්ඝෝ නාගං උපසම්පාදේති, ආයස්මතා තිස්සේන උපජ්ඣායේන. යස්සායස්මතෝ ඛමති, නාගස්ස උපසම්පදා ආයස්මතා තිස්සේන උපජ්ඣායේන, සෝ තුණ්හස්ස. යස්ස නක්ඛමති, සෝ භාසෙය්‍ය.

උපසම්පන්නෝ සඞ්ඝේන නාගෝ ආයස්මතා තිස්සේන උපජ්ඣායේන, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, ඒවමේතං ධාරයාමි.

❀ ❀ ❀

# උපසම්පදාව අවසානයේදී කරන අනුසාසනය.

**තාවදෙව ඡායා මෙතබ්බා, උතුප්පමාණං ආචික්ඛිතබ්බං. දිවසභාගො ආචික්ඛිතබ්බො. සඞ්ගීති ආචික්ඛිතබ්බා. චත්තාරෝ නිස්සයා ආචික්ඛිතබ්බා. චත්තාරි අකරණීයානි ආචික්ඛිතබ්බානි.**

සකලඥෙය පාරගත මහා කාරුණික වූ අප භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙසේ වදාරා ඇති බැවින් සුපටිපන්නතාදී ගුණගණෝපේත මහා සඞ්ඝයා වහන්සේ විසින් පරම නිර්මල උපසම්පදාවෙන් අභිෂේක කරන ලද ආයුෂ්මතාහට මේ සීමා මාලකයේදී ම උපසම්පදාව ලැබූ වේලාවේ ඡායා ප්‍රමාණය ද, ඍතු ප්‍රමාණය ද, දිවසභාගය ද, ඒ සියල්ල ද, නිඃශ්‍රය සතර ද, අකරණීය සතර ද යන මේවා කියා දීමට අනුදැන වදාරා ඇති බැවින් අපගේ කීමට ආදරයෙන් ඇහුම්කන් දුන මැනවි.

පරම පරිශුද්ධෝපසම්පදා සීලයෙන් අභිෂේකලත් ආයුෂ්මතාණෙනි ! ඔබ ශ්‍රී බුද්ධ වර්ෂයෙන් ............... වැන්නෙහි ............... තිපීයලත් ............... දින ව්‍යවහාර වර්ෂ ............... වැන්නෙහි ............... මස ............... වෙනි දින ............... ට ............... සීමා මාලකයේදී ............... ප්‍රමුඛ මහා සඞ්ඝයා වහන්සේ විසින් සාමණේර භූමියෙන් නඟා උපසම්පදා භික්ෂු භාවයට පමුණුවන ලද්දෙහි ය. ඒ බව දිවිහිමියෙන් මතක තබාගෙන ඉතා කුඩා සිකපදයකුදු නො කඩකොට ජීවිතය සේ දැන් ලත් උපසම්පදා ශීලය රක්නෙහිය.

සසර බිය දැක නිවන් පසක් කරනු රිසියෙන් බුදුසසුන් වන් ආයුෂ්මතාණෙනි! පැවිදි ජීවිතය පවත්වාගනු සඳහා මහා කාරුණිකයන් වහන්සේ අනුදැන වදාරා ඇති ''නිඃශ්‍රය සතර'' අසනු මැනවි.

**1. ''පිණ්ඩියාලෝපභෝජනං නිස්සාය පබ්බජ්ජා. තත්ථ තේ යාවජීවං උස්සාහෝ කරණීයෝ. අතිරේකලාභෝ සඞ්ඝභත්තං, උද්දේසභත්තං, නිමන්තනං, සලාකභත්තං, පක්ඛිකං, උපෝසථිකං, පාටිපදිකං.''**

ඇවැත්නි ! මේ පැවිද්ද පාත්‍රය ගෙන ගෙදොරක් පාසා ඇවිද පිඬ පිඬ බැගින් ලබාගන්නා භෝජනය නිසා පවත්නේ ය. තොප විසින් පිණ්ඩියාලෝප භෝජනයෙන් දිවිපැවැත්මෙහි දිවිහිමියෙන් උත්සාහ කළ යුතු ය. සකල සඞ්ඝයාහට දෙන දානය ය, දෙතුන් නම බැගින් සඟින් නිමන්ත්‍රණය කොට දෙන දානය ය, පෞද්ගලික වශයෙන් නිමන්ත්‍රණය කොට දෙන දානය ය, සලාක දානය ය, පක්‍ෂයකට වරක් බැගින් දෙන දානය ය, පෝය දිනයෙහි දෙන දානය ය, පෑලවිය දිනයෙහි දෙන දානය ය යන මේවා අතිරේක ලාභ වශයෙන් පිළිගත යුතු ය.

**2. ''පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා, තත්ථ තේ යාවජීවං උස්සාහෝ කරණීයෝ, අතිරේකලාභෝ ඛෝමං, කප්පාසිකං, කොසෙය්‍යං, කම්බලං, සාණං, භඞ්ගං.''**

පැවිද්ද පංසුකූල චීවරය නිසා පවත්නේය. ඔබ විසින් පංසුකූල චීවරයෙන් දිවි පැවැත්වීමෙහි දිවිහිමියෙන් උත්සාහ කළ යුතු ය. පූර්වකෘත කුශලානුභාවයෙන් ඔබට කොමු පිළිය, කපු පිළිය, පට පිළිය, කම්බිලිය, හණ පිළිය, මුසු පිළිය යන මේවා ලැබෙතොත් අතිරේක ලාභ වශයෙන් පරිභෝග කළ යුතු ය.

**3. ''රුක්ඛමූලසේනාසනං නිස්සාය පබ්බජ්ජා, තත්ථ තේ යාවජීවං උස්සාහෝ කරණීයෝ. අතිරේකලාභෝ විහාරෝ, අඩ්ඪයෝගෝ, පාසාදෝ, හම්මියං, ගුහා.''**

පැවිද්ද වෘක්ෂමූල සේනාසනය නිසා පවත්නේ ය. ඔබ විසින් වෘක්ෂමූල සේනාසනය ඇසුරු කරමින් දිවි පැවැත්වීමෙහි දිවිහිමියෙන් උත්සාහ කළ යුතු ය. ඉදින් පූර්වකෘත කුශලානුභාවයෙන් ලැබෙතොත් වෙහෙර ය, එක් පල ඇති ගෙය ය, සතර පල ඇති ගෙය ය, සඳළු සහිත ගෙය ය, ගුහා ය යන මේවා පරිභෝග කළ යුතු ය.

**4. ''පූතිමුත්තභේසජ්ජං නිස්සාය පබ්බජ්ජා. තත්ථ තේ යාවජීවං උස්සාහෝ කරණීයෝ. අතිරේකලාභෝ සප්පි, නවනීතං, තේලං, මධු, ඵාණිතං.''**

පැවිද්ද අරළු ගෝමුත්‍රයෙහි ලා සම්පාදනය කරන පූතිමුත්‍ර භේසජ්ජය නිසා පවත්නේය. පූතිමුත්‍ර භේසජ්ජයෙන් දිවිපැවැත්මෙහි ඔබ විසින් දිවිහිමියෙන් උත්සාහ කළ යුතු ය. ඉදින් ඔබට පූර්වකෘත කුශලානුභාවයෙන් ලැබෙතොත් ගිතෙල් ය, වෙඬරු ය, තෙල් ය, මී පැණි ය, උක් සකුරු ය යන මේවා අතිරේක ලාභ වශයෙන් පරිභෝග කළ යුතු ය.

## • දූන් අකරණීය සතර අසනු මැනවි.

**1. ''උපසම්පන්නේන භික්ඛුනා මේථුනෝ ධම්මෝ න පතිසේවිතබ්බෝ, අන්තමසෝ තිරච්ඡානගතායපි. යෝ භික්ඛු මේථුනං ධම්මං පතිසේවති, අස්සමණෝ හෝති අසක්‍යපුත්තියෝ. සෙය්‍යථාපි නාම පුරිසෝ සීසච්ඡින්නෝ අභබ්බෝ තේන සරීරබන්ධනේන ජීවිතුං, ඒවමේව භික්ඛු මේථුනං ධම්මං පතිසේවිත්වා අස්සමණෝ හෝති අසක්‍යපුත්තියෝ. තං තේ යාවජීවං අකරණීයං.''**

උපසම්පදා භික්ෂුව විසින් යටත් පිරිසෙයින් තිරිසන් සත්ත්වයකු සමග ද මෛථුන සේවනය නො කළ යුත්තේ ය. යම් භික්ෂුවක් මෛථුන සේවනය කෙරේ නම්, එයින් ඒ භික්ෂු තෙමේ අශ්‍රමණයෙක් වේ. අශාක්‍ය පුත්‍රයෙක් වේ. යම් සේ හිසසුන් පුරුෂයෙක් ඒ හිස කය හා සම්බන්ධ කොට නැවත ජීවත්වීමට අභව්‍ය වේ ද, එමෙන් ම මහණ තෙමේ මෛථුන සේවනය කොට අශ්‍රමණයෙක් වේ. අශාක්‍යපුත්‍රයෙක් වේ. එබැවින් තොප විසින් ඒ මෛථුන සේවනය දිවිහිමියෙන් නො කළ යුතු ය.

**2. ''උපසම්පන්නේන භික්ඛුනා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං න ආදාතබ්බං අන්තමසෝ තිණසලාකං උපාදාය. යෝ පන භික්ඛු පාදං වා පාදාරහං වා අතිරේකපාදං වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියති අස්සමණෝ හෝති අසක්‍යපුත්තියෝ. සෙය්‍යථාපි නාම පණ්ඩුපලාසෝ බන්ධනා පමුත්තෝ අභබ්බෝ හරිතත්ථාය, ඒවමේව භික්ඛු පාදං වා පාදාරහං වා අතිරේකපාදං වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියිත්වා අස්සමණෝ හෝති අසක්‍යපුත්තියෝ. තං තේ යාවජීවං අකරණීයං.''**

උපසම්පන්න භික්ෂුව විසින් අන්තිම වශයෙන් තණ පතෙහි පටන් හිමියන් විසින් නුදුන් දෙය සොර සිතින් නො ගත යුතු ය. යම් භික්ෂුවක් පාදයක් වූ ධනය හෝ පාදයක් අගනා වස්තුවක් හෝ පාදයකට අධික වස්තුව හෝ සොර සිතින් ගනී ද, හෙතෙමේ අශ්‍රමණයෙක් වේ. අශාක්‍යපුත්‍රයෙක් වේ. යම් සේ නටුවෙන් ගැලවුණු පඬුවන් පත නැවත හරිතවත් වීමට අභව්‍ය වේ ද, එමෙන් ම භික්ෂු තෙමේ පාදයක් වූ ධනය හෝ පාදයක් අගනා දෙයක් හෝ පාදයකට අධික ධනය හෝ සොර සිතින් ගැනීමෙන් අශ්‍රමණයෙක් වේ. අශාක්‍යපුත්‍රයෙක් වේ. එය තොප විසින් දිවි හිමියෙන් නො කළ යුතු ය.

**3. ''උපසම්පන්නේන භික්ඛුනා සංචිච්ච පාණෝ ජීවිතා න වොරොපෙතබ්බෝ අන්තමසෝ කුන්ථකිපිල්ලිකං උපාදාය. යෝ භික්ඛු සංචිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරෝපේති. අන්තමසෝ ගබ්භපාතනං උපාදාය අස්සමණෝ හෝති අසක්‍යපුත්තියෝ. සෙය්‍යථාපි නාම පුථුසිලා ද්විධා භින්නා අප්පටිසන්ධිකා හෝති, එවමේව භික්ඛු සංචිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරෝපෙත්වා අස්සමණෝ හෝති අසක්‍යපුත්තියෝ. තං තේ යාවජීවං අකරණීයං.''**

උපසම්පන්න භික්ෂුව විසින් යටත් පිරිසෙයින් සිතාමතා කුරාකුහුඹුවෙකුදු නො මැරිය යුතු ය. යම් භික්ෂුවක් ගැබ් හෙලීමෙන් වුව ද, මිනිසකු මරා නම්, ඒ භික්ෂුව අශ්‍රමණයෙක් වේ.

අශාක්‍යපුත්‍රයෙක් වේ. දෙකට පැලුණා වූ ගල යම් සේ නැවත සන්ධි කළ නොහේ ද, එමෙන් ම භික්ෂු තෙමේ සිතා මතා මිනිසකු මැරීමෙන් අශ්‍රමණයෙක් වේ. අශාක්‍ය පුත්‍රයෙක් වේ. එය තොප විසින් දිවි හිමියෙන් නො කළ යුතු ය.

**4. ''උපසම්පන්නේන භික්ඛුනා උත්තරිමනුස්සධම්මෝ න උල්ලපිතබ්බෝ අන්තමසෝ සුඤ්ඤාගාරේ අභිරමාමීති. යෝ භික්ඛු පාපිච්ඡෝ ඉච්ඡාපකතෝ අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති ඣානං වා විමොක්ඛං වා සමාධිං වා සමාපත්තිං වා මග්ගං වා ඵලං වා, අස්සමණෝ හෝති අසක්‍යපුත්තියෝ. සෙය්‍යථාපි නාම තාලෝ මත්ථකච්ඡින්නෝ අභබ්බෝ පුන විරූළ්හියා, එවමේව භික්ඛු පාපිච්ඡෝ ඉච්ඡාපකතෝ අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපිත්වා අස්සමණෝ හෝති අසක්‍යපුත්තියෝ. තං තේ යාවජීවං අකරණීයං.''**

උපසම්පන්න භික්ෂුව විසින් යටත් පිරිසෙයින් ''මම ශූන්‍යාගාරයෙහි සිත් අලවා වෙසෙමියි කියා ද උතුරු මිනිස් දම් ප්‍රකාශ නො කළ යුතු ය. යම් භික්ෂුවක් ලාමක වූ ආශා ඇත්තේ, ලාමක ආශාවෙන් මඩනා ලද්දේ, මට ධ්‍යානයක් හෝ විමෝක්ෂයක් හෝ සමාධියක් හෝ සමාපත්තියක් හෝ මාර්ගයක් හෝ ඵලයක් හෝ ඇත යයි තමා කෙරෙහි නැති උතුරු මිනිස් දම් ප්‍රකාශ කෙරේ ද, එයින් හෙතෙම අශ්‍රමණයෙක් වේ. අශාක්‍යපුත්‍රයෙක් වේ. යම් සේ මුදුන සුන් තල්ගස නැවත වැඩීමට අභව්‍ය වේ ද, එමෙන් මහණ තෙමේ ලාමක ආශා ඇතිව ලාමකාශාවෙන් මඩන ලදුව තමා කෙරෙහි නැත්තා වූ උතුරු මිනිස් දම් ප්‍රකාශ කොට අශ්‍රමණයෙක් වේ, අශාක්‍යපුත්‍රයෙක් වේ. එය තොප විසින් දිවි හිමියෙන් නො කළ යුතු ය.

## උපසම්පදා කර්මය නිමි.

# සීමා සමූහනන, සීමා සම්මුති කර්ම වාක්‍ය

## තිචීවර අවිප්පවාස සීමා සමූහනනය

සුණාතු මෙ භන්තේ! සඞ්ඝො. යො සො සඞ්ඝේන තිචීවරේන අවිප්පවාසො සම්මතො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තං තිචීවරේන අවිප්පවාසං සමූහනෙය්‍ය. ඒසා ඤත්ති.

සුණාතු මෙ භන්තේ! සඞ්ඝො. යො සො සඞ්ඝේන තිචීවරේන අවිප්පවාසො සම්මතො. සඞ්ඝො තං තිචීවරේන අවිප්පවාසං සමූහනති. යස්සායස්මතො ඛමති ඒතස්ස තිචීවරේන අවිප්පවාසස්ස සමුග්ඝාතො, සො තුණ්හස්ස යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

සමූහතො සො සඞ්ඝේන තිචීවරේන අවිප්පවාසො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී ඒවමේතං ධාරයාමි.

❀ ❀ ❀

## සමානසංවාස සීමා සමූහනනය

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ. යා සා සඞ්ඝේන සීමා සම්මතා සමානසංවාසා ඒකූපෝසථා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝෝ තං සීමං සමූහනෙය්‍ය සමානසංවාසං ඒකූපෝසථං. ඒසා ඤත්ති.

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ. යා සා සඞ්ඝේන සීමා සම්මතා සමානසංවාසා ඒකූපෝසථා, සඞ්ඝෝ තං සීමං සමූහනති සමානසංවාසං ඒකූපෝසථං. යස්සායස්මතෝ ඛමති ඒතිස්සා සීමාය සමානසංවාසාය ඒකූපෝසථාය සමුග්ඝාතෝ, සෝ තුණ්හස්ස. යස්ස නක්ඛමති, සෝ භාසෙය්‍ය.

සමූහතා සා සීමා සඞ්ඝේන සමානසංවාසා ඒකූපෝසථා, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.

# සීමා සමූහනනයෙන් පසුව නිමිති කීර්තනය

පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං ?
පාසාණෝ භන්තේ ! ඒසෝ පාසාණෝ නිමිත්තං.

පුරත්ථිමාය අනුදිසාය කිං නිමිත්තං ?
පාසාණෝ භන්තේ ! ඒසෝ පාසාණෝ නිමිත්තං.

දක්ඛිණාය දිසාය කිං නිමිත්තං ?
පාසාණෝ භන්තේ ! ඒසෝ පාසාණෝ නිමිත්තං.

දක්ඛිණාය අනුදිසාය කිං නිමිත්තං ?
පාසාණෝ භන්තේ ! ඒසෝ පාසාණෝ නිමිත්තං.

පච්ඡිමාය දිසාය කිං නිමිත්තං ?
පාසාණෝ භන්තේ ! ඒසෝ පාසාණෝ නිමිත්තං.

පච්ඡිමාය අනුදිසාය කිං නිමිත්තං ?
පාසාණෝ භන්තේ ! ඒසෝ පාසාණෝ නිමිත්තං.

උත්තරාය දිසාය කිං නිමිත්තං ?
පාසාණෝ භන්තේ ! ඒසෝ පාසාණෝ නිමිත්තං.

උත්තරාය අනුදිසාය කිං නිමිත්තං ?
පාසාණෝ භන්තේ ! ඒසෝ පාසාණෝ නිමිත්තං.

පුන පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං ?
පාසාණෝ භන්තේ ! ඒසෝ පාසාණෝ නිමිත්තං.

(නිමිති කීර්තනයෙන් පසු)

## සමානසංවාස සීමා සම්මුති කර්ම වාක්‍ය

සුණාතු මෙ භන්තේ! සඞ්ඝො. යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඒතෙහි නිමිත්තේහි සීමං සම්මන්නෙය්‍ය, සමානසංවාසං ඒකූපෝසථං. ඒසා ඤත්ති.

සුණාතු මෙ භන්තේ! සඞ්ඝො. යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, සඞ්ඝො ඒතෙහි නිමිත්තේහි සීමං සම්මන්නති සමානසංවාසං ඒකූපෝසථං. යස්සායස්මතො ඛමති ඒතෙහි නිමිත්තේහි සීමාය සම්මුති සමානසංවාසාය ඒකූපොසථාය, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතා සීමා සඞ්ඝේන ඒතෙහි නිමිත්තේහි සමානසංවාසා ඒකූපෝසථා, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.

# තිචීවර අවිප්පවාස සීමා සම්මුති කර්ම වාක්‍ය

සුණාතු මෙ භන්තේ! සඞ්ඝෝ. යා සා සඞ්ඝේන සීමා සම්මතා සමානසංවාසා ඒකූපෝසථා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තං සීමං තිචීවරේන අවිප්පවාසං සම්මන්නෙය්‍ය ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. ඒසා ඤත්ති.

සුණාතු මෙ භන්තේ! සඞ්ඝෝ. යා සා සඞ්ඝේන සීමා සම්මතා සමානසංවාසා ඒකූපෝසථා, සඞ්ඝො තං සීමං තිචීවරේන අවිප්පවාසං සම්මන්නති ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. යස්සායස්මතො ඛමති ඒතිස්සා සීමාය තිචීවරේන අවිප්පවාසාය සම්මුති ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතා සා සීමා සඞ්ඝේන තිචීවරේන අවිප්පවාසා ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.

සීමා සම්මතය නිමි.

# අපටිච්ඡන්න ආපත්ති

## අපටිච්ඡන්න මානත යාචනා වාක්‍ය

අහං භන්තේ! සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං අපටිච්ඡන්නායෝ.[1] සෝහං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචාමි.

අහං භන්තේ! -පෙ- සෝහං දුතියම්පි භන්තේ! සඞ්ඝං ....
අහං භන්තේ! -පෙ- සෝහං තතියම්පි භන්තේ! සඞ්ඝං ....

## අපටිච්ඡන්න මානත දාන කර්ම වාක්‍ය

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි අපටිච්ඡන්නායෝ. සෝ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං දදෙය්‍ය. ඒසා ඤත්ති.

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි අපටිච්ඡන්නායෝ. සෝ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචති. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං

1. අප්පටිච්ඡන්නායෝ (ම.ඡ.සං.)

ඡාරත්තං මානත්තං දේති. යස්සායස්මතෝ ඛමති (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තස්ස දානං, සෝ තුණ්හස්ස. යස්ස නක්ඛමති, සෝ භාසෙය්‍ය.

දුතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු -පෙ-
තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු -පෙ-

දින්නං සඞ්ඝේන (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.

❀ ❀ ❀

මානත ලබාගත් පසු සීමාවේ දී ම එය සමාදන් වී ආරෝචනය කළ යුතු ය. මානත සමාදාන වාක්‍ය :

මානත්තං සමාදියාමි. වත්තං සමාදියාමි.
යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## අපටිච්ඡන්න මානත ආරෝචන වාක්‍ය

අහං භන්තේ! සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං අපටිච්ඡන්නායෝ. සෝහං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සෝහං මානත්තං චරාමි. වේදියාමහං[1] භන්තේ! වේදියතීති[2] මං සඞ්ඝෝ ධාරේතු.

1. වේදයාමහං (ම.ඡ.සං.)
2. වේදයතීති (ම.ඡ.සං.)

මානත නික්ෂේප කරන වාක්‍ය :

**මානත්තං නික්ඛිපාමි. වත්තං නික්ඛිපාමි.**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## අපටිච්ඡන්න අබ්භාන යාචනා වාක්‍ය

**අහං භන්තේ! සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං අපටිච්ඡන්නායෝ. සෝහං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සෝහං භන්තේ! චිණ්ණමානත්තෝ සඞ්ඝං අබ්භානං යාචාමි.**

**අහං භන්තේ! -පෙ- සෝහං දුතියම්පි භන්තේ ! ....**
**අහං භන්තේ! -පෙ- සෝහං තතියම්පි භන්තේ ! ....**

## අපටිච්ඡන්න අබ්භාන කර්ම වාක්‍ය

**සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි අපටිච්ඡන්නායෝ. සෝ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සෝ චිණ්ණමානත්තෝ සඞ්ඝං අබ්භානං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝෝ (ඉත්ථන්නාමං) භික්ඛුං අබ්භෙය්‍ය. ඒසා ඤත්ති.**

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඉත්ථන්නාමො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි අපටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං අපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචති. සඞ්ඝො (ඉත්ථන්නාමං) භික්ඛුං අබ්භෙති. යස්සායස්මතො ඛමති (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අබ්භානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

අබ්භිතො සඞ්ඝේන (ඉත්ථන්නාමො) භික්ඛු. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී, ඒවමෙතං ධාරයාමි.

# ඒකාහපටිච්ඡන්න ඒකාපත්ති පරිවාසය

## පරිවාස යාචනා වාක්‍ය

අහං භන්තේ! ඒකං සඞ්ඝාදිසේසං ආපත්තිං ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නං. සෝහං භන්තේ! සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචාමි.

අහං භන්තේ! -පෙ- සෝහං දුතියම්පි භන්තේ! සඞ්ඝං ....
අහං භන්තේ! -පෙ- සෝහං තතියම්පි භන්තේ! සඞ්ඝං ....

## පරිවාස දාන කර්ම වාක්‍ය

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු ඒකං සඞ්ඝාදිසේසං ආපත්තිං ආපජ්ජි ඒකාහපටිච්ඡන්නං. සෝ සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං දදෙය්‍ය. ඒසා ඤත්ති.

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු ඒකං සඞ්ඝාදිසේසං ආපත්තිං ආපජ්ජි ඒකාහපටිච්ඡන්නං. සෝ සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචති. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං දේති. යස්සායස්මතෝ ඛමති

(ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසස්ස දානං, සෝ තුණ්හස්ස. යස්ස නක්ඛමති, සෝ භාසෙය්‍ය.

දුතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මේ -පෙ-
තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මේ -පෙ-

දින්නෝ සඞ්ඝේන (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසෝ. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.

❀ ❀ ❀

පරිවාස සමාදාන වාක්‍ය :

**පරිවාසං සමාදියාමි. වත්තං සමාදියාමි.**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## පරිවාස ආරෝචන වාක්‍ය

අහං භන්තේ! ඒකං සඞ්ඝාදිසේසං ආපත්තිං ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නං. සෝහං භන්තේ! සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං අදාසි. සෝහං පරිවසාමි. වේදියාමහං භන්තේ! වේදියතීති මං සඞ්ඝෝ ධාරේතු.

පරිවාස නික්ෂේප කරන වාක්‍ය :

**පරිවාසං නික්ඛිපාමි. වත්තං නික්ඛිපාමි.**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## මානත යාචනා වාක්‍ය

අහං භන්තේ! ඒකං සඞ්ඝාදිසේසං ආපත්තිං ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නං. සෝහං භන්තේ! සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං අදාසි. සෝහං භන්තේ! පරිවුත්ථපරිවාසෝ සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං යාචාමි.

අහං භන්තේ! -පෙ- සෝහං දුතියම්පි භන්තේ! ....
අහං භන්තේ! -පෙ- සෝහං තතියම්පි භන්තේ! ....

## මානත දාන කර්ම වාක්‍ය

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු ඒකං සඞ්ඝාදිසේසං ආපත්තිං ආපජ්ජි ඒකාහපටිච්ඡන්නං. සෝ සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං අදාසි. සෝ පරිවුත්ථපරිවාසෝ සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං දදෙය්‍ය. ඒසා ඤත්ති.

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු ඒකං සඞ්ඝාදිසේසං ආපත්තිං ආපජ්ජි

ඒකාහපටිච්ඡන්නං. සො සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං යාචති. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං දේති. යස්සායස්මතො ඛමති (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තසස්ස දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ-
තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ-

දින්නො සඞ්ඝේන (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.

❀ ❀ ❀

මානත සමාදාන වාක්‍ය :

**මානත්තං සමාදියාමි. වත්තං සමාදියාමි.**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## මානත ආරෝචන වාක්‍ය

අහං භන්තේ! ඒකං සඞ්ඝාදිසේසං ආපත්තිං ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නං. සෝහං භන්තේ! සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං අදාසි. සෝහං පරිවුත්ථපරිවාසෝ සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං අදාසි. සෝහං මානත්තං චරාමි. වේදියාමහං භන්තේ! වේදියතීති මං සඞ්ඝෝ ධාරේතු.

මානත නික්ෂේප කරන වාක්‍ය :

**මානත්තං නික්ඛිපාමි. වත්තං නික්ඛිපාමි.**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## අබ්භාන යාචනා වාක්‍ය

අහං භන්තේ! ඒකං සඞ්ඝාදිසේසං ආපත්තිං ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නං. සෝහං භන්තේ! සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං අදාසි. සෝහං පරිවුත්ථපරිවාසෝ සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං අදාසි. සෝහං භන්තේ ! චිණ්ණමානත්තෝ සඞ්ඝං අබ්භානං යාචාමි.

අහං භන්තේ! -පෙ- සෝහං දුතියම්පි භන්තේ! ....
අහං භන්තේ! -පෙ- සෝහං තතියම්පි භන්තේ! ....

# අබ්භාන කර්ම වාක්‍ය

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඉත්ථන්නාමො) භික්ඛු ඒකං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපජ්ජි ඒකාහපටිච්ඡන්නං. සො සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො, සඞ්ඝං අබ්භානං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ඉත්ථන්නාමං) භික්ඛුං අබ්භෙය්‍ය. ඒසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඉත්ථන්නාමො) භික්ඛු ඒකං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපජ්ජි ඒකාහපටිච්ඡන්නං. සො සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඒකාහපරිවාසං අදාසි. සො

පරිවුත්ථපරිවාසො සඞ්ඝං ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො ඒකිස්සා ආපත්තියා ඒකාහපටිච්ඡන්නාය ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො, සඞ්ඝං අබ්භානං යාචති. සඞ්ඝො (ඉත්ථන්නාමං) භික්ඛුං අබ්භේති. යස්සායස්මතො ඛමති (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අබ්භානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

අබ්භිතො සඞ්ඝේන (ඉත්ථන්නාමො) භික්ඛු. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී, ඒවමේතං ධාරයාමි.

---

සැ.යු:- පිරිවෙස්, මානත්, අබ්භාන කර්ම වාක්‍ය සැකසීමේ දී ආපත්ති එකක්, දෙකක්, තුනක් සිදු වී ඇත්නම් පිළිවෙළින් **'ඒකං ආපත්තිං, ද්වේ ආපත්තියෝ, තිස්සෝ ආපත්තියෝ'** ලෙස ද තුනට වඩා වැඩි ආපත්ති සඳහා **'සම්බහුලා ආපත්තියෝ'** ලෙස ද විනයධර භික්ෂුවකට පෙළ අටුවා අනුව කර්ම වාක්‍ය සැකසිය හැකි ය.

*සමන්තපාසාදිකා විනය අටුවා - සමුච්චයඛන්ධක වර්ණනා. (හේ.වි.මු.), පි. 872*

# අග්ඝසමෝධාන පරිවාසය

## අග්ඝසමෝධාන පරිවාස යාචනා වාක්‍ය

අහං භන්තේ! සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං සම්බහුලා ආපත්තියෝ ඒකාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ ද්වීහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ තීහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ චතූහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ පඤ්චාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ ඡාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ සත්තාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ අට්ඨාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ නවාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ දසාහපටිච්ඡන්නායෝ. සෝහං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං යා ආපත්තියෝ දසාහපටිච්ඡන්නායෝ, තාසං අග්ඝේන සමෝධානපරිවාසං යාචාමි.

අහං භන්තේ! -පෙ- සෝහං දුතියම්පි භන්තේ ....
අහං භන්තේ! -පෙ- සෝහං තතියම්පි භන්තේ!....

## අග්ඝසමෝධාන පරිවාස දාන කර්ම වාක්‍ය

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි සම්බහුලා ආපත්තියෝ ඒකාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ ද්වීහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ තීහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ චතූහපටිච්ඡන්නායෝ,

සම්බහුලා ආපත්තියෝ පඤ්චාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ ඡාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ සත්තාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ අට්ඨාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ නවාහපටිච්ඡන්නායෝ, සම්බහුලා ආපත්තියෝ දසාහපටිච්ඡන්නායෝ. සෝ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං යා ආපත්තියෝ දසාහපටිච්ඡන්නායෝ තාසං අග්ඝේන සමෝධානපරිවාසං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං යා ආපත්තියෝ දසාහපටිච්ඡන්නායෝ තාසං අග්ඝේන සමෝධානපරිවාසං දදෙය්‍ය. ඒසා ඤත්ති.

අහං භන්තේ! සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්තිපරියන්තං නස්සරාමි. ආපත්තිපරියන්තේ වේමතිකෝ. රත්තිපරියන්තේ වේමතිකෝ. සෝහං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සෝහං පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සෝහං මානත්තං චරන්තෝ අන්තරා සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නායෝ. සෝහං භන්තේ! සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචිං. තං මං සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සෝහං භන්තේ සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං යාචාමි.

අහං භන්තේ! -පෙ- සෝහං දුතියම්පි භන්තේ! ....
අහං භන්තේ! -පෙ- සෝහං තතියම්පි භන්තේ! ....

## මානත්තචාරික මූලාය පටිකස්සන සමෝධාන පරිවාස දාන කර්ම වාක්‍ය

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තේ වේමතිකෝ. රත්තිපරියන්තේ වේමතිකෝ. සෝ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සෝ පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සෝ මානත්තං චරන්තෝ අන්තරා සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි ඒකාහපටිච්ඡන්නායෝ. සෝ සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමං) භික්ඛුං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං

මූලායපටිකස්සි. සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං දදෙය්‍ය. ඒසා ඤත්ති.

සුණාතු මෙ භන්තේ! සඞ්ඝො, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තෙ වේමතිකො. රත්තිපරියන්තෙ වේමතිකෝ. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සො මානත්තං චරන්තෝ අන්තරා සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියො ආපජ්ජි ඒකාහපටිච්ඡන්නායො. සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං

ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමං) භික්ඛුං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමොධානපරිවාසං යාචති. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමොධානපරිවාසං දේති. යස්සායස්මතො ඛමති (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමොධානපරිවාසස්ස දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මේ -පෙ-

තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මේ -පෙ-

දින්නො සඞ්ඝේන (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමොධානපරිවාසො, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.

❀ ❀ ❀

පිරිවෙස සමාදාන වාක්‍ය :

**පරිවාසං සමාදියාමි. වත්තං සමාදියාමි.**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## මානත්තචාරික මූලායපටිකස්සන සමෝධාන පරිවාස ආරෝචන වාක්‍ය

**අහං භන්තේ! සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්තිපරියන්තං නස්සරාමි. ආපත්තිපරියන්තේ වේමතිකෝ. රත්තිපරියන්තේ වේමතිකෝ. සෝහං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සෝහං පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සෝහං මානත්තං චරන්තෝ අන්තරා සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නායෝ. සෝහං භන්තේ! සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචිං. තං මං සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සෝහං භන්තේ! සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං අදාසි. සෝහං පරිවසාමි, වේදියාමහං භන්තේ! වේදියතීති මං සඞ්ඝෝ ධාරේතු.**

## මානත්තචාරික මූලායපටිකස්සන මානත යාචනා වාක්‍ය

අහං භන්තේ! සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්තිපරියන්තං නස්සරාමි. ආපත්තිපරියන්තේ වේමතිකෝ. රත්තිපරියන්තේ වේමතිකෝ. සෝහං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සෝහං පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සෝහං මානත්තං චරන්තෝ අන්තරා සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නායෝ. සෝහං භන්තේ! සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචිං. තං මං සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සෝහං භන්තේ! සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං අදාසි. සෝහං භන්තේ! පරිවුත්ථපරිවාසෝ. සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචාමි.

සෝහං දුතියම්පි භන්තේ! පරිවුත්ථපරිවාසෝ ....
සෝහං තතියම්පි භන්තේ! පරිවුත්ථපරිවාසෝ ....

## මානත්තචාරික මූලායපටිකස්සන මානත දාන කර්ම වාක්‍ය

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තේ වේමතිකෝ. රත්තිපරියන්තේ වේමතිකෝ. සෝ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සෝ පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සෝ මානත්තං චරන්තෝ අන්තරා සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි ඒකාහපටිච්ඡන්නායෝ. සෝ සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමං) භික්ඛුං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සෝ සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ අන්තරා සම්බහුලානං

ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං අදාසි. සෝ පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං දදෙය්‍ය. ඒසා ඤත්ති.

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තේ වේමතිකෝ. රත්තිපරියන්තේ වේමතිකෝ. සෝ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සෝ පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සෝ මානත්තං චරන්තෝ අන්තරා සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි ඒකාහපටිච්ඡන්නායෝ. සෝ සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචි. සඞ්ඝෝ

(ඉත්ථන්නාමං) භික්ඛුං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො, සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචති. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං දේති. යස්සායස්මතො ඛමති (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තස්ස දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මේ -පෙ-
තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මේ -පෙ-

දින්නං සඞ්ඝේන (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.

❀ ❀ ❀

මානත සමාදන් වීමේ වාක්‍ය ඃ

**මානත්තං සමාදියාමි. වත්තං සමාදියාමි.**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## මානත්තචාරික මූලායපටිකස්සන මානත ආරෝචන වාක්‍ය

අහං භන්තේ! සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්තිපරියන්තං නස්සරාමි. ආපත්තිපරියන්තේ වේමතිකෝ. රත්තිපරියන්තේ වේමතිකෝ. සෝහං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සෝහං පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සෝහං මානත්තං චරන්තෝ අන්තරා සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නායෝ. සෝහං භන්තේ! සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචිං. තං මං සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සෝහං භන්තේ! සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං අදාසි. සෝහං පරිවුත්ථපරිවාසෝ. සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං

මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සෝහං මානත්තං චරාමි. වේදියාමහං භන්තේ! වේදියතීති මං සඞ්ඝෝ ධාරේතු.

## මානත්තචාරික මූලායපටිකස්සන අබ්භාන යාචනා වාක්‍ය

අහං භන්තේ! සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්තිපරියන්තං නස්සරාමි. ආපත්තිපරියන්තේ වේමතිකෝ. රත්තිපරියන්තේ වේමතිකෝ. සෝහං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සෝහං පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සෝහං භන්තේ! මානත්තං චරන්තෝ අන්තරා සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නායෝ. සෝහං භන්තේ! සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචිං. තං මං සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සෝහං භන්තේ! සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං යාචිං. තස්ස මේ සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං අදාසි. සෝහං පරිවුත්ථපරිවාසෝ. සඞ්ඝං අන්තරා සම්බහුලානං

ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මේ සඞ්ඝෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සෝහං භන්තේ! චිණ්ණමානත්තෝ සඞ්ඝං අබ්භානං යාචාමි.

සෝහං දුතියම්පි භන්තේ! චිණ්ණමානත්තෝ, සඞ්ඝං ....
සෝහං තතියම්පි භන්තේ! චිණ්ණමානත්තෝ, සඞ්ඝං ....

## මානත්තචාරික මූලායපටිකස්සන අබ්භාන කර්ම වාක්‍ය

සුණාතු මේ භන්තේ! සඞ්ඝෝ, අයං (ඉත්ථන්නාමෝ) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තේ වේමතිකෝ. රත්තිපරියන්තේ වේමතිකෝ. සෝ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සෝ පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ තාසං සම්බහුලානං ආපත්තීනං

ඡාරත්තං මානත්තං අදාසි. සො මානත්තං චරන්තො අන්තරා සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි ඒකාහපටිච්ඡන්නායො. සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමං) භික්ඛුං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමොධානපරිවාසං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමොධානපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො, සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ඉත්ථන්නාමං) භික්ඛුං අබ්භෙය්‍ය. ඒසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඉත්ථන්නාමො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො, සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සො මානත්තං චරන්තො අන්තරා සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි ඒකාහපටිච්ඡන්නායො. සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සනං යාචි. සඞ්ඝො (ඉත්ථන්නාමං) භික්ඛුං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං මූලායපටිකස්සි. සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු

ආපත්තීසු සමෝධානපරිවාසං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං පුරිමාසු ආපත්තීසු සමෝධානපරිවාසං අදාසි. සෝ පරිවුත්ථපරිවාසෝ, සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝෝ (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ අන්තරා සම්බහුලානං ආපත්තීනං ඒකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සෝ චිණ්ණමානත්තෝ සඞ්ඝං අබ්භානං යාචති. සඞ්ඝෝ (ඉත්ථන්නාමං) භික්ඛුං අබ්භේති. යස්සායස්මතෝ ඛමති (ඉත්ථන්නාමස්ස) භික්ඛුනෝ අබ්භානං සෝ තුණ්හස්ස. යස්ස නක්ඛමති, සෝ භාසෙය්‍ය.

දුතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මේ -පෙ-

තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මේ -පෙ-

අබ්භිතෝ සඞ්ඝේන (ඉත්ථන්නාමෝ) භික්ඛු. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. ඒවමේතං ධාරයාමි.

සැ.යු:- වත් මානත් පිළිබඳව වැඩි විස්තර දැනගැනීම සඳහා පූජ්‍යපාද මකුලෑවේ සුදස්සන ස්වාමීන් වහන්සේගේ පිරිවෙස් මානත් පිරිමේ දී දතයුතු කරුණු, චතුර්විධ කර්ම යන පොත බලනු මැනවි.

# උපග්‍රන්ථය - I

## • වැඩිහිටි භික්ෂූන් වන්දනා කිරීම

නවක භික්ෂුව :-

**ඕකාස වන්දාමි භන්තේ! මයා කතං පුඤ්ඤං සාමිනා අනුමෝදිතබ්බං**

වැඩිමහලු භික්ෂුව :-

**සාධු! සාධු! අනුමෝදාමි**

නවක භික්ෂුව :-

**සාමිනා කතං පුඤ්ඤං මය්හං දාතබ්බං**

වැඩිමහලු භික්ෂුව :-

**සාධු! සාධු! අනුමෝදිතබ්බං (අනුමෝදාහි/ අනුමෝදථ)**

නවක භික්ෂුව :-

**සාධු! සාධු! අනුමෝදාමි**
**ඕකාස ද්වාරත්තයේන කතං සබ්බං අච්චයං ඛමථ මේ භන්තේ**

වැඩිමහලු භික්ෂුව :-

**ඛමාමි ඛමිතබ්බං!**

නවක භික්ෂුව :-

**සාධු! ඕකාස ඛමාමි භන්තේ!**

## ආපත්ති දේසනා කිරීම

## • නවක භික්ෂුව ඇවැත් දෙසීම

නවක භික්ෂුව :-

**ඕකාස අහං භන්තේ! සබ්බාපත්තියෝ ආරෝචේමි**
**දුතියම්පි ....., තතියම්පි .....**

වැඩිමහලු භික්ෂුව :-

**සාධු ආවුසෝ! සාධු**

නවක භික්ෂුව :-

**අහං භන්තේ! සම්බහුලා නානාවත්ථුකා ආපත්තියෝ ආපජ්ජිං තා තුම්හමූලේ පටිදේසේමි**

වැඩිමහලු භික්ෂුව :-

**පස්සසි ආවුසෝ! තා ආපත්තියෝ**

නවක භික්ෂුව :-

**ආම භන්තේ! පස්සාමි**

වැඩිමහලු භික්ෂුව :-

**ආයතිං ආවුසෝ! සංවරෙය්‍යාසි**

නවක භික්ෂුව :-

**සාධු සුට්ඨු අහං භන්තේ! ආයතිං සංවරිස්සාමි**

**දුතියම්පි ....., තතියම්පි ......**

වැඩිමහලු භික්ෂුව :-

**සාධු ආවුසෝ! සාධු**

නවක භික්ෂුව :-

**ඕකාස අහං භන්තේ! සබ්බා තා ආපත්තියෝ ආවිකරෝමි**

**දුතියම්පි ....., තතියම්පි ......**

වැඩිමහලු භික්ෂුව :-

**සාධු ආවුසෝ! සාධු**

## ● වැඩිමහලු භික්ෂුව ඇවැත් දෙසීම

වැඩිමහලු භික්ෂුව :-

**අහං ආවුසෝ! සබ්බාපත්තියෝ ආරෝචේමි**

**දුතියම්පි ....., තතියම්පි .....**

නවක භික්ෂුව :-

**සාධු භන්තේ! සාධු**

වැඩිමහලු භික්ෂුව :-

**අහං ආවුසෝ! සම්බහුලා නානාවත්ථුකා ආපත්තියෝ ආපජ්ජිං තා තුය්හමූලේ පටිදේසේමි**

නවක භික්ෂුව :-

**පස්සථ භන්තේ! තා ආපත්තියෝ**

වැඩිමහලු භික්ෂුව :-

**ආම ආවුසෝ! පස්සාමි**

නවක භික්ෂුව :-

**ආයතිං භන්තේ! සංවරෙයාාථ**

වැඩිමහලු භික්ෂුව :-

**සාධු සුට්ඨු අහං ආවුසෝ! ආයතිං සංවරිස්සාමි**

**දුතියම්පි ....., තතියම්පි ......**

නවක භික්ෂුව :-

**සාධු භන්තේ! සාධු**

වැඩිමහලු භික්ෂුව :-

**අහං ආවුසෝ! සබ්බා තා ආපත්තියෝ ආවිකරෝමි**

**දුතියම්පි ....., තතියම්පි ......**

නවක භික්ෂුව :-

**සාධු ආවුසෝ! සාධු**

## ● දේසනා දුක්කටආපත්ති දේසනය

නවක භික්ෂුව :-

**ඕකාස අහං භන්තේ! දේසනා දුක්කටාපත්තිං ආපජ්ජිං තං තුම්හමූලේ පටිදේසේමි**

වැඩිමහලු භික්ෂුව :-

**පස්සසි ආවුසෝ! තං ආපත්තිං**

නවක භික්ෂුව :-

**ආම භන්තේ! පස්සාමි**

වැඩිමහලු භික්ෂුව :-

**ආයතිං ආවුසෝ! සංවරෙයාාසි**

නවක භික්ෂුව :-

**සාධු සුට්ඨු අහං භන්තේ! ආයතිං සංවරිස්සාමි**

**දුතියම්පි ....., තතියම්පි ......**

වැඩිමහලු භික්ෂුව :-

**සාධු ආවුසෝ! සාධු**

❀ ❀ ❀

# උපාධ්‍යායග්‍රහණය කිරීම

සාමණේරයන් වහන්සේ සිවුරු ඒකාංස කොට පොරවා, උපාධ්‍යායන් වහන්සේ වෙත එළඹ, උක්කුටිකයෙන් හිඳ දොහොත් මුදුන් දී වැඳගෙන මෙසේ කිය යුතු ය.

සාමණේර :-

**උපජ්ඣායො මෙ භන්තෙ! හොහි**

උපාධ්‍යාය :-

**පාසාදිකේන සම්පාදේහි හෝ සාහු/ ලහු/ ඕපායිකං/පතිරූපං**

යි කියා එය පිළිගත යුතු ය.

සාමණේර :-

**සාධු! ඕකාස සම්පටිච්ඡාමි**

යි මෙසේ තෙවරක් කියා උපාධ්‍යායග්‍රහණය කළ යුතු ය.

❀ ❀ ❀

# ආචර්යග්‍රහණය කිරීම

නිස සමාදන් වන භික්ෂුව සිවුර ඒකාංස කොට පොරවා, ආචාර්යවරයා වෙත එළඹ, උක්කුටිකයෙන් හිඳ දොහොත් මුදුන් දී වැඳගෙන මෙසේ කිය යුතු ය.

අන්තේවාසික :-

**ආචරියෝ මෙ භන්තෙ! හොහි, ආයස්මතො නිස්සාය වච්ඡාමි.**

ආචාරිය :-

**පාසාදිකේන සම්පාදේහි හෝ සාහු/ ලහු/ ඕපායිකං/පතිරූපං**

යි කියා එය පිළිගත යුතු ය.

අන්තේවාසික :-

**සාධු! ඕකාස සම්පටිච්ඡාමි**

යි මෙසේ තෙවරක් කියා ආචරියග්‍රහණය කළ යුතු ය.

❀ ❀ ❀

# විනය කර්ම සඳහා ඡන්දය දීම

යම් භික්ෂුවක් එදින පැවැත්වෙන උපෝසථයට හෝ විනය කර්මයකට සහභාගි විය නොහැකි සේ ගිලන් වේ නම්, එහි දී ඡන්දය ලබා දිය යුතු ය. ඡන්දය ප්‍රකාශ කරන භික්ෂුව උපෝසථය හෝ විනය කර්මය සඳහා සහභාගී වන භික්ෂුවක් ඉදිරියේ උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කිව යුතු වන්නේ ය.

## ● උපෝසථය සඳහා ඡන්දපාරිශුද්ධිය දීම

ඡන්දපාරිශුද්ධිය දෙන භික්ෂුව වැඩිහිටි නම්;

**''ඡන්දපාරිසුද්ධිං දම්මි, ඡන්දපාරිසුද්ධිං මෙ හර, ඡන්දපාරිසුද්ධිං මෙ ආරෝචෙහි''**
යි ප්‍රකාශ කළ යුතු ය.

ඡන්දපාරිශුද්ධිය දෙන භික්ෂුව නවක නම්;

**''ඡන්දපාරිසුද්ධිං දම්මි, ඡන්දපාරිසුද්ධිං මෙ හර, ඡන්දපාරිසුද්ධිං මෙ ආරෝචෙථ''**
යි ප්‍රකාශ කළ යුතු ය.

## ● අනෙකුත් විනය කර්ම සඳහා ඡන්දය දීම

ඡන්දය දෙන භික්ෂුව වැඩිහිටි නම්;

**''ඡන්දං දම්මි, ඡන්දං මෙ හර, ඡන්දං මෙ ආරෝචෙහි''**
යි ප්‍රකාශ කළ යුතු ය.

ඡන්දය දෙන භික්ෂුව නවක නම්;

**''ඡන්දං දම්මි, ඡන්දං මෙ හර, ඡන්දං මෙ ආරෝචෙථ''**
යි ප්‍රකාශ කළ යුතු ය.

## ● පවාරණය දීම

පවාරණය දෙන භික්ෂුව වැඩිහිටි නම්;

**''පවාරණං දම්මි, පවාරණං මෙ හර, පවාරණං මෙ ආරෝචෙහි, මමත්ථාය පවාරෙහි''**

යි ප්‍රකාශ කළ යුතු ය.

පවාරණය දෙන භික්ෂුව නවක නම්;

**''පවාරණං දම්මි, පවාරණං මෙ හර, පවාරණං මෙ ආරෝචෙථ, මමත්ථාය පවාරෙථ''**

යි ප්‍රකාශ කළ යුතු ය.

**● පවාරණය රැගෙන එන භික්ෂුව සඟ මැදට විත් මෙසේ ඒ නොපැමිණි භික්ෂුව වෙනුවෙන් පැවරිය යුතු වේ.**[1]

පවාරණය දෙන භික්ෂුව වැඩිහිටි නම්;

**''ආයස්මා භන්තේ! (තිස්සෝ)[2] සඞ්ඝං පවාරේති දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදතු තං භන්තේ සඞ්ඝෝ අනුකම්පං උපාදාය. පස්සන්තෝ පටිකරිස්සති.'' දුතියම්පි භන්තේ! ....... තතියම්පි භන්තේ! .......**

පවාරණය දෙන භික්ෂුව නවක නම්;

**''(තිස්සෝ)[3] භන්තේ! භික්ඛු සඞ්ඝං පවාරේති දිට්ඨේන වා සුතේන වා පරිසඞ්කාය වා වදතු තං භන්තේ සඞ්ඝෝ අනුකම්පං උපාදාය. පස්සන්තෝ පටිකරිස්සති.'' දුතියම්පි භන්තේ! ....... තතියම්පි භන්තේ! .......**

සැ.යු.:- පවාරණය දෙන භික්ෂුව සංඝයාගේ අනෙකුත් විනය කර්ම සඳහා වෙනම ම පෙර පරිදිම ඡන්දය දිය යුතු වේ.[4]

❀ ❀ ❀

1. සමන්තපාසාදිකා විනය අටුවා. (හේ.වි.මු.), පි. 801
2. ඒ වැඩිහිටි භික්ෂුවගේ නම
3. ඒ නවක භික්ෂුවගේ නම
4. මහාවග්ග පාළි I - පවාරණක්ඛන්ධකය. (බු.ජ.මු.), පි. 406

# කප්බිංදු තැබීම

කප්බිංදු නො තබන ලද අඳින පොරවන සියලු සිවුරු පරිහරණයට පෙර දුර්වර්ණ[1] කළ යුතු ය. සිවුරෙහි කොනක් රැගෙන කප්බිංදු තැබිය යුතු ය.

**''කප්පබින්දුං කරෝමි.''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

❀ ❀ ❀

# සිවුරු පරිහරණය පිළිබඳ විස්තර

## • සිවුරු අධිෂ්ඨානය

දෙපට සිවුර :-

**''ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

තනිපට සිවුර :-

**''ඉමං උත්තරාසඞ්ගං අධිට්ඨාමි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

අඳන සිවුර :-

**''ඉමං අන්තරවාසකං අධිට්ඨාමි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

වැසි සළුව :-

**''ඉමං වස්සිකසාටිකං අධිට්ඨාමි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

❀ ❀ ❀

1. දුර්වර්ණ කිරීම සඳහා නිල් පාට, (නිල් පැහැය කංස නීල හෝ පලාස නීල යනුවෙන් දෙවැදෑරුම් වේ.) මඩ පාට, කළු පාට යොදා ගත යුතු ය.

## • සිවුරු පච්චුද්ධරණය

දෙපට සිවුර :-

**''ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි''**
යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

තනිපට සිවුර :-

**''ඉමං උත්තරාසඞ්ගං පච්චුද්ධරාමි''**
යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

අඳන සිවුර :-

**''ඉමං අන්තරවාසකං පච්චුද්ධරාමි''**
යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

වැසි සළුව :-

**''ඉමං වස්සිකසාටිකං පච්චුද්ධරාමි''**
යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

සැ.යු:- සිවුරු අත්පසින් බැහැර ව ඇත්නම් එහි දි ''**ඉමං**'' වෙනුවට ''**ඒතං**''යැයි යෙදිය යුතු ය.

❁ ❁ ❁

## • පරික්ඛාරචෝළ වශයෙන් සිවුරු අධිෂ්ඨානය

එක සිවුරක් නම් :-

**''ඉමං චීවරං පරික්ඛාරචෝළං අධිට්ඨාමි''**
යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

සිවුරු එකකට වැඩි නම් :-

**''ඉමානි චීවරානි පරික්ඛාරචෝළානි අධිට්ඨාමි''**
යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

❁ ❁ ❁

## ● සිවුරු විකප්පනය කිරීම

අතිරේක සිවුරු ළඟ තබා ගැනීමට අවශ්‍ය නම් ඒවා විකප්පනය කර තබා ගත යුතු ය. එ බැවින් උපසපන් භික්ෂුවක් වෙතට ගොස් උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ;

එක සිවුරක් නම් :-

**''ඉමං චීවරං තුය්හං විකප්පේමි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

සිවුරු එකකට වැඩි නම් :-

**''ඉමානි චීවරානි තුය්හං විකප්පේමි''**

යි තෙවරක් කියා සිවුර හෝ සිවුරු ඒ භික්ෂුවට දිය යුතු ය.

## ● පච්චුද්ධාරය

විකප්පනය කරන ලද සිවුරු ළඟ තබා ගත හැකි ය. නිසඟි නො වෙයි. ඒවා පරිහරණය කිරීමට නම් පච්චුද්ධාරය කළ යුතු ය. විකප්පනය ලැබූ භික්ෂුව එම සිවුරු අතෙහි තබාගෙන;

එක සිවුරක් නම් :-

**''ඉමං චීවරං මය්හං සන්තකං පරිභුඤ්ජේහි වා විස්සජ්ජේහි වා යථා පච්චයං වා කරෝහි / කරෝථ.''**

යි තෙවරක් කියා සිවුරු හිමියාට නැවත භාරදිය යුතු ය.

සිවුරු එකකට වැඩි නම් :-

**''ඉමානි චීවරානි මය්හං සන්තකානි පරිභුඤ්ජේහි වා විස්සජ්ජේහි වා යථා පච්චයං වා කරෝහි / කරෝථ''**

යි තෙවරක් කියා සිවුරු හිමියාට නැවත භාරදිය යුතු ය.

❀ ❀ ❀

# සිවුරු නිස්සජ්ජනය කිරීම

## ● දසහාතික්කන්ත චීවරය

උපසපන් භික්ෂුවක් කඨිනානිසංස ඇති කාලය හැර අධිෂ්ඨානය හෝ විකප්පනය නො කොට තමන්ට ලැබූ සිවුරක් ළඟ තබා ගත හැක්කේ දස දිනක් පමණි. එය ඉක්ම වීමෙන් නිසඟි වේ. එ සේ වූ විට නිස්සජ්ජනය කළ යුතු ය.

නිසඟි වූ භික්ෂුව විසින් උපසපන් භික්ෂුවක් වෙත ගොස් සිවුරු ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ;

එක සිවුරුක් නම් :-

**''ඉදං මේ ආවුසෝ /භන්තේ චීවරං දසහාතික්කන්තං නිස්සග්ගියං, ඉමාහං ආයස්මතෝ නිස්සජාමි[1]''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

සිවුරු එකකට වැඩි නම් :-

**''ඉමානි මේ ආවුසෝ /භන්තේ චීවරානි දසහාතික්කන්තානි නිස්සග්ගියානි, ඉමානාහං ආයස්මතෝ නිස්සජාමි''**

යි තෙවරක් කියා සිවුර හෝ සිවුරු ඒ භික්ෂුවට දී ආපත්ති දේශනා කළ යුතු ය.

පසු ව ඒ භික්ෂුව ඇවත පිළිගෙන සිවුරු හිමියාට එය භාර දිය යුතු ය.

එක සිවුරක් නම් :-

**''ඉමං චීවරං ආයස්මතෝ දම්මි''**

සිවුරු එකකට වැඩි නම් :-

**''ඉමානි චීවරානි ආයස්මතෝ දම්මි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

❀ ❀ ❀

1. නිස්සජ්ජාමි (ම.ඡ.සං.)

## ● රත්ති විප්පවුත්ථ චීවරය නිස්සජ්ජනය කිරීම

තුන් සිවුර අධිෂ්ඨානය කොට වාසය කරන උපසපන් භික්ෂුවක් කඨිනානිසංස ඇති කාලය හැර අරුණ නැගෙන විට සිවුර අත් පසින් බැහැර වූයේ නම් එම සිවුර නිසඟි වේ. එසේ වූ විට නිස්සජ්ජනය කළ යුතු ය.

නිසඟි වූ භික්ෂුව විසින් උපසපන් භික්ෂුවක් වෙත ගොස් සිවුරු ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ;

**''ඉදං මේ ආවුසෝ /භන්තේ චීවරං රත්තිවිප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං, ඉමාහං ආයස්මතෝ නිස්සජාමි''**

යි තෙවරක් කියා සිවුර ඒ භික්ෂුවට දී ආපත්ති දේශනා කළ යුතු ය.

පසු ව ඒ භික්ෂුව ඇවත පිළිගෙන සිවුරු හිමියාට එය භාර දිය යුතු ය.

**'' ඉමං චීවරං ආයස්මතෝ දම්මි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

❀ ❀ ❀

# පාත්‍ර පරිහරණය පිළිබඳ විස්තර

## ● පාත්‍ර අධිෂ්ඨාන කිරීම

**''ඉමං පත්තං අධිට්ඨාමි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## ● පාත්‍ර පච්චුද්ධරණය කිරීම

**''ඉමං පත්තං පච්චුද්ධරාමි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

## • පාත්‍ර විකප්පනය කිරීම

තමන් අධිෂ්ඨාන කර ඇති පාත්‍රයට අමතර ව අතිරේක පාත්‍රයක් ලැබුණු විට ළඟ තබා ගැනීමට අවශ්‍ය නම් එය විකප්පනය කර තබා ගත යුතු ය. නැතිනම් දස දිනක් ඇවෑමෙන් නිසඟි වේ. එ බැවින් උපසපන් භික්ෂුවක් වෙතට ගොස් උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ;

**''ඉමං පත්තං තුය්හං විකප්පේමි''**

යි තෙවරක් කියා පාත්‍රය ඒ භික්ෂුවට දිය යුතු ය.

විකප්පනය ලැබූ භික්ෂුව එම පාත්‍රය අතෙහි තබාගෙන :-

**''ඉමං පත්තං මය්හං සන්තකං පරිභුඤ්ජේහි වා විස්සජ්ජේහි වා යථාපච්චයං වා කරෝහි /කරෝථ''**

යි තෙවරක් කියා පාත්‍රය හිමියාට නැවත භාරදිය යුතු ය.

## • පාත්‍ර නිස්සජ්ජනය කිරීම

තමන් අධිෂ්ඨාන කර ඇති පාත්‍රයට අමතර ව අතිරේක පාත්‍රයක් ලැබුණු විට එය දස දිනක් ළඟ තබා ගත හැකිය. දස දින ඉක්මවීමෙන් නිසඟි වේ. එසේ වූ විට නිස්සජ්ජනය කළ යුතු ය.

නිසඟි වූ භික්ෂුව විසින් උපසපන් භික්ෂුවක් වෙත ගොස් සිවුරු ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ;

**'' අයං මේ ආවුසෝ /භන්තේ පත්තෝ දසහාතික්කන්තෝ නිස්සග්ගියෝ, ඉමාහං ආයස්මතෝ නිස්සජාමි''**

යි තෙවරක් කියා පාත්‍රය ඒ භික්ෂුවට දී ආපත්ති දේශනා කළ යුතු ය.

පසු ව ඒ භික්ෂුව ඇවත පිළිගෙන පාත්‍රය හිමියාට එය භාර දිය යුතු ය.

**'' ඉමං පත්තං ආයස්මතෝ දම්මි''**

යි තෙවරක් ප්‍රකාශ කළ යුතු ය.

❀ ❀ ❀

# සත්තාහකාලික භේසජ්ජ නිස්සජ්ජනය

ගිතෙල් ආදී පංච භේසජ්ජයක් භික්ෂුවක් පිළිගෙන ළඟ තබාගෙන, සත්දින ඉක්ම වීමෙන් නිසඟි පචිති වේ. එම බෙහෙත එක් භික්ෂුවක් වෙතට ගෙන ගොස් මෙසේ නිස්සජ්ජනය කොට, පසු ව ඇවැත් දෙසිය යුතු ය.

**"ඉදං මේ ආවුසෝ /භන්තේ භේසජ්ජං සත්තාහාතික්කන්තං නිස්සග්ගියං, ඉමාහං ආයස්මතෝ නිස්සජාමි"**

නිස්සජ්ජනය කළ බෙහෙත අපේක්ෂා සහිත ව අනුපසම්පන්නයෙකුට දුන්නේ නම්, එම භික්ෂුවට එය තුවාල ආදියෙහි ආලේප කිරීමට ද, වැළඳීමට ද නො වටී. පහන් දැල්වීමට හෝ කළු වර්ණ කිරීම පිණිස හෝ සුදුසු ය. අන් භික්ෂුවකට කායික පරිභෝගයට සුදුසු ය. **ඉදින් නිස්සජ්ජනය කළ බෙහෙත අපේක්ෂා රහිත ව ම අනුපසම්පන්නයෙකුට දුන් පසු, එම අනුපසම්පන්න තෙමේ විසින් ම නැවත භික්ෂුවට ලබාදේ නම් වැළඳීමට ද සුදුසු ය.**

❀ ❀ ❀

---

සැ.යු.:- භේසජ්ජ නිස්සජ්ජනය පිළිබඳව වැඩි විස්තර සඳහා පහත සඳහන් ග්‍රන්ථ පරිශීලනය කරනු මැනවි.

- ★ පාරාජිකා පාළි - භික්ඛු විභංගය. (හේ.වි.මු.), පි. 280
- ★ සමන්තපාසාදිකා විනය අටුවා. (හේ.වි.මු.), පි. 522
- ★ කඞ්කාවිතරණී මාතිකා අටුවා., පි. 76.
- ★ කඞ්කාවිතරණී අභිනව ටීකා (භේසජ්ජ ශික්ෂාව)., පි. 175
- ★ උපසම්පදා ශීලය (රේරුකානේ චන්දවිමල මහනාහිමි)., පි. 166

# ආපුච්ඡා කරනය

සාමණේරයන් වහන්සේලා සහ නිස සමාදන් ව සිටින උපසපන් භික්ෂූන් වහන්සේලා මොනයම් හෝ දෙයක් කිරීමට කලින් උපාධ්‍යායන් හෝ ආචාර්යන් වහන්සේගෙන් අවසර ගත යුතු ය.

- හිස කෙස් රැවුල් බෑමට :-

  **''ඕකාස අහං භන්තේ! කේසමස්සු ඕහරණං ආපුච්ඡාමි''**
  **දුතියම්පි ....., තතියම්පි .....**

- නියපොතු කැපීමට :-

  **''ඕකාස අහං භන්තේ! නඛච්ඡේදනං ආපුච්ඡාමි''**
  **දුතියම්පි ....., තතියම්පි .....**

- සිවුරු සේදීමට :-

  **''ඕකාස අහං භන්තේ! චීවරධෝවනං ආපුච්ඡාමි''**
  **දුතියම්පි ....., තතියම්පි .....**

- ඉහත කරුණු තුනම සඳහා මෙසේ ද කිව හැකි ය;

  **''ඕකාස අහං භන්තේ! කේසමස්සු ඕහරණඤ්ච නඛච්ඡේදනඤ්ච චීවරධෝවනඤ්ච ආපුච්ඡාමි''**
  **දුතියම්පි ....., තතියම්පි .....**

- සිවුරු සඳහා පඬු පිසීමට :-

  **''ඕකාස අහං භන්තේ! රජනං පචිතුං ආපුච්ඡාමි''**
  **දුතියම්පි ....., තතියම්පි .....**

- සිවුරු පඬු පෙවීමට :-

  **''ඕකාස අහං භන්තේ! චීවරරජනං ආපුච්ඡාමි''**
  **දුතියම්පි ....., තතියම්පි .....**

- සිවුරු මැසීම සඳහා :-

  **''ඕකාස අහං භන්තේ! චීවරකරණං ආපුච්ඡාමි''**

  **දුතියම්පි ....., තතියම්පි .....**

- පාත්‍ර කළු කිරීම සඳහා :-

  **''ඕකාස අහං භන්තේ! පත්තපචනං ආපුච්ඡාමි''**

  **දුතියම්පි ....., තතියම්පි .....**

- අවේලාවේ ගමට යෑම සඳහා :-

  **''ඕකාස අහං භන්තේ! විකාලේ ගාමප්පවේසනං ආපුච්ඡාමි''**

  **දුතියම්පි ....., තතියම්පි .....**

- ධර්මය දේශනා කිරිම සඳහා :-

  **''ඕකාස අහං භන්තේ! ධම්මදේසනං ආපුච්ඡාමි''**

  **දුතියම්පි ....., තතියම්පි .....**

- දොර විවෘත කිරීම සඳහා :-

  **''ඕකාස අහං භන්තේ! ද්වාරවිවරණං ආපුච්ඡාමි''**

  **දුතියම්පි ....., තතියම්පි .....**

- දොර වැසීම සඳහා :-

  **''ඕකාස අහං භන්තේ! ද්වාරථකනං ආපුච්ඡාමි''**

  **දුතියම්පි ....., තතියම්පි .....**

- පහන දැල්වීම සඳහා :-

  **''ඕකාස අහං භන්තේ! දීපුජ්ජලනං ආපුච්ඡාමි''**

  **දුතියම්පි ....., තතියම්පි .....**

- පහන නිවීම සඳහා :-

  **''ඕකාස අහං භන්තේ! දීපනිජ්ඣාපනං ආපුච්ඡාමි''**

  **දුතියම්පි ....., තතියම්පි .....**

# උපග්‍රන්ථය - II

## (අ). ''තිරිසන් ගත ස්ත්‍රියක් සමග හෝ'' යන්නෙන් සමතිස් මාර්ගයන්ම අදාළ වේ.

මනුෂ්‍ය, අමනුෂ්‍ය, තිරිසන්ගත ස්ත්‍රීන් තිදෙනාගේ මුඛ මාර්ගය, වර්චස් (ගුද) මාර්ගය, පස්සාව (මූත්‍රා) මාර්ගය යන මාර්ග තුන බැගින් 09ක් ද, එම උභතෝ ඛ්‍යඤ්ජනක තිදෙනාගේ මුඛ මාර්ගය, වර්චස් මාර්ගය, පස්සාව මාර්ගය යන මාර්ග තුන බැගින් 09ක් ද, එම පුරුෂ තිදෙනාගේ සහ පණ්ඩක තිදෙනාගේ මුඛ මාර්ගය, වර්චස් මාර්ගය යන මාර්ග දෙක බැගින් 12ක් ද යන මේ සමතිස්මාර්ග පාරාජිකාවට ක්ෂේත්‍ර වේ.

| | ස්ත්‍රී | උභතෝ ඛ්‍යඤ්ජනක | පුරුෂ | පණ්ඩක | එකතුව |
|---|---|---|---|---|---|
| මනුෂ්‍ය | 3 | 3 | 2 | 2 | 10 |
| අමනුෂ්‍ය | 3 | 3 | 2 | 2 | 10 |
| තිරිසන්ගත | 3 | 3 | 2 | 2 | 10 |
| එකතුව | 9 | 9 | 6 | 6 | 30 |

## (ආ). දුහුල් වචන කීම

වර්චස් මාර්ගය, පස්සාව මාර්ගය යන මාර්ග දෙක පිළිබඳව ගුණ අගුණ කීමෙන් හෝ මෙවුන්දම් යැදීම් ආදියෙන් හෝ සිඛරණියක් (බැහැරට නික්මුනු වැදෑමහ ඇත්තී) වෙහි, සම්භින්නාවක් (මුසු වූ මළ-මූත්‍ර මාර්ග ඇත්තී) වෙහි, උභතෝඛ්‍යඤ්ජනාවක් (ස්ත්‍රී-පුරුෂ ලිංග දෙකම ඇත්තී) වෙහි යන තුන් වචන අතරින් එක්තරා එකකින් ආක්‍රෝෂ කිරීම් වශයෙන් හෝ මාගමකට කියන භික්ෂුවට සඟවෙසෙස් වේ.

## (ඇ). උවදුරු රහිත බව

වේ, කුහුඹු ආදීන්ගේ නිබඳ වසන ස්ථාන වීම වශයෙන් දහතුන් වැදෑරුම් වූ උවදුරු හෝ වගාබිම්, ඇත්හල් ආදිය ඇසුරු කිරීම් වශයෙන් සොළොස් වැදෑරුම් වූ උවදුරු රහිත බව.

## (ඇ). උපචාර සහිත බව

ගොනුන් දෙදෙනෙකු හෝ සිවුදෙනෙකු යොදන ලද කරත්තයකින් එක් රෝදයක් වහලයෙන් දිය වැටෙන ස්ථානයෙහි ද, අනෙක පිටත ද තබා කුටිය වටේ යාමට හැකි පරිදි උපචාර සහිත බව.

## (ඉ). අටලොස් භේදකර වස්තු

| | |
|---|---|
| ධර්මය අධර්මය වශයෙන් දැක්වීම, අධර්මය ධර්මය වශයෙන් දැක්වීම ලෙස දුකය යි | 2 |
| මෙසේම පහත ක්ෂේත්‍ර අට සම්බන්ධව දුක අටයි | 16 |
| | 18 |

විනය-අවිනය, තථාගත භාසිතය-අභාසිතය, තථාගතයන් වහන්සේ පුරුදු කරන ලද්ද-පුරුදු නොකරන ලද්ද, තථාගත පැණවීම-නොපැණවීම, ආපත්ති-අනාපත්ති, ලහුකාපත්ති-ගරුකාපත්ති, දුට්ඨුල්ලාපත්ති-අදුට්ඨුල්ලාපත්ති, සාවසේසාපත්ති-අනාවසේසාපත්ති.

## (ඊ). බීජගාම

පැළවෙන ස්වභාවයෙන් යුතු මූලබීජ, ඛන්ධබීජ, ඵලුබීජ, අග්ගබීජ, බීජබීජ යන මේවා බීජගාම නම් වේ.

- අල හෝ මුල් නිසා පැළවෙන කහ, ඉඟුරු ආදිය **මූලබීජ** නම් වේ.
- අතුරිකිලි පැළවෙන නුග, ඇහැටු, බතල ආදිය **ඛන්ධබීජ** නම් වේ.
- උණ, බට, උක් වැනි පුරුක් පැළවෙන දෑ **ඵලුබීජ** නම් වේ.
- අගින් හෙවත් කරටියෙන් පැළවෙන හිරිවේරිය වැනි දෑ **අග්ගබීජ** නම් වේ.
- බීජයෙන්ම පැළවෙන වී, මුං, මෑ ආදිය **බීජබීජ** නම් වේ.

### (I). බීජගාම කැප කරවා ගැනීම

උපසපන් භික්ෂුවක් එම බීජගාම වළඳන්නේ නම් හෝ ඒවාට හානි වන ලෙස පරිභෝග කරන්නේ නම් අනුපසම්පන්නයකු ලවා කැප කරවාගෙන පරිභෝග කළ යුතු ය. එහිලා භික්ෂුව විසින් කැප කරවා ගත යුතු බීජගාමය අනුපසම්පන්නයාට දී **'කප්පියං කරෝහි'** යැයි කිව යුතු අතර අනුපසම්පන්නයා විසින් පංචවිධ කැප කිරීම් අතුරින් (අබීජය හා නිබ්බට්ට බීජය හැර) එක්තරා ක්‍රමයකින් කැපකිරීමේදී **'කප්පියං'** කියා හෝ **'කප්පියං භන්තේ'** කියා කැප කළ යුතු ය.

## (II). පංචවිධ කැපකිරීම්

- බීජගාම කැපකරවාගත හැකි ආකාර පහකි.

1. **අග්ගිපරිචිතං** - ගින්නෙන් ස්පර්ශ කිරීම.
2. **සත්ථපරිචිතං** - සැතකින් (ආයුධයකින්) කැපීම හෝ විදීම.
3. **නඛපරිචිතං** - නියෙන් කැපීම හෝ විදීම.
4. **අබීජං** - බීජ නොවූ ඵලය. එනම් බීජ භාවයට නොමේරූ ඵලය.
5. **නිබ්බට්ටබීජං** - බීජ උපුටා දමන ලද ඵලය. එනම් අඹ, කොස් ආදී ඵලවල බීජයෙන් වෙන්කළ කොටස.

මෙහිලා ගින්නෙන් කැපකිරීමේදී කැප කළයුතු බීජගාමය අනුපසම්පන්නයකු ලවා ගිනි අඟුරකින් හෝ ගිනියම් කළ ලෝහ කැබැල්ලකින් ස්පර්ෂ කිරීමෙන් කැපකළ හැකි වේ. සැතකින් හෝ නියෙන් නම් (තියුණු නියක් විය යුතු ය) බීජගාමය යම්තැනක් කැපීමෙන් හෝ විදීමෙන් කැපකළ හැකි වේ. කැපකළ යුතු බීජගාම සමූහය එකට ගැවෙන පරිදි එක්කර එක් කොටසක් කැපකිරීමෙන් සියල්ල කැපකළා වෙහි. මෙසේ කැපකළ බීජගාමයක ඉන්පසු මුල්, කොළ, අංකුර ආදිය හටගතහොත් නැවත කැප කරවා ගත යුතු වේ.

## (උ). ආවසථ පිඬුව

පස් බොජුන් අතරින් එක්තරා බොජුනක් අසවලාට කියා හෝ මෙපමණ කියා හෝ පිරිසිඳීමක් නැතිව, පැමිණෙන ඕනෑම අයකුට කැමති තරම් අනුභව කිරීමට හැකි පරිදි දන්සැල් වශයෙන් තබනු ලැබේ නම් ඉන් වළඳනා බොජුන් ආවසථ පිඬු නම් වේ.

## (ඌ). ගණ බොජුන

අකැප නිමන්ත්‍රණයෙන් (පස් බොජුනෙහි නම කියා නිමන්ත්‍රණය) හෝ අකැප විඤ්ඤත්තියෙන් (නොනෑ නොපැවරූ අයගෙන්) හෝ උපදවනු ලබන භෝජනය භික්ෂූන් සිව් නමක් හෝ ඊට වැඩි පිරිසක් එක්ව පිළිගනී නම් එය ගණභෝජන නම් වේ. මෙසේ ලැබෙන භෝජනය උපරිම භික්ෂූන් තිදෙනෙක් එක්ව පිළිගැනීමෙන් ගණභෝජනය නොවේ.

## (එ). පරම්පර භෝජනය

යම් භික්ෂුවකට එක් දිනක් සඳහා දාන නිමන්ත්‍රණ කිහිපයක් ලැබී ඇති විට එසේ නිමන්ත්‍රණය කරන ලද පිළිවෙළින් වැළඳීම කළ යුතු වේ. පළමුව නිමන්ත්‍රණය ලද බොජුන වෙනකකුට නොපවරා පසුව ලද නිමන්ත්‍රණ බොජුනෙන් පළමුව වැළඳීමෙන් පරම්පර භෝජන පචිති ඇවත වේ.

## (ඒ). පවාරණය

යම් භික්ෂුවක් පස් බොජුන් අතරින් එකක් වළඳමින් සිටින අතර පස් බොජුන් අතරින් යමක් අත්පස සිට පිළිගන්වයි නම්, කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂේප කළහොත් ඒ භික්ෂුව, පවාරණය වූ භික්ෂුවක් නම් වේ.

### (I). මෙසේ පවාරණය වීම සඳහා සම්පූර්ණ වියයුතු අංග පහකි.

1. **අසනං පඤ්ඤායති**
   අඩාල කළ බොජුන් ඇති බව. එනම් වළඳමින් සිටින, පාත්‍රය-මුඛය-අත්වල යන යම් කිසි තැනක භෝජන සහිත භික්ෂුවක් බව.
2. **භෝජනං පඤ්ඤායති**
   පංච භෝජන අතුරින් එකක් හෝ ඊට වැඩියක් පාත්‍රාදියෙහි පෙනීමයි.
3. **හත්ථපාසේ ඨිතෝ**
   පවාරණයට පොහොනා ඕදන ආදී යම් භෝජනයක් රැගෙන වළඳමින් සිටින භික්ෂුවගේ අත්පසට එළඹ සිටීමයි.
4. **අභිහරති**
   වළඳමින් සිටින භික්ෂුවට ඒ ඕදනාදී යමක් පිළිගැන්වීම පිණිස එළවීමයි.
5. **පටික්ඛේපෝ පඤ්ඤායති**
   කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂේප කිරීම යි.

භෝජන පවාරණය වූ භික්ෂුව එම ඉරියව්වෙන් මිදී වෙනත් ඉරියව්වකදී වළඳනු කැමති නම් වැළඳීමට බලාපොරොත්තු වන සියලු ආහාර පාත්‍රයට ගෙන එදින පවාරණය නොවූ හෝ පවාරණය වී නොනැගිටි වෙනත් උපසපන් භික්ෂුවක් වෙත ගොස් එම භික්ෂුවගේ අත්පසට ඇතුළු වී ''**අතිරිත්තං කරෝථ භන්තේ**'' යැයි කියා පාත්‍රය එම භික්ෂුව වෙතට යොමු කළ යුතු ය. ඉන්පසු පාත්‍රය ලබාගත් භික්ෂුව එම ආහාරයෙන් ස්වල්පයක් වළඳා (අවම වශයෙන් බත්හුළක්, හෝ එවැනි පඤ්ච භෝජනයට

අයත් වූවක්) **''අලමේතං සබ්බං''** යැයි කියා නැවත දිය යුතු අතර එය වැළඳීමෙන් පවාරිත භික්ෂුවට ඇවැත් නැති.

## (II). පංච භෝජන

1. **ඕදන**
   හැල්, වී, යව, ගෝධුම, කංගු, වරක, කුද්‍රූසක යන සප්ත ධාන්‍යයන් හා ඊට අනුලොම් ධාන්‍යයන්ගේ සහලින් පිසූ බත. මේවායින් පිසූ කැඳවල වුවද ගත්තැන අවකාශය පෙනෙන තරම් උකු නම් භෝජනයට අයත් වේ.
2. **කුම්මාස**
   යව (ඉරිඟු) වලින් පිසූ පිට්ටු, රොටී වැනි ආහාරයක්.
3. **සත්තු**
   සප්ත ධාන්‍යයන් බැද පිටිකර ඉන් සාදා ගන්නා ලද අග්ගලා වැනි ආහාරයකි.
4. **මච්ඡ** - දියමස්
5. **මංස** - ගොඩමස්

## (ඔ). සුරා සහ මේරය

පිටි ආදියෙන් කරන ලද (පෙරන ලද) මද්‍යය සුරා නම් වේ. මෙය පිට්ඨ සුරා, පූව සුරා, ඕදනීය සුරා, කිණ්ණපක්ඛිත්තා, සම්භාර සංයුත්තා යැයි පස් වැදෑරුම් වේ. මල් ආදිය පල් කිරීමෙන් කරන ලද ආසවය මේරය නම් වේ. පුප්ඵාසව, ඵලාසව, මධ්වාසව, ගුලාසව, සම්භාර සංයුත්ත යැයි පස් වැදෑරුම් වේ.

## (ඕ). දසවිධ අන්තරාවන් නම්

රජුගෙන් වන උවදුරෙක්, සොරුන්ගෙන් වන උවදුරෙක්, ගින්නෙන් වන උවදුරෙක්, දියෙන් වන උවදුරෙක්, මිනිසුන්ගෙන් වන උවදුරෙක්, අමනුෂ්‍යයන්ගෙන් වන උවදුරෙක්, චණ්ඩමෘගයන්ගෙන් වන උවදුරෙක්, සර්පයන්ගෙන් වන උවදුරෙක්, ජීවිතයට විය හැකි උවදුරෙක් හෝ බ්‍රහ්මචර්යාවට විය හැකි උවදුරෙක් ය.

# සිවුපසය ප්‍රත්‍යවෙක්ෂා කිරීම

## ● චීවර ප්‍රත්‍යවෙක්ෂාව :-

**''පටිසඞ්ඛායෝනිසෝ චීවරං පටිසේවාමි. යාවදේව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදේව හිරිකෝපීන පටිච්ඡාදනත්ථං.''**

මම, නුවණින් විමසා සිවුරු පරිහරණය කරමි. සීත උෂ්ණ දුරු කර ගැනීම පිණිස ය. මැසි, මදුරු, වාතය, අව්ව, සර්පාදීන්ගෙන් වන දුක් සහගත ස්පර්ශයෝ දුරු කර ගැනීම පිණිස ය. ශරීරයේ විවෘත වූ ලැජ්ජා ව උපදවන තැන් වසා ගැනීම පිණිස ය.

## ● ආහාර ප්‍රත්‍යවෙක්ෂාව :-

**''පටිසඞ්ඛායෝනිසෝ පිණ්ඩපාතං පටිසේවාමි. නේව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය, යාවදේව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණං ච වේදනං පටිහංඛාමි, නවං ච වේදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මේ භවිස්සති අනවජ්ජතාච ඵාසුවිහාරෝචාති.''**

මම, නුවණින් විමසා පිණ්ඩපාතය පරිභෝග කරමි. කෙළි ක්‍රීඩා කරන ගම් දරුවන් මෙන් ජවය පිණිස නො වේ. පුරුෂ මදය පිණිස නො වේ. අන්තඃපුර ස්ත්‍රීන් මෙන් ශරීර අලංකාරය පිණිස නො වේ. නැට්ටුවන් මෙන් ශරීරය නොයෙක් ආකාරයට හැඩගස්වා ගැනීම පිණිස නො වේ. මේ සතර මහා ධාතුන්ගෙන් හටගත් කයෙහි පැවැත්ම, යැපීම පිණිස ය. බඩගිනි වේදනා දුරු කර ගැනීම පිණිස ය. සාසන බ්‍රහ්මචරියාවට අනුග්‍රහ පිණිස ය. පෙර තිබූ වේදනා දුරු කර ගැනීමත්, අලුත් වේදනා නූපදවීමත් පිණිස ය. මාගේ ජීවිත යාත්‍රා ව පිණිස ද, නිවැරදි පරිභෝගයත් පහසු විහරණයත් පිණිස ම ය.

## ● සේනාසන ප්‍රත්‍යවෙක්ෂාව :-

**''පටිසඞ්ඛායෝනිසෝ සේනාසනං පටිසේවාමි. යාවදේව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදේව උතුපරිස්සයවිනෝදනං පටිසල්ලානාරාමත්ථං.''**

මම, නුවණින් විමසා සෙනසුන් පරිභෝග කරමි. සීත, උෂ්ණ දුරු කර ගැනීම පිණිස ය. මැසි, මදුරු, අව්, සුළං, සර්පාදීන්ගෙන් වන දුක් සහගත ස්පර්ශයන් දුරු කිරීම පිණිස ය. නොයෙක් ඍතු විපර්යාසයන්ගෙන් වන පීඩා දුරු කර ගැනීම පිණිස ය. එකලා ව සුව සේ විසීම පිණිස ය.

● ගිලන්පස බෙහෙත් ප්‍රත්‍යවෙක්ෂාව :-

''පටිසඞ්ඛායෝනිසෝ ගිලානපච්චයභේසජ්ජපරික්ඛාරං පටිසේවාමි. යාවදේව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වේදනානං පටිඝාතාය අබ්‍යාපජ්ජපරමතායාති.''

මම, නුවණින් විමසා ගිලන්පස බෙහෙත් පිරිකර පරිභෝග කරමි. උපනුපන් ආබාධයන් දුරු කිරීම පිණිස ය. වේදනාවන් දුරු කිරීම පිණිස ය.

❀ ❀ ❀

# පැවිද්දකු විසින් නිතර නිතර සිහිපත් කළ යුතු දසධම්ම සූත්‍රයේ එන කරුණු දසය

● ''වේවණ්ණියම්හි අජ්ඣුපගතෝති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''

ගිහිගෙදරින් නික්ම පැවිදි බිමට පත් වූයෙමි'යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

● ''පරපටිබද්ධා මේ ජීවිකාති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''

අන් අයගෙන් ලැබෙන ප්‍රත්‍ය පහසුකම්වලින් යැපෙන බැවින් මාගේ ජීවිතය අනුන්ගෙන් බැඳුණු එකක් යැයි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

● ''අඤ්ඤෝ මේ ආකප්පෝ කරණීයෝති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''

ගිහියන්ට වඩා හාත්පසින් ම වෙනස් වූ ආකල්ප ඇත්තෙක්මි'යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

● ''කච්චි නු බෝ මේ අත්තා සීලතෝ න උපවදතීති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''

කිම? සීලය අපිරිසිදු යැයි තමා තමාට උපවාද කෙරේද යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

● ''කච්චි නු බෝ මං අනුවිච්චවිඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතෝ න උපවදන්තීති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''

කිම? සීලය අපිරිසිදු යැයි සීලය හේතු කොටගෙන නුවණින් යුත් සබ්‍රහ්මචාරීන් වහන්සේලා මට උපවාද නො කෙරෙත්ද යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

- **''සබ්බේහි මේ පියේහි මනාපේහි නානා භාවෝ විනා භාවෝ'ති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''**

ප්‍රිය වූ, මනවඩන්නා වූ සියලු දේවලින් වෙන් වීමට සිදුවන බව, විනාශ වන බව පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

- **''කම්මස්සකෝම්හි කම්මදායාදො, කම්මයෝනි කම්මබන්ධු කම්මපටිසරණො, යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා, තස්ස දායාදො භවිස්සාමීති, පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''**

කර්මය තමාට අයත් බව, කර්මය මාගේ දායාදයක් බව, කර්මය මාගේ ඉපදීමේ හේතු ව බව, කර්මය මාගේ නෑයා බව, කර්මය පිළිසරණ බව යම් කිසි යහපත් වූ හෝ අයහපත් වූ හෝ කර්මයක් සිදු කෙරේ නම් එය දායාද කොට ඇති බව පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

- **''කථම්භූතස්ස මේ රත්තිං දිවා වීතිපතන්තීති, පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''**

කෙ බඳු වූ ආකාරයකින් සිටින්නා වූ මාගේ රෑ දවල් ඉක්මෙත් ද යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

- **''කච්චි නු බෝහං සුඤ්ඤාගාරේ අභිරමාමීති, පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''**

කිම? මම ශූන්‍යාගාරයෙහි සිත් අලවා වාසය කෙරෙත්ද යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

- **''අත්ථි නු බෝ මේ උත්තරිමනුස්සධම්මා, අලමරියඤාණදස්සන විසේසෝ අධිගතො. සෝහං පච්ඡිමේ කාලේ, සබ්‍රහ්මචාරීහි පුට්ඨෝ න මඞ්කු භවිස්සාමීති, පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''**

කිම? විශේෂයෙන් ලබන ලද මාර්ගඵල සංඛ්‍යාත උතුරුමිනිස්දම් මා කෙරෙහි ඇත්ද යි, මරණ මඤ්චකයෙහි සිටින විට සබ්‍රහ්මචාරීන් වහන්සේලා විසින් විමසන කල්හි මුහුණ යටට හරවා දුර්මුඛ නො වන්නෙමි යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු ය.

# තෙරුවන් කමා කිරීම

කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ භන්තේ - භූරිපඤ්ඤතථාගත.

කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ ධම්ම - සන්දිට්ඨික අකාලික.

කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ සඞ්ඝ - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තර.

ඉමාය ධම්මානුධම්මපටිපත්තියා බුද්ධං පූජේමි,
ඉමාය ධම්මානුධම්මපටිපත්තියා ධම්මං පූජේමි,
ඉමාය ධම්මානුධම්මපටිපත්තියා සඞ්ඝං පූජේමි,

අද්ධාය ඉමාය පටිපත්තියා ජාතිජරාමරණම්හා පරිමුඤ්චිස්සාමි.

සාධු ! සාධු !! සාධු !!!

❀ ❀ ❀

''සුඛා සඞ්ඝස්ස සාමග්ගි - සමග්ගානං චනුග්ගහෝ,
සමග්ගරතෝ ධම්මට්ඨෝ - යෝගක්ඛේමා න ධංසති,
සඞ්ඝං සමග්ගං කත්වාන - කප්පං සග්ගම්හි මෝදතී'ති.''

(සංඝයා ගේ සමගිය සැප ගෙනදෙයි. සමගි වූ සංඝයාට අනුබල දීම ද සැප ගෙනදෙයි. සමගි වූවනට ඇලුණු, දහමෙහි පිහිටි තැනැත්තෙක් යෝගක්ෂේමයෙන් (නිවන් ලැබීමෙන්) නො වැළකෙයි. සංඝයා සමගි කොට හේ කල්පයක් ස්වර්ගයෙහි සතුටු වේ.)

*චුල්ලවග්ග පාළි II - සඞ්ඝභේදක්ඛන්ධකය. (බු.ජ.මු.), පි.324*

*- චිරං තිට්ඨතු සම්මාසම්බුද්ධ සාසනං -*

# ආශ්‍රිත ග්‍රන්ථ


1. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා
2. ත්‍රිපිටක ග්‍රන්ථ මාලා (හේවාවිතාරණ මුද්‍රණය)
3. මරම්ම (බුරුම) ඡට්ඨ සංගායනා පොත්
4. සමන්තපාසාදිකා අටුවා ග්‍රන්ථ (හේවාවිතාරණ මුද්‍රණය)
5. කඞ්ඛාවිතරණී මාතිකා අටුවා (හේවාවිතාරණ මුද්‍රණය)
6. විමතිවිනෝදනී ටීකා
7. කඞ්ඛාවිතරණී අභිනව ටීකා
8. ආණා දේසනා ( ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව)
9. විනය මූල ධර්ම (ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ විනයාචාර්ය මාවතගම ගුණානන්ද මහා ස්ථවිර)
10. උපසම්පදා ශීලය (රේරුකානේ චන්දවිමල මහානායක ස්ථවිර)
11. විනය කර්ම පොත (රේරුකානේ චන්දවිමල මහානායක ස්ථවිර)
12. උභය ප්‍රාතිමෝක්ෂය (රේරුකානේ චන්දවිමල මහානායක ස්ථවිර)